DEVELOPMENT LOTTERY
Enriching Your Life

# ජන හද
# ජය ගැන්ම
# 2016

වාර්ෂික වාර්තාව

සංවර්ධන ලොතරැයි මණ්ඩලය

# කවරයේ කථාව

''අපගේ ගමන්මගේ ආරම්භයේ සිට ශ්‍රී ලාංකීය ජනතාව සමග වඩාත් සමීපව සිටීමට අපට හැකි විය. අපගේ ව්‍යාපාරික මෙහෙයුම් ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත ගොඩනැගීමටත්, අධ්‍යාපන අවස්ථා වර්ධනය කිරීම සඳහාත් මූලික විය. 2016 වසර තුළ ශ්‍රී ලාංකීය සමාජයට අප විසින් ඇති කළ ධනාත්මක බලපෑම පිළිබඳව නිරවුල් අදහසක් ඉදිරිපත් කරමින් අපගේ වර්ධනය, අපගේ අනාගත උපායමාර්ගයන් සහ දිවයින පුරා විසිර සිටින ශ්‍රී ලාංකිකයින් සවිබල ගැන්වීම සඳහා අප විසින් ආරම්භ කර ඇති ක්‍රියාකාරකම් මෙලෙස ඉදිරිපත් කරන්නෙමු''

# අන්තර්ගතය


| | |
|---|---|
| ආයතනික තොරතුරු | 4 |
| ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු, වටිනාකම් | 5 |
| සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ඉතිහාසය | 6 |
| පියසටහන් | 8 |
| මූල්‍ය සාරාංශය | 10 |
| සභාපතිතුමන්ගේ පණිවිඩය | 12 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 14 |
| අධ්‍යක්ෂ මණ්ඩල විමසුම | 15 |
| කළමනාකරණ කණ්ඩායම | 16 |
| මෙහෙයුම් සමාලෝචනය | 18 |
| තිරසාර වාර්තාව | 27 |
| ආයතනික යහපාලනය | 32 |
| අවදානම් කළමනාකරණ වාර්තාව | 34 |
| විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව | 36 |

**මූල්‍ය වාර්තාව**

| | |
|---|---|
| ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව | 38 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශ වාර්තාව | 74 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශ වාර්තාව | 75 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 76 |
| ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 77 |
| මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන් | 78 |
| දස වසරක සාරාංශය | 91 |

# ආයතනික තොරතුරු

### මණ්ඩලයේ නම
සංවර්ධන ලොතරැයි මණ්ඩලය

### නෛතික තත්වය
මෙම මණ්ඩලය 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පාර්ලිමේන්තු පනත මගින් සංස්ථාපනය කර ඇත.

### ආරම්භක දිනය
1983 ජනවාරි 19වන දින

### ලියාපදිංචි කාර්යාලය
නොම්බර 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 02.

### දුරකථන
011 2 333 546-8, 011 4 824 824

### ෆැක්ස්
011 2 333 545

### විද්‍යුත් තැපෑල
info@dlb.lk

### වෙබ් ලිපිනය
www.dlb.lk

### TIN
409089844

### අධ්‍යක්ෂ මණ්ඩලය (2016)
- රොමේෂ් ජයවර්ධන මහතා - සභාපති/ප්‍රධාන විධායක නිලධාරී
- ආර්.අයි. විමලසේන මිය නියෝජ්‍ය සභාපති
- ඩී.එන්. නානායක්කාර මහතා - අධ්‍යක්ෂ
- වික්‍රම වීරසූරිය මහතා - අධ්‍යක්ෂ
- එම්.එස්.ඩී. රණසිරි මහතා - අධ්‍යක්ෂ

### වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය
- එස්.ඒ.පී. සූරියප්පෙරුම මහතා - සභාපති/ප්‍රධාන විධායක නිලධාරී
- එච්.ආර්. විමලසිරි මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
- ඩී.එන්. නානායක්කාර මහතා - අධ්‍යක්ෂ
- එච්.ජී. සුමනසිංහ මහතා - අධ්‍යක්ෂ
- ඩී.සී. දිසානායක මහතා - අධ්‍යක්ෂ

### විගණකවරු
විගණකාධිපති

### බැංකුකරු
මහජන බැංකුව, ලංකා බැංකුව, සම්පත් බැංකුව

# අපගේ දර්ශනය

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වාසනාව උදාකිරීමේ රාජ්‍ය ආයතනයක් බවට පත් වීම.

# අපගේ මෙහෙවර ප්‍රකාශය

''නවීන තාක්ෂණය යොදා ගනිමින් නව්‍යතාවයෙන් යුතු ආකර්ෂනීය ලොතරැයි පත් ඉදිරිපත් කරමින් විශ්වාසය තහවුරු කරන අතරතුර සෑම කල්හිම පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම.''

# අපගේ ඉලක්ක

වෙළෙඳපොළ කොටස වර්ධනය කරගැනීම, ජනාධිපති අරමුදල සඳහා වන දායකත්වය උපරිම තත්ත්වයට පත් කිරීම, නවීන තාක්ෂණය අත්පත් කරගැනීම සහ භාවිතය, පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම.

# අපගේ මූලික වටිනාකම්

## සුපිළිපන්බව

අප විසින් ඉදිරිපත් කරනු ලබන ලොතරැයි සහ අප ව්‍යාපාරික කටයුතු නිරත වන ආකාරය සාධාරණ, අවංක සහ විශ්වසනීය වේ.

## සුබවාදී ආකල්පය

ලොතරැයි ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී ඔවුන් හට මුහුණපෑමට සිදුවන සෑම අභියෝගයකටම සුබවාදී එළඹුමක් සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයින් තුළ පවතී.

## ප්‍රතිඵලදායක බව

ස්වකීය කාර්යභාරයන් පිළිබඳව සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයින් තුළ මනා විශ්වාසයක් පවතින අතර ඔවුහු දෙන ලද ඉලක්ක කාර්යක්ෂමව අත්පත් කරගැනීම සඳහා නිසි අවධානයකින් යුතුව කටයුතු කරති.

## නව්‍යතාව

සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයින් ව්‍යාපාරික වර්ධනය සඳහා වන අදහස් සොයා යමින් තරඟකාරී වෙළෙඳපොළ වෙනස්වීම් හමුවේ කඩිනමින් ප්‍රතිචාර දක්වති.

## කණ්ඩායම් හැඟීම

සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයින් විවෘතභාවය, එකිනෙකා කෙරෙහි ගෞරවය සහ පුද්ගල සංවර්ධනය ඔස්සේ ආයතනික ඉලක්ක සපුරාගැනීමෙහිලා එකාවන්ව කටයුතු කරති.

## විශිෂ්ටත්වය කෙරෙහි කැපවීම

සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයින් අඛණ්ඩවම සේවා තත්ත්වයන් උපරිම මට්ටම් කරා රැගෙන ඒම සඳහා කැපවීමෙන් ක්‍රියා කරති.

# ඉතිහාසය දෙස හැරී බැලීමක්

සංවර්ධන ලොතරැයි මණ්ඩලය (මීට ඉහතදී සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය) අධ්‍යාපනය සහ සෞඛ්‍ය ආධාර සැපයීම සඳහා ජනාධිපති අරමුදල හා මහපොළ උසස් අධ්‍යාපන භාර අරමුදල සමග සහයෝගීව කටයුතු කිරීම සඳහා ආචාර්ය වික්‍රම වීරසූරිය මහතාගේ දූරදර්ශී මග පෙන්වීම මත ස්ථාපනය කරනු ලැබූ ආයතනයක් වූ අතර සමාජ ආර්ථික ව්‍යාපෘති සඳහා අරමුදල්



රැස්කිරීමේ මාර්ගයක් බවටද පත්විය. ආරම්භයේදී ක්ෂණික ලොතරැයි වැඩසටහන් දියත් කිරීම සඳහා විවිධ පාර්ශවයන්ගෙන් අරමුදල් ඉල්ලා සිටියත් මේ සඳහා සුභවාදී ප්‍රතිචාර ලබා දීමට ඉදිරිපත් වූයේ එවකට ජනාධිපතිවරයා වූ ජේ.ආර්. ජයවර්ධන මහතා සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා වූ ලලිත් ඇතුලත්මුදලි මහතා පමණි.



ජේ.ආර්. ජයවර්ධන මහතා ජනාධිපති අරමුදලින් රුපියල් මිලියන 15ක මුදලක් මේ සඳහා ලබා දුන් අතර ඇතුලත්මුදලි මහතා ද ඒ හා සමාන මුදලක් ඔහු විසින් ඇරඹූ මහපොළ අරමුදලෙන් ලබා දෙන ලදී.

නව දැක්මකින් යුතුව 1983 වසරේදී ඇරඹුනු මෙම සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය මගින් අලෙවි කළ පළමු ලොතරැයිය සංවර්ධන ලෙස හැඳින්විය. පළමු වසර තුළදීම සිදු කළ ක්‍රියාත්මක කිරීම් හේතුවෙන් අති සාර්ථකත්වයට පත්වීමට සංවර්ධන ලොතරැයියට හැකි වූ අතර සැලකිය යුතු ලාභයක් ලබා ගැනීමට සමත් විය. මෙම ලාභයෙන් සැලකිය යුතු කොටසක් මෙහි ප්‍රධාන කොටස්කරුවන් වූ ජනාධිපති අරමුදල සහ මහපොළ උසස් අධ්‍යාපන භාර අරමුදල විසින් ලබා ගන්නා ලදී. මේ වන විට ජනාධිපති අරමුදල සඳහා ලබා දෙන අරමුදල් වලින් 50%ක ප්‍රතිශතයක් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල් භාරය වෙත යොමු කෙරේ.



1993 වසරේදී සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය සංවර්ධන ලොතරැයි භාරය ලෙස වෙනස් වු අතර 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත පාර්ලිමේන්තුවේදී සම්මත වීමෙන් අනතුරුව 1997 අගෝස්තු 12වන දින සංවර්ධන ලොතරැයි මණ්ඩලය බවට පත් විය. සංවර්ධන ලොතරැයිය මගින් හඳුන්වාදුන් සූරන ලොතරැයිය මෙම කාලසීමාවේදී වෙළෙඳපොළට පැමිණි අතර රුපියල් 10ක් වූ මෙම ලොතරැයිය දිවයින පුරාම අලෙවි කරන ලදී. මීට අමතරව සුපිරි වාසනාවන්තයින් දෙදෙනෙක් පැය 24ක් තුළ බිහිකිරීම හේතුවෙන් මෙය වේගයෙන් ජනතාව අතර ප්‍රචලිත විය.

සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය ලෙසින් ක්‍රියාත්මක වූ 1987 වසරේදී පළමු වරට රූපවාහිනී ලොතරැයි දිනුම් ඇදීම හඳුන්වාදීම සිදු වූ අතර මෙය 'ශනිදා වාසනාව' නම් වූ අතර සෑම සෙනසුරාදාවකම දිනුම් ඇදීම සිදු විය. පසුකාලීනව මෙය බදාදාටද සිදු කරන ලදී. ක්ෂණික ලොතරැයි මගින් දිනුම් නොලද පුද්ගලයින් සඳහා ක්‍රියාත්මක කළ වාසනා චක්‍රය 1998 වසරේ ජනවාරි 25 වන දින පළමු වරට ඉරිදා

දින විකාශනයට පත් කරන ලදී. මේ සඳහා පැවති ඉහළ ජනතා ප්‍රසාදය හේතුවෙන් සංවර්ධන වාසනාව නමින් දිනුම් ඇදීම් ද්විත්වයක් අඟහරුවාදා සහ සිකුරාදා දිනයන්හි දිනුම් අදින ලදී. සංවර්ධන වාසනා දිනුම් ඇදීම තුළ අංකවලට අමතරව ලග්න සලකුණු ඔස්සේද වාසනාවන්තයින් බිහිකරන්නට සමත් විය.

2004 ජනවාරි 26 වැනිදා ආරම්භ කළ ජයෝදා ලොතරැයිය සඳුදා සහ බ්‍රහස්පතින්දා දිනුම් ඇදීම සිදු කළ අතර සාමාන්‍ය ජයග්‍රාහකයින්ට අමතරව සුපිරි ජයමල්ල දිනා ගන්නා වාසනාවන්තයෙක්ද බිහි කළේය. මෙම සුපිරි ජයමල්ල රුපියල් මිලියන 10කින් ඇරඹින. ශ්‍රී ලාංකීය ලොතරැයි ඉතිහාසය පළමු වරට ජයෝදා ලොතරැයිය මගින් ලබා දෙන සාමාන්‍ය ජය මල්ල වූ රුපියල් මිලියනයක මුදල හෝ රුපියල් මිලියනයක් වටිනා නිවස යන ත්‍යාගයන් දෙකෙන් එකක් තෝරා ගැනීමට ජයග්‍රාහකයින්ට අවස්ථාව සැලසිනි.

2009 අප්‍රේල් 10 වන දින ආරම්භ කළ ජනජය ලොතරැයිය බ්‍රහස්පතින්දා සහ ඉරිදා



දිනුම් ඇදීම සිදු කළ අතර සුපිරි ජයග්‍රාහකයා අංක 64ක් සහිත යන්ත්‍රය මගින් ලබා දෙන අංක 4 ගැලපීම මගින් සොයා ගන්නා අතර අංක 12ක් සහිත යන්ත්‍රය මගින් තෝරා දෙන අංකය මගින් සුපිරි අංකය දිනුම් අදිනු ලබයි. මෙහි සුපිරි ත්‍යාගය රුපියල් මිලියන 25කින් ඇරඹෙන අතර 2012 වසරේ ජූලි 11වන දින හඳුන්වාදෙනු ලැබූ සුපර් බෝල් ලොතරැයිය සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ තවත් ඓතිහාසික සලකුණක් සනිටුහන් කරන ලද අවස්ථාවක් විය. මෙම ලොතරැයිය මෙතෙක් ලොතරැයි ඉතිහාසයේදී ලබාදුන් ඉහළම ත්‍යාගය වූ රුපියල් මිලියන 30ක ආරම්භක ජය මල්ලකින් ඇරඹිනි.

2016 වසරේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය තවත් ලොතරැයි 2ක් හඳුන්වා දුන් අතර සංවර්ධන ලක්ෂපති ලොතරැයිය මිලියන 56ක අලෙවියක් ආරම්භයේදීම හිමිවිය.



ඉන් අනතුරුව 2016 අප්‍රේල් 8වන දින හඳුන්වාදුන් කෝටිපති ශනිදා මුල් වටයේදී ටිකට්පත් මිලියන 44ක් අලෙවි කිරීමට සමත් විය.

සංවර්ධන වාසනා රූපවාහිනී දිනුම් ඇදීම නව පෙනුමකින් 2016 දෙසැම්බර් 12වන දින යළි ඇරඹි අතර තවත් මුදල් ත්‍යාග 3ක් ද ඇතුළත් කරන ලදී.

ජනාධිපති අරමුදලට සහ මහපොළ ශිෂ්‍යත්ව අරමුදලට මුදල් ලබා දීමට අමතරව සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් දුප්පත් ජනතාවගේ දුප්පත් බව මුලිනුපුටා දැමීම සඳහා විවිධ වැඩසටහන් දියත් කළ අතර ආගමික සහ ක්‍රීඩා මෙන්ම කලා කටයුතු නැංවීම සඳහාද තම දායකත්වය දක්වා ඇත.



ගරු මුදල් ඇමතිතුමා විසින් ලොතරැයි ත්‍යාග ප්‍රදානෝත්සවයට සහභාගී වෙමින්

# පියසටහන්

**1987**

පළමු රූපවාහිනී දිනුම් ඇදීම 'ශනිදා වාසනාව' හඳුන්වා දෙයි.

**1993**

සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය **සංවර්ධන ලොතරැයි භාරය** බවට පත්වෙයි.

**1997**

1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතට අනුව **සංවර්ධන ලොතරැයි මණ්ඩලය** බවට පත් විය. රුපියල් **බිලියන 2ක පිරිවැටුමක්** වාර්තා කිරීම.

**1998**

දිනුම් නොලද සූරන ටිකට්පත් සඳහා **වාසනා චක්‍රය** රූපවාහිනි දිනුම් ඇදීම හඳුන්වා දෙන අතර සංවර්ධන වාසනාව ලොතරැයිය සමග **වින්ඩෝස් සහ යුරේකා** නමින් **ක්ෂණික ලොතරැයි** ද්විත්වයක්ද හඳුන්වා දෙන ලදි.

**1999**

ලෝක බැංකු අනුග්‍රහය ඇතිව සහශ්‍රයට ගැලපෙන ලෙස ආයතනයේ **පරිගණක පද්ධතිය** යාවත්කාලීන කරන ලදි.

**2004**

ජයෝදා ලොතරැයිය හඳුන්වා දුන් අතර සාමාන්‍ය ජයග්‍රාහකයින්ට රුපියල් මිලියනයක් හෝ නිවසක් ත්‍යාග ලෙස ලබා දුන්හ. රුපියල් බිලියන 3 දක්වා පිරිවැටුම නංවා ගන්නා ලදි.

**2008**

කොළඹ 2 කොල්වින් ආර්. ද සිල්වා මාවතේ පිහිටි ආයතනයටම අයත් ගොඩනැගිල්ලකට පිවිසි අතර පිරිවැටුම බිලියන 5 දක්වා වර්ධනය කර ගන්නා ලදි.

**2010**

සුපිරි ජයමල්ලක් සහිත **ජනජය ලොතරැයිය** හඳුන්වා දෙමින් සුපිරි ජය මල්ලක් වාසනාවන්තයින්ට තිළිණ කලේය.

**2011**

නියත ජය ලොතරැයිය හඳුන්වා දෙන ලදි.

**2012**

ත්‍යාග සහ නිවාස දිනුම් අවස්ථා වැඩිකරමින් **ජයෝදා ලොතරැයිය** යළි දියත් කරන ලදි.

**2013**

හයිවේ ඩ්‍රීම් ලොතරැයිය හඳුන්වාදීම සිදු විය.

**2014**

කෙටි පණිවිඩ හරහා ලොතරැයි අලෙවිය අරඹන ලදි.

**2016**

සංවර්ධන ලක්ෂපති, කෝටිපති ශනිදා සහ සංවර්ධන වාසනා යළි ආරම්භ කෙරිණි.

# මූල්‍ය සාරාංශයන්

## මුළු වත්කම්




## දළ ලාභය




## බදුපෙර ලාභය




## බදු වියදම්




## පිරිවැටුම




## ජනාධිපති අරමුදල සඳහා දායකත්වය



| දෙසැම්බර් 31වන දායින් අවසන් වසර සඳහා | 2016 | 2015 |
|---|---|---|
| **මෙහෙයුම් ප්‍රතිඵල** | | |
| පිරිවැටුම | 14,759,875,240 | 11,874,659,603 |
| දළ ලාභය | 6,236,580,852 | 5,137,214,449 |
| බදු පෙර ලාභය | 2,700,522,768 | 2,389,616,614 |
| බදු වියදම් | 917,136,130 | 662,552,875 |
| ශුද්ධ ලාභය | 1,783,386,637 | 1,727,063,739 |
| ජනාධිපති අරමුදල සඳහා දායකත්වය | 1,836,020,000 | 1,628,053,000 |
| | | |
| **මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය** | | |
| **වත්කම්** | | |
| දේපළ පිරියත උපකරණ | 699,667,579 | 730,360,335 |
| කල්පිරීම තෙක් රඳවාගත් මූල්‍යමය වත්කම් | 673,087,288 | 807,514,816 |
| තොග | 39,733,884 | 32,603,696 |
| වෙළඳ ණයගැතියන් සහ අනෙකුත් ලැබිය යුතු | 65,861,572 | 27,905,721 |
| පෙර ගෙවීම් සහ තැන්පතු | 6,402,121 | 5,631,264 |
| බැංකුවේ සහ අතැති මුදල් | 572,045,926 | 338,946,957 |
| **මුළු වත්කම්** | **2,056,798,369** | **1,942,962,790** |
| | | |
| **වගකීම්** | | |
| ගෙවිය යුතු සේවක ප්‍රතිලාභ | 31,004,453 | 30,303,482 |
| ගෙවිය යුතු නියෝජිත සහ බෙදාහැරීමේ තැන්පතු | 30,696,381 | 28,380,381 |
| ගෙවිය යුතු ණය වවුචර පත් | 101,500,760 | 203,705,730 |
| ගෙවිය යුතු වෙළඳ සහ අනෙකුත් | 576,301,096 | 434,266,902 |
| ජනාධිපති අරමුදල වෙත ගෙවිය යුතු | 52,633,363 | 99,010,739 |
| ගෙවිය යුතු ත්‍යාග | 560,093,693 | 208,869,321 |
| | | |
| **ස්කන්ධය** | | |
| ජනාධිපති අරමුදල | 2,200,000 | 2,200,000 |
| මහපොළ භාර අරමුදල | 2,200,000 | 2,200,000 |
| ත්‍යාග වෙන්කිරීමේ ගිණුම | 805,435,349 | 934,026,234 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **2,056,798,369** | **1,942,962,790** |
| | | |
| **ලාභදායීත්ව අනුපාත** | | |
| ශුද්ධ ලාභ අනුපාතය | 18% | 20% |
| දළ ලාභ අනුපාතය | 42% | 43% |
| | | |
| **ද්‍රවශීලතා අනුපාත** | | |
| වර්තමාන වත්කම් අනුපාතය | 1:2 | 1:2 |
| ක්ෂණික (ද්‍රවශීල) වත්කම් අනුපාතය | 1:2 | 1:2 |

# සභාපතිතුමන්ගේ පණිවිඩය

තවත් සාර්ථක මූල්‍ය වර්ෂයක් අවසනදී එම වසරට අදාළ විගණනය කළ මූල්‍ය වාර්තාව මහත් සතුටෙන් යුතුව ඔබ සියලු දෙනා වෙත ඉදිරිපත් කරමි. 2016 මූල්‍ය වර්ෂය තුළදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමාජයට වැඩදායි ආයතනයක් බවට පත්වෙමින් ආදායම් ඉපැයීම, රැකියා අවස්ථා බිහිකිරීම, ආර්ථිකයට සවියක් වීම, ප්‍රජා සහයෝගීතාව සහ ස්වේච්ඡා සේවා ආදී කටයුතු රැසක් සිදුකරමින් සමාජයට වැඩදායී ආයතනයක් බවට පත් වීම සඳහා සාධනීය පියවර රැසක් ක්‍රියාවට නැංවීය.

මූල්‍ය වර්තාවේ සලකා බලන වර්ෂය තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලය රුපියල් බිලියන 15ක පිරිවැටුමක් වාර්තා කළ අතර එය පෙර වසර හා සැසඳීමේදී 25% ක වර්ධනයක් බව සඳහන් කළ හැක. අලුතින් හඳුන්වාදුන් සංවර්ධන ලක්ෂපති, කෝටිපති ශනිදා සහ සංවර්ධන වාසනාව යන ලොතරැයි පත් තුන මෙම වර්ධනය සඳහා මූලික වශයෙන් ඉවහල් විය.

එමෙන්ම ක්ෂණික ලොතරැයි, ගැලැක්සි ස්ටාර්, නියත ජය සහ සුපර් බෝල් යන ටිකට් පත් සඳහා නිරන්තරව සිදු කළ ප්‍රවර්ධන සහ අලෙවි වැඩසටහන්වල ප්‍රතිඵලයක් ලෙස මෙම ටිකට් පත්වල අලෙවිය 32%, 3%, 5%, සහ 9% කින් වර්ධනය විය.

සලකා බලන වර්ෂය තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභදායීත්ව සුභවාදී තත්වය පැවති බව මූල්‍ය දත්තයන්ගෙන් තහවුරු වන අතර 2016 වසර තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ බදු පෙර ලාභය රුපියල් බිලියන 2.7 ඉක්මවූ අතර එය පෙර වසරට සාපේක්ෂව 13%ක වර්ධනයක් ද පෙන්නුම් කරයි. 2016 වසර තුළ මණ්ඩලය විසින් ලබා දී ඇති බදු දායකත්වය රුපියල් මිලියන 917ක් වූ අතර එම අගය 2015 වසරේදී රුපියල් මිලියන 662ක් විය. මේ අනුව අපගේ බදු ගෙවීම්වල වර්ධනය 38%ක් වන අතර 2016 වසරේදී මණ්ඩලය බදු පසු ලාභ වශයෙන් රුපියල් බිලියන 1.8ක් වාර්තා කරන ලදි. මෙය පෙර මූල්‍ය වසර සමග සැසඳීමේදී 3%ක වර්ධනයක් පෙන්නුම් කරයි.

## වර්ධන උපායමාර්ග

2016 වසර තුළ මූල්‍ය වටිනාකම් මෙන්ම තිරසාර කාර්යසාධන වටිනාකම් වෙත ලඟා වීම සඳහා අප විසින් ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාවට නංවනු ලැබීය. විකුණුම් මෙහෙයුම් වඩාත් විධිමත් කිරීමේ සහ උපායමාර්ගික ප්‍රවර්ධන සහ අලෙවි වැඩසටහන් දියත් කිරීමේ අරමුණෙන් නව විකුණුම් ඒකකයක් අප විසින් හඳුන්වා දෙනු ලැබීය.

“මූල්‍ය වර්තාවේ සලකා බලන වර්ෂය තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලය රුපියල් බිලියන 15ක පිරිවැටුමක් වාර්තා කළ අතර එය පෙර වසර හා සැසඳීමේදී 25% ක වර්ධනයක් බව සඳහන් කළ හැක.”

මීට සමගාමීව අප විසින් හඳුන්වාදෙනු ලැබූ තිරසාර ව්‍යාපාරික පිළිවෙත් සහ උපකරණ මෙන්ම අපගේ තොරතුරු තාක්ෂණික මෙහෙයුම් විධිමත් කිරීම සඳහා ස්ථිර තොරතුරු සන්නිවේදන සහකාර සාමාන්‍යාධිකාරීවරයකු බඳවා ගන්නා ලදි.

මෙතෙක් සලකා නොබැලූ නව වෙළෙඳපොළ අතික්‍රමණය කිරීම සහ පවතින වෙළෙඳපොළ ඉඩ ප්‍රස්තා පුළුල් කර ගැනීමේ අරමුණෙන් විශේෂයෙන් උතුරු නැගෙනහිර පළාත්වල විශේෂ ප්‍රවර්ධන වැඩසටහන් රැසක් සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් දියත් කරනු ලැබූ අතර මේ සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාවේ සහායද මණ්ඩලයට හිමි විය. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ විකුණුම් සහ අලෙවි කටයුතු ශක්තිමත් කරමින් ගම්පහ, කලුතර, කුරුණෑගල, නුවර, රත්නපුර සහ අම්පාර වැනි දිවයිනේ තෝරා ගත් ප්‍රදේශ ගණනාවක නව ශාඛා ආරම්භ කිරීමද සිදු කෙරිණ.

මෙම වැඩපිළිවෙළට සමගාමීව ප්‍රජා සහයෝගීතාව නැංවීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ආරම්භ කළ නව රැකියා උත්පාදනය, ව්‍යවසායක අවස්ථා ඇති කිරීම, යන මෙහෙවරයන් යටතේ උතුරු පළාතේ පැරණි එල්.ටී.ටී.ඊ සාමාජිකයින් විශාල පිරිසක් ලොතරැයි පත් අලෙවි සඳහා තෝරා ගනු ලැබූ අතර ඔවුන්ගේම ලොතරැයි අලෙවි කුටි පවත්වාගෙන යෑමට දිරිය ලබා දෙන ලදි.

අවසන් වශයෙන් පසුගිය වසරේ මූල්‍ය ඉලක්කයන් සපුරා ගැනීම සඳහා අපට සහාය දැක්වූ සියලු පාර්ශ්වකරුවන්ට මාගේ ශීර්ෂ ප්‍රණාමය පුද කිරීමට මෙය අවස්ථාවක් කොට ගනිමි. එමෙන්ම මුදල් අමාත්‍යංශයට, අධ්‍යක්ෂ මණ්ඩලයට, උප සභාපති ඇතුළු සමාන්‍යාධිකාරීවරයාට මගේ ප්‍රණාමය පුද කරමි. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අතීත සහ වර්තමාන සේවක සේවිකාවන් මෙම ආයතනය වෙනුවෙන් සිදු කළ අනුපමය මෙහෙවරට මගේ කෘතඥතාව හිමිවන අතර ඔවුන්ගේ වෘත්තික බව සහ කැපවීම නොතිබෙන්නට අපට මෙවැනි සාර්ථකත්වයක් ලැබීමට හැකි වන්නේ නැත. එමෙන්ම අපගේ දිනුම් ඇදීම් සඳහා සහභාගී වූ සියලු විනිශ්චය මණ්ඩල සාමාජිකයින්ට, ජනාධිපති අරමුදලේ සහ මහපොළ භාරකාර අරමුදලේ සේවක මණ්ඩලයට, බෙදාහැරීමේ නියෝජිතයින්ට, අලෙවි නියෝජිතයින්ට, මාධ්‍ය සහ බැංකුකරුවන්ට මෙන්ම විගණන නිලධාරීන්ට හා සියලු සැපයුම්කරුවන්ට මගේ භක්ත්‍යාදරය පුද කරමි.

**ජාතියේ ආර්ථික වර්ධනය සඳහා ඉහළම දායකත්වය දක්වමින් තවදුරටත් අපගේ සියලු කොටස් කරුවන්වෙත උපරිම ප්‍රතිලාභ හිමිකර දීමට අපි කැපවී සිටිමු.**

එස්.ඒ.පී. සූරියප්පෙරුම

සභාපති / ප්‍රධාන විධායක නිලධාරී

**සංවර්ධන ලොතරැයි මණ්ඩලය**

# අධ්‍යක්ෂ මණ්ඩලය (2016)

**රොමේෂ් ජයවර්ධන මහතා**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී

**ආර්.අයි. විමලසේන මිය**
උපසභාපති

**ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා**
අධ්‍යක්ෂ

**ඩී.එන්.නානයක්කාර මහතා**
අධ්‍යක්ෂ

**එම්.එස්.ඩී රණසිරි මහතා**
අධ්‍යක්ෂ

# වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය

**එස්.ඒ.පී. සූරියප්පෙරුම මහතා**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

**එච්.ආර්. විමලසිරි  මහතා**
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

**ඩී.එන්. නානායක්කාර මහතා**
අධ්‍යක්ෂ

**එච්.ජී. සුමනසිංහ මහතා**
අධ්‍යක්ෂ

**ඩී.සී. දිසානායක මහතා**
අධ්‍යක්ෂ

# අධ්‍යක්ෂ මණ්ඩල විමසුම

2016 වසර උපායමාර්ග ක්‍රියාත්මක කරමින් ආයතනය වර්ධනය කරා පියනැගි වසරක් ලෙස සඳහන් කරනු කැමැත්තෙමු. මෙම වසර තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලය අපගේ මූලික අරමුණු වූ රටේ දුප්පත්කම තුරන් කිරීමට සහ අධ්‍යාපනය සඳහා දායක වීම යන කරුණු පදනම් කර ගනිමින් ජනාධිපති අරමුදලට සහ මහපොළ උසස් අධ්‍යාපන භාර අරමුදල සඳහා දායකකර ඇති මුදල රුපියල් මිලියන 1,836 කි. මෙම සන්ධර්භය තුළ 2016 වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය අපි විසින් ඉදිරිපත් කරන්නේ මහත් සතුටකිනි.

සලකා බලන කාල සීමාව තුළ ලොතරැයි අලෙවිය සහ ලාභදායීත්වය වැඩි කිරීම සඳහා අප විසින් උපයාමාර්ගික අලෙවි සහ විකුණුම් සැලසුම් කිහිපයක් ක්‍රියාවට නැංවූ අතර ඒවායේ ප්‍රතිඵල ලෙස ලොතරැයි ජයග්‍රාහකයින්ට ඉහළම ත්‍යාග මුදලක් ලබා දෙමින් ලාභදායීත්වයේ ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කිරීමට අපි සමත් වීමු.

අපගේ පාර්ශවකරුවන් වන පාරිභෝගිකයින්, විකුණුම් සහායකයින්, විකුණුම් නියෝජිතයින්, සේවකයින්, මහජනතාව සහ පොදුවේ රජය සඳහා වටිනාකම් නිර්මාණය කිරීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාවේ යෙදවීමට මෙම වසරේදී පියවර ගන්නා ලදි.

2016 වසරේදී අපි විසින් හඳුන්වාදුන් නව ලොතරැයි ටිකට්පත් පාරිභෝගික ආකල්පයන් වෙනස් කරමින් ඔවුන්වෙත ආකර්ෂණීය ත්‍යාග වැඩි සංඛ්‍යාවක් හඳුන්වාදීමටද කටයුතු කළෙමු. අපගේ සාර්ථක අලෙවි සහ වටිනාකම් එකතු කිරීමේ ක්‍රියන්විතයේ ප්‍රතිඵලයක් ලෙස සංවර්ධන ලක්ෂපති ලොතරැයිය හඳුන්වාදීමට අපට හැකි වූ අතර පළමු වටය තුළ මෙහි අලෙවිය මිලියන 5.6ක් විය. 2016 වසර තුළ අපි විසින් හඳුන්වාදුන් සියලු ලොතරැයි පත් තුළින් ජයග්‍රාහකයින් විශාල මුදල් ත්‍යාග දිනා ගන්නටත්, පෙර සිට පැවති ලොතරැයි සඳහා ලබා දුන් ත්‍යාග මුදල් ආකර්ෂණීය ලෙස වෙනස්කම් වලට ලක් කිරීමටත් අපි කටයුතු කළෙමු. සමාලෝචනයට බඳුන්වන කාලසීමාවේදී සේවා ප්‍රමිතීන් උසස් කිරීමටත්, දීප ව්‍යාප්තව අප සමග සම්බන්ධ වී සිටින අපගේ විකුණුම් සහායකයින් සහ විකුණුම් නියෝජිතයින්ට දිරිගැන්වීමේ දීමනා ක්‍රමයක් සහ සෞඛ්‍ය පහසුකම් වෙත යොමු වීමේ ක්‍රමවේදයක් ඇති කිරීමටත් කටයුතු කරන ලදි.

කාර්යක්ෂමතාව වැඩිදියුණු කරමින් ඉදිරියේදී එල්ල විය හැකි අභියෝගයන් ජයගැනීම සඳහා කණ්ඩායම් සාකච්ඡා අප විසින් සංවිධානය කළ අතර මේ සඳහා ඒ ඒ දිස්ත්‍රික්කයන් නියෝජනය කරමින් නියෝජිතයින් සහභාගී විය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මූලික අරමුණක් වන ජාතිය ගොඩනැගීම සඳහා දායක වීම යන්න සැලකීමේදී අප විසින් රුපියල් මිලියන 2ක් මූලික අදියරේදී ආයෝජනය කරමින් කිලිනොච්චි, මුලතිව් හා මන්නාරම යන දිස්ත්‍රික්කවල පුනරුත්ථාපනය වූ එල්.ටී.ටී.ඊ සාමාජිකයින් 20 දෙනෙකු සඳහා නව ලොතරැයි අලෙවි කුටි ඉදිකර දෙනු ලැබීය. මෙවැනිම විකුණුම් නියෝජිතයින් 85 දෙනෙකුට ලොතරැයි කුටි ඉදිකරගැනීම සඳහා මූල්‍ය ආධාර ලබා දුන් අතර තවත් 30 දෙනෙකුට නව ලොතරැයි කුටි ලබා දෙන ලදි.

සලකා බලන කාලසීමාව තුළ අපගේ පාරිභෝගිකයින් වෙත මුදල් ත්‍යාග ලෙස ලබා දුන් මුදල රුපියල් මිලියන 7,755කට අධිකය.

අවසන් වශයෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට සහ කළමනාකාරීත්වයට අපගේ කෘතඥතාව පළ කරන අතර අපගේ විගණකවරුන්ගේ අඛණ්ඩ සහායට අපගේ ප්‍රණාමය පිරිනැමේ. අප අද දවසේ අනුදකින සාර්ථකත්වය ලබා ගැනීමට අපගේ හිතවත් පාරිභෝගිකයින්ගෙන් අප ලද සහාය අමිල වූ අතර අප කෙරෙහි කාලාන්තරයක් දැක්වූ විශ්වාසය වෙනුවෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලයේ ශිර්ෂ ප්‍රණාම ඔවුන් වෙත පිරිනැමේ. 2017 වසරේදීත් අපගේ විශිෂ්ටත්වය සහ කැපවීම එලෙසම රඳවා ගනිමින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය තවත් ඉදිරියට රැගෙන යමින් මෙරට ආර්ථිකය සඳහා ඉහළම දායකත්වය සැපයීමට අපි නිරතුරුවම කැපවී සිටිමු.



**ආචාර්ය වික්‍රම වීරසූරිය**

අධ්‍යක්ෂ

# කළමනාකාරීත්වය

**ජේ.එම් සමන් ජයසිංහ මහතා**
සාමාන්‍යාධිකාරී

**අනුර ජයරත්න මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අලෙවි

**විජිතා සෝමරත්න මෙනවිය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මූල්‍ය

**චානක දොඩන්ගොඩගේ මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවි

**කපිල බුලත්සිංහල මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවි

**අසංකා එස්. ගුණසිංහ මහත්මිය**
සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවි

**සුනිල් ජයරත්න මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය

**කසුන් ජයසූරිය මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය

**නිෂාන් පෙරේරා මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය

**මධුර හර්ෂණ මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී - තොරතුරු තාක්ෂණ

**වසන්ත සේනාධීර මහතා**
අභ්‍යන්තර විගණන නිලධාරී

**මේජර් ජේ.එම්.ඩී.ඒ. ක්‍රිශාන්ත**
ප්‍රධාන ආරක්ෂක නිලධාරී

# කණිෂ්ඨ කළමනාකාරීත්වය

**නුවන් අබේරත්න මහතා**
පරිපාලන නිලධාරී

**ජී. රෝෂන් ප්‍රියන්ත මහතා**
විකුණුම් නිලධාරී

**සී.සී. අයිලප්පෙරුම මහතා**
අලෙවි නිලධාරී

**ජී.ඒ.ආර්.එස්. රණතුංග මහතා**
අලෙවි නිලධාරී

**එම්.බී.එම්.එන්. බලගල්ල මහතා**
අලෙවි නිලධාරී

**එම්.කේ. අජිත් ඉන්දික කමල්සිරි මහතා**
අලෙවි නිලධාරී

**අයි.ඩී.පී. කුමාරසිරි මහතා**
අලෙවි නිලධාරී

**අයි.ඒ. උමේෂ් ගයන්ග ඉලේපෙරුම මහතා**
පද්ධති/වැඩසටහන් විශ්ලේෂක

**චමිලා තෙවරප්පෙරුම මහත්මිය**
මානව සම්පත් නිලධාරී

**චමින්ද කරුණාරත්න මහතා**
ප්‍රසම්පාදන නිලධාරී

**එන්.වී. ඉන්දික උපුල් මහතා**
මූල්‍ය නිලධාරී

**චන්ද්‍ර රාජපක්ෂ මහත්මිය**
මූල්‍ය නිලධාරී

**නිරංජලා ගුණසේකර මහත්මිය**
මූල්‍ය නිලධාරී

**වත්සලා රූපසිංහ මහත්මිය**
මූල්‍ය නිලධාරී

# මෙහෙයුම් සමාලෝචනය

## 2016 ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳ ඉදිරි දැක්ම

විවිධ දේශීය හා ගෝලීය අභියෝග හමුවේ වුවද ශ්‍රී ලංකාව 2016 වසර තුළ 4.4% ක ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීමට සමත් විය. මෙම වසරේ පැවති අයහපත් කාලගුණික තත්ත්වය කෘෂි කර්මාන්තයට විශේෂයෙන්ම වී, තේ සහ රබර් සඳහා හිතකර තත්වයක් උදා නොකළේය. මේ හේතුව මත කෘෂි, වන සම්පත් සහ ධීවර ක්ෂේත්‍රයේ දළ දේශීය ආදායම සඳහා දායකත්වය 7.1% සිට 4.2% දක්වා අඩු වූ අතර සේවා ක්ෂේත්‍රයේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා දායකත්වය 56.5%ක් පමණ වෙමින් මෙම දායකත්වය පසුගිය වසරට සපේක්ෂව 4.2%කින් වර්ධනය කර ගැනීමටද සමත් විය. සේවා අංශය තුළ මූල්‍ය සේවාවන්ගේ දායකත්වය 12.4%කින් වර්ධනය වී තිබීම විශේෂත්වයකි. කර්මාන්තය ආශ්‍රිත ක්ෂේත්‍රයේ වර්ධනය පසුගිය වසරට සාපේක්ෂව 6.7%කින් වැඩි කරගනිමින් 26.8% දායකත්වයක් දළ දේශීය නිෂ්පාදිතයට ලබා දී ඇත.

මෙම සැලකිය යුතු වර්ධනය සඳහා ඉදිකිරීම් පතල් හා කැණීම් ඉහළ දායකත්වයක් ලබා දී ඇත. නිෂ්පාදන ක්‍රියාකාරකම් ආශ්‍රිතව ඇති වූ වර්ධනය 1.7%කි.




Source: Department of Census and Statistics

## උද්ධමනය

2016 වසරේ පළමු කාර්තුව තුළ උද්ධමනය පහළ මට්ටමක පැවති අතර ජාතික පාරිභෝගික මිල දර්ශකය සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකයන්ට අනුව වාර්ෂික සාමාන්‍ය 4%ක් ලෙස වාර්තා විය. අයහපත් කාලගුණික තත්ත්වයන් හමුවේ අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍යයන්ගේ මිල මට්ටම් ලෝක වෙළෙඳපොලේ ඉහළ යෑමත් බදු අනුපාතයන්ගේ සිදු වූ වෙනස්කම් මත පැවති ඉහළ උද්දමන අනුපාතය වසර පුරා එලෙසම පැවතිනි.

## ගෙවුම් ශේෂය

සංචාරක, සේවා අපනයන සහ සේවක සංක්‍රාම යන ක්ෂේත්‍රයන්ගේ ඉපැයීම් වල වර්ධනයක් ඇති වීම හේතුවෙන් රටතුළට පැමිණි විදේශ විනිමයේ වර්ධනයක් දකින්නට ලැබින. කෙසේ වුවද ගෝලීය පොලී අනුපාතයන් ඉහළ යෑම, සෘජු විදේශ ආයෝජන ප්‍රමාණවත් නොවීම, දේශීය භාණ්ඩ පැස සඳහා පැවති දුර්වල ඉල්ලුම හේතුවෙන් ගෙවුම් ශේෂ හිඟයක් ඇති විය.

## ඉදිරි දැක්ම

මෙම වසර තුළ පැවති අහිතකර කාළගුණික තත්ත්වයන් යටතේ 2017 වසර සඳහා පුරෝකථනය කල ආර්ථික වර්ධනය 5%ක් ලෙස දැක්විය හැක. කෙසේ වෙතත් පුද්ගලික අංශයේ සක්‍රීය දායකත්වය වැඩි වශයෙන් යොදාගනිමින්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල පුළුල් කරමින් 2020 වන විට ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය 7% දක්වා ගෙන ඒම රජයේ අරමුණයි.

## ප්‍රධාන ක්‍රියාකාරකම්

සලකා බලන වර්ෂය තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් රුපියල් මිලියන 1836ක් ජනාධිපති අරමුදලට සහ මහපොළ උසස් අධ්‍යාපන භාර අරමුදලට දායක කර ඇත. 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත මගින් පාලනය වන මෙම ආයතනයෙහි මූලික අරමුණු වන්නේ දුප්පත්කම දුරලීම සඳහා අරමුදල් සම්පාදනය, අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම, අනෙකුත් සංවර්ධන කාර්යයන් සඳහා සිය දායකත්වය ලබා දීමයි.

## සේවා කළඹ

| ලොතරැයිය | දිනුම් ඇදීමේ ක්‍රමවේදය |
|---|---|
| ශනිදා වාසනාව | ජයග්‍රාහි අංක 75ක් අතුරින් අංක 4ක් ගැලපීම<br>බෝනස් අංකය එකේ සිට අංක 71 දක්වා ඇති එම යන්ත්‍රයෙන් එක් අංකයක් තේරීම<br>ඉංග්‍රීසි අක්ෂරය - ඉංග්‍රීසි අක්ෂර 26ක් සඳහන් පන්දු 26කින් එකක් වෙනත් යන්ත්‍රයකින් තෝරා ගැනීම |
| ලග්න වාසනා | පළමු අදියර අංකනය කළ පන්දු 61ක් අතුරින් පන්දු 4ක් තෝරා ගැනීම<br>දෙවැනි අදියර - ලග්න සංකේත 12ක් අතුරින් එකක් තෝරා ගැනීම |
| ජයෝදා | ජයග්‍රාහී අංක 4, අංක සඳහන් පන්දු 68ක් සහිත යන්ත්‍රයක් මගින් පන්දු 4ක් තෝරා ගැනීම<br>ඉංග්‍රීසි අක්ෂරය - ඉංග්‍රීසි අක්ෂර 26ක් සඳහන් පන්දු 26කින් එකක් වෙනත් යන්ත්‍රයකින් තෝරා ගැනීම |
| ගැලැක්සි ස්ටාර් | ජයග්‍රාහී අංක 4, අංක සඳහන් පන්දු 60ක් සහිත යන්ත්‍රයක් මගින් පන්දු 4ක් තෝරා ගැනීම<br>තරු සලකුණ අංක 1සිට 12ක් දක්වා අංක සහ තරුලකුණු සහිත පන්දු 12ක් අතුරින් එක් පන්දුවක් වෙනත් යන්ත්‍රයකින් තෝරා ගැනීම |
| නියත ජය | ජයග්‍රාහි අංක 4 - අංක සඳහන් පන්දු 65ක් සහිත යන්ත්‍රයක් මගින් අංක සහිත පන්දු 4ක් තෝරා ගැනීම<br>ඉංග්‍රීසි අක්ෂරය - ඉංග්‍රීසි අක්ෂර 26ක් සඳහන් පන්දු 26කින් එකක් වෙනත් යන්ත්‍රයකින් තෝරා ගැනීම |
| සුපර් බෝල් | ජයග්‍රාහි අංක 4 - අංක සඳහන් පන්දු 73ක් සහිත යන්ත්‍රයක් මගින් අංක සහිත පන්දු 4ක් තෝරා ගැනීම<br>ඉංග්‍රීසි අක්ෂරය - ඉංග්‍රීසි අක්ෂර 26ක් සඳහන් පන්දු 26කින් එකක් වෙනත් යන්ත්‍රයකින් තෝරා ගැනීම |
| සංවර්ධන ලක්ෂපති | ජයග්‍රාහී අංක 3 අංක සඳහන් පන්දු 50ක් සහිත යන්ත්‍රයක් මගින් පන්දු 3ක් තෝරා ගැනීම |
| කෝටිපති ශනිදා | පළමු අදියර අංකනය කළ පන්දු 80 කින් පන්දු 4ක් තෝරා ගනී.<br>දෙවැනි අදියර - ඉංග්‍රීසි අක්ෂර 26ක් සඳහන් පන්දු 26කින් එකක් වෙනත් යන්ත්‍රයකින් තෝරා ගැනීම |
| සංවර්ධන වාසනාව | පළමු අදියර - අංකනය කළ පන්දු 65 කින් පන්දු 4ක් තෝරා ගනී.<br>දෙවැනි අදියර මාස 12 නම් සඳහන් පන්දු 12ක් අතුරින් එක් පන්දුවක් තෝරා ගැනීම<br>තෙවැනි අදියර අංකනය කළ පන්දු 6ක් අතුරින් එකක් තෝරා ගැනීම |

2016 වසර තුළ උපායමාර්ගික ප්‍රවේශයක් ලෙස සංවර්ධන ලොතරැයි මණ්ඩලය සේවක තෘප්තිමත්භාවය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වූ අතර විකුණුම් නියෝජිතයින් දිරිගන්වමින් වැඩි ලොතරැයිපත් සංඛ්‍යාවක් අලෙවි කිරීමට උත්සාහ ගන්නා ලදි. මේ අනුව ලබා ගත් විකුණුම් වර්ධනය සඳහා ප්‍රතිලාභ ලබා දීමටත් , නව වෙළෙඳපොළවල් සොයා ගැනීම සහ දනට සිටින පාරිභෝගිකයින් දිරි ගැන්වීම සඳහා ආකර්ෂණීය ත්‍යාග හඳුන්වාදීමද සිදු කෙරිණ. මෙම උපාය මාර්ගික ප්‍රවේශයන් හේතුවෙන් ප්‍රශස්ත කාර්යසාධනයක් වාර්තා කිරීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමත් විය.

## කාර්යසාධන දර්ශකයන්හි සංක්ෂිප්තය

| | 2016 | 2015 |
|---|---:|---:|
| විශාලම ජයමල්ල | 98,560,620 | 56,974,540 |
| මාසික ජයග්‍රාහකයින්ගේ සාමාන්‍ය | 15,336,386 | 12,237,438 |
| මුළු විකුණුම් (වාර්ෂික) | 14,759,875,240 | 11,874,659,603 |
| මුළු ත්‍යාග මුදල් ගෙවීම් | 7,755,659,066 | 6,150,951,795 |
| ත්‍යාග දිනූ ජයග්‍රාහකයින් ගණන | 184,036,631 | 146,849,258 |
| මිලියනපතියන් සංඛ්‍යාව | 540 | 575 |
| ජනාධිපති අරමුදල සඳහා ලබාදුන් දායකත්වය | 1,836,020,000 | 1,628,053,000 |

# මෙහෙයුම් සමාලෝචනය ඉතිරිය

## අලෙවි සහ මෙහෙයුම් සංක්ෂිප්තයන්

සලකා බලන කාලසීමාව තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් නව ටිකට්පත් කිහිපයක් වෙළෙඳපොළට නිකුත් කළ අතර නව අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් කිහිපයක්ද මීට සමගාමීව ආරම්භ කරන ලදි. මෙම නව ටිකට්පත් සහ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් මගින් නව පාරිභෝගික පදනමක් සහ දැනට සිටින පාරිභෝගිකයින් වඩාත් ආකර්ෂණය කර ගැනීමට හැකි විය.

## සංවර්ධන ලක්ෂපති

සංවර්ධන ලොතරැයි මණ්ඩලය හඳුන්වාදුන් සංවර්ධන ලක්ෂපති 2016 මාර්තු 14වන දින වෙළෙඳපොළට හඳුන්වාදෙනු ලැබීය. ආකර්ෂණීය අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් සමග පැමිණි මෙම ටිකට්පත පළමු වටයේදී ටිකට්පත් මිලියන 5.6ක අලෙවි වාර්තාවක් තබන ලදි.

## කෝටිපති ශනිදා

2016 අප්‍රේල් 8වන දින කෝටිපති ශනිදා ලොතරැයිය හඳුන්වා දෙන ලදි. මූලික වටයේදී මෙම ලොතරැයිය මිලියන 4.4ක අලෙවියක් පෙන්නුම් කළේය.

## සංවර්ධන වාසනාව

රූපවාහිනී ලොතරැයි දිනුම් ඇදීමක් ලෙස පැවැත්වෙන සංවර්ධන වාසනාව ලොතරැයිය 2016 දෙසැම්බර් 22වනදා සිට නව පෙනුමක් සහ මුදල් ත්‍යාග 3ක් සමග වෙළෙඳපොළට නිකුත් කරන ලදි.

## ඉලක්කගත අලෙවි ප්‍රවර්ධන

### ලක්ෂ වර්ෂා

2016 මැයි 27වන දින රුපියල් ලක්ෂයේ දිනුම් සහිත විශේෂ ලොතරැයි පතක් මෙම ප්‍රවර්ධන වැඩසටහන පැවති කාලසීමාවේ නිකුත් කළ ලක්ෂ වර්ෂා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන මගින් ලග්න වාසනාව,නියත ජය, සහ කෝටිපති ශනිදා, ප්‍රවර්ධනය කර එය මිලියන 3.25ක අලෙවියක් වාර්තා කළේය.

### ශනිදා වාසනාව

යළි හඳුන්වාදුන් ශනිදා වාසනාව ලොතරැයිය විශේෂිත දිනුම් වාර සමග රුපියල් මිලියන 30ක ජයමල්ලක් හඳුන්වා දෙන ලද අතර ඉංග්‍රීසි අක්ෂරය සමග රුපියල් 20කට වෙළෙඳපළට නිකුත් කරන ලදි.

### ලග්න වාසනාව - ඩබල් චාන්ස්

ලග්න වාසනාව ටිකට්පත සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් දිනපතා සිදුකරන දිනුම් ඇදීම් වලින් විශේෂිත මුදල් ත්‍යාග හිමිකර ගැනීමේ අවස්ථාව පාරිභෝගිකයින්ට ලබා දුන් අතර අංකනය කරන ලද පන්දු 80කින් අංක සහිත පන්දු 2ක් තෝරා ගන්නා ලදි. මෙහිදී පළමු අංකය සඳහා රුපියල් 50ක්ද අංක දෙකක් සඳහා රුපියල් 1000ක්ද ලබා දෙන ලදි. 2016 ඔක්තෝම්බර් 21වන දින පැවති පූර්ව දිනුම් ඇදීමේදී ටිකට් පත් මිලියන 2.2ක් අලෙවි විය. විශේෂිත ත්‍යාග මාස 3ක් පුරා ලබා දීමට ද කටයුතු කර ඇත.

### ජයෝදා - තෑගි උඩින් තෑගි

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජයෝදා ලොතරැයිය සඳහා ලබාදෙන ත්‍යාග මුදල රුපියල් 60 කින් ආරම්භ කරමින් අංක දෙකක් සඳහා රුපියල් 100ක්ද 2016 නොවැම්බර් 21වන දාසිට ලබා දෙන ලදි. මෙම හේතුවෙන් ජයෝදා ලොතරැයි අලෙවිය මිලියන 1.7 දක්වා වර්ධනය විය.

### නියත ජය - දෙදාහේ රැල්ල

වැඩි ලොතරැයිපත් සංඛ්‍යාවක් අලෙවි කර ගැනීම සඳහා ප්‍රමාණයෙන් විශාල ටිකට්පතක් දෙදාහේ රැල්ල නමින් 2016 නොවැම්බර් 29 වන දින සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් හඳුන්වා දෙන ලදි. පළමු දිනය තුළම මෙම ටිකට් පත් මිලියන 1.23ක් අලෙවි කිරීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමත්විය.

### සුපර් බෝල් - ලකී සීසන්

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් නත්තල් උත්සව සමයේ හඳුන්වාදුන් මෙම විශේෂිත අලෙවි ප්‍රවර්ධනය සුපර් බෝල් ලොතරැයිය සමග සමගාමීව ක්‍රියාත්මක වූ අතර දෙසැම්බර් 29 වන දිනට ලොතරැයි පත් මිලියන 2.03ක් අලෙවි කිරීමටද සමත් විය.

### සංවර්ධන ලක්ෂපති - ෂුවර් චාන්ස්

අමතර තෑගි සමග සංවර්ධන ලක්ෂපති ටිකට්පතට හඳුන්වා දුන් ෂුවර් චාන්ස් වැඩසටහන මගින් 2016 ඔක්තෝම්බර් 10 දිනට ටිකට්පත් මිලියන 1.02ක් අලෙවි විය.

### ක්ෂණික ලොතරැයි

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් තම ක්ෂණික ලොතරැයි ජයග්‍රාහකයින්ට සහ අලෙවි නියෝජිතයින්ට සිංගප්පූරු සංචාර ලබාදෙන මෙම වැඩසටහන 2016

නොවැම්බර් මාසයේදී දියත් කරන ලදි. ජයග්‍රහණ හිමිකර ගත් පවුල් 8ක් සහ නියෝජිතවරුන් 5 දෙනෙක් මෙම සංචාරයන්ට එක් වූහ.

### අලෙවි බලකාය ව්‍යාප්ත කිරීම සහ ත්‍යාග

සලකා බලන කාලසීමාව තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලය උපායමාර්ගික පියවර කිහිපයක් ගනිමින් දිවයිනේ විවිධ පළාත් සඳහා අලෙවි නියෝජිතයින් පත් කිරීමට කටයුතු කළ අතර සාමාන්‍යයෙන් ලබා දෙන සියලු ප්‍රතිලාභ සහ වරප්‍රසාද ඔවුන්ටද ලබා දෙන ලදි. 2016 වසර තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් නව අලෙවි නියෝජිතවරු 200ක් පත් කළ අතර මෙම උපාය මාර්ගය මගින් වෙළෙඳපොළ කොටස පුළුල් කර ගනිමින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභය වර්ධනය කර ගැනීම අපේක්ෂාව විය.

| අපගේ ලොතරැයි නිෂ්පාදන කළඹ |
|---|
| ශනිදා වාසනාව |
| ලග්න වාසනාව |
| ජයෝදා |
| ගැලැක්සි ස්ටාර් |
| නියත ජය |
| සුපර් බෝල් |
| ක්ෂණික |
| සංවර්ධන ලක්ෂපති |
| කෝටිපති ශනිදා |
| සංවර්ධන වාසනාව |

අලෙවි නියෝජිතයින් වෙත ප්‍රතිලාභ සැලසීමේ ක්‍රියාවලිය යටතේ සංවර්ධන ලොතරැයි මණ්ඩලය කාර්යසාධනය මත ප්‍රතිලාභ සැලසීමේ වැඩපිළිවෙළ යළි ආරම්භ කරමින් බෙදාහරින්නන් සහ අලෙවි නියෝජිතවරුන් වෙත මුදල් ප්‍රතිලාභ සහ වෛද්‍යාධාර ලබා දීමට පියවර ගන්නා ලදි. අලෙවිය වර්ධනය කර ගැනීමේ පියවරක් ලෙසත් අලෙවි නියෝජිතයින් මුහුණ දෙන අභියෝග ජය ගැනීමටත් දිස්ත්‍රික්ක මට්ටමින් සාකච්ඡාවන් ආරම්භ කිරීමට පියවර ගැනිනි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය බෙදාහරින්නන් සහ අලෙවි නියෝජිතවරු 82 ක් සඳහා වෛද්‍යාධාර ලබා දීමට පියවර ගත් අතර මේ සඳහා මණ්ඩලය විසින් රුපියල් මිලියන 1.4ක් වෙන් කෙරිණ.

උතුරු පළාත තුළ සිය අලෙවිය වර්ධනය කිරීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය රුපියල් මිලියන 2ක් ආයෝජනය කළ අතර පුනරුත්ථාපනය වූ එල්.ටී.ටී.ඊ සාමාජිකයින් ලොතරැයි අලෙවි කටයුතු සඳහා සම්බන්ධ කර ගැණින.

අලෙවි කටයුතු වර්ධනය කර ගැනීමේ උපායමාර්ගය යටතේ රුපියල් මිලියන 1.275ක් නියෝජිත අලෙවි කුටි සංවර්ධනයට වෙන් කළ අතර මේ යටතේ එක් අලෙවි කුටියකට රුපියල් 15,000 බැගින් අලෙවි නියෝජිතයින් 85කට මුදල් ආධාර ලබා දෙන ලදි.

සලකා බලන වර්ෂය තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලය කිලිනොච්චිය, මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්කයන්හි නව අලෙවි කුටි 30ක් ඉදිකරමින් ඒ සඳහා රුපියල් මිලියන 1.35ක් වැය කරන ලදි.

ලොතරැයි අලෙවි කුටි සඳහා ස්ටිකර් මුද්‍රණය සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් රුපියල් 558,083ක් වැය කළ අතර වසර තුළ සිදු කළ ආයතනික සමාජ වගකීම් කාර්යයන් සඳහා මණ්ඩලය විසින් රුපියල් මිලියන 9.45ක් ද වැය කෙරිණ.

අලෙවිය වර්ධනය කරගනිමින් ලාභදායීත්වය වර්ධනය කර ගැනීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය අලෙවි නිලධාරීන් 6 දෙනෙකු බඳවා ගත් අතර මෙම නිලධාරීන් ගම්පහ, කලුතර, කුරුණෑගල, නුවර, රත්නපුර සහ අම්පාර දිස්ත්‍රික්කයන් සඳහා අනුයුක්ත කළේය.

සලකා බලන වර්ෂය තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් නව අලෙවි ප්‍රවර්ධන සහකාරවරුන් තිදෙනෙක්ද අලෙවි සම්බන්ධීකාරකවරුන් 9 දෙනෙකු උපායමාර්ගිකව විවිධ පළාත්වලට අනුයුක්ත කරන ලදි.

# මෙහෙයුම් සමාලෝචනය ඉතිරිය

## මූල්‍ය සමාලෝචනය

සලකා බලන වර්ෂය තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලය බදු පෙර ලාභය ලෙස රුපියල් බිලියන 2.7ක් වාර්තා කළ අතර පසුගිය මූල්‍ය වර්ෂය හා සසඳන විට මෙහි වැඩි වීම 13%ක් වේ. මණ්ඩලය විසින් ආදායම් බදු ලෙස රජයට ලබා දී ඇති මුදල රුපියල් මිලියන 917 දක්වා වර්ධනය වී ඇති අතර මෙය පසුගිය වසරට සාපේක්ෂව 38% වර්ධනයකි. විශාල බදු මුදලක් ගෙවීමෙන් අනතුරුව මණ්ඩලය බදු පසු ලාභ ලෙස රුපියල් බිලියන 1.8ක් ලැබූ අතර මෙය පෙර වර්ෂය සමග සසඳන විට 3%ක වර්ධනයක් පෙන්නුම් කරයි.

2016 වර්ෂයේදී අලෙවි ප්‍රවර්ධනය මගින් කැපීපෙනෙන වෙළෙඳපොළ කොටසක් අත්පත් කර ගැනීමට මණ්ඩලයට හැකි වූ අතර තිරසාර ලෙස ලාභදායීත්වය වර්ධනය කර ගැනීමටද හැකි විය. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ දළ අලෙවිය රුපියල් බිලියන 15ක් විය. මෙය පෙර වසරට සාපේක්ෂව 25% වර්ධනයක් පෙන්නුම් කරයි. නව ලොතරැයි කිහිපයක් හඳුන්වාදීම සහ වර්ෂය පුරා දියත් කළ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් වල ප්‍රතිඵලයක් ලෙස මෙම වර්ධනය හැඳින්විය හැක. වෙළෙඳපොළ අරමුණු කර ගත් අලෙවි වැඩසටහන් හේතුවෙන් ක්ෂණික ලොතරැයි අලෙවි වර්ධනය 32% කින් වර්ධනය වූ අතර 2016 දී සුපර් බෝල් ලොතරැයියේ අලෙවිය 9%කින් ඉහළ ගියේය. නියත ජය ලොතරැයියේ අලෙවි වර්ධනය 5%ක් වූ අතර ගැලැක්සි ස්ටාර් ලොතරැයියේ අලෙවි වර්ධනය 3%ක් විය. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජනාධිපති අරමුදල සඳහා 2016 වසරේ රුපියල් බිලියන 1.8ක දායකත්වයක් ලබාදුන් අතර මෙය පෙර වසරේ රුපියල් බිලියන 1.6 සමග සසඳන විට 12.77% වර්ධනයකි.

### මුළු ත්‍යාග මුදල් ගෙවීම් සහ ජයග්‍රාහකයින් ලොතරැයිපත් වලට අනුරූප ලෙස

| | 2016 | | 2015 | |
|---|---|---|---|---|
| ලොතරැයිය | ත්‍යාග මුදල | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | ත්‍යාග මුදල | ජයග්‍රාහකයින් සංඛ්‍යාව |
| ශනිදා වාසනාව | 1,242,791,000 | 27,199,379 | 1,270,434,000 | 27,181,310 |
| ලග්න වාසනාව | 1,449,623,550 | 45,452,262 | 1,491,265,928 | 40,350,419 |
| ජයෝදා | 712,645,000 | 18,361,051 | 712,092,000 | 18,433,106 |
| නියත ජය | 620,295,000 | 16,474,559 | 588,235,500 | 15,228,196 |
| සුපර් බෝල් | 1,372,077,500 | 32,420,969 | 1,261,931,500 | 30,627,030 |
| ගැලැක්සි ස්ටාර් | 568,453,900 | 17,599,013 | 551,431,323 | 15,029,197 |
| සංවර්ධන ලක්ෂපති | 500,111,500 | 8,637,497 | - | - |
| සංවර්ධන වාසනාව | 24,193,000 | 596,728 | - | - |
| කෝටිපති ශනිදා | 786,236,050 | 17,295,173 | - | - |
| එකතුව | 7,276,426,500 | 184,036,631 | 5,875,390,251 | 146,849,258 |

### බෙදාහරින්නන්ට අලෙවි නියෝජිතයන්ට හා අලෙවි සහායකයින්ට සහන ලබා දීම

සලකා බලන වර්ෂය තුළ සංවර්ධන ලොතරැයි මණ්ලඩය බෙදාහරින්නන්ට අලෙවි නියෝජිතයින්ට හා අලෙවි සහායකයින්ට කාර්යසාධන සහන ගෙවීම් සිදු කරනු ලැබූ අතර මොවුන්ගේ වෛද්‍යාධාර සඳහා මණ්ඩලය රුපියල් මිලියන 1.4ක් වැයකරනු ලැබීය.

### නියෝජිත හමුව

2016 වසර තුළ පහත දැක්වෙන නියෝජිත රැස්වීම් පවත්වන ලදී.

| දිනය | දිස්ත්‍රික්කය | ස්ථානය |
|---|---|---|
| 19.11.2016 | යාපනය | යාපනය |
| 20.11.2016 | යාපනය | යාපනය |

### 2016 නව දිස්ත්‍රික් පත් කිරීම්

| දිස්ත්‍රික්කය | බෙදාහරින්නන් සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 02 |
| පුත්තලම | 01 |
| පොළොන්නරුව | 01 |
| **එකතුව** | **04** |

### 2016 වසර තුළ පත් වූ ඒජන්තවරු සංඛ්‍යාව

| දිස්ත්‍රික්කය | ඒජන්තවරු සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 37 |
| කළුතර | 08 |
| නුවර | 07 |
| මාතලේ | 08 |
| මඩකලපුව | 01 |
| අම්පාර | 05 |
| ත්‍රිකුණාමලය | 03 |
| කුරුණෑගල | 16 |
| නුවරඑළිය | 10 |
| ගාල්ල | 12 |
| මාතර | 06 |
| යාපනය | 02 |
| වව්නියාව | 05 |
| රත්නපුර | 12 |
| ගම්පහ | 22 |
| පුත්තලම | 08 |
| අනුරාධපුරය | 09 |
| පොළොන්නරුව | 05 |
| බදුල්ල | 06 |
| මොණරාගල | 04 |
| කෑගල්ල | 07 |
| මුලතිව් | 02 |
| හම්බන්තොට | 04 |
| කිලිනොච්චි | 01 |
| **එකතුව** | **200** |

# මෙහෙයුම් සමාලෝචනය ඉතිරිය

## නිෂ්පාදන කළඹ

### 1. ශනිදා වාසනාව

#### දිනුම් ඇදීමේ ක්‍රමවේදය

ජයග්‍රාහි අංක 4කි. අංකනය කළ පන්දු 75ක් අතුරින් එක් යන්ත්‍රයක් ආධාරයෙන් අංක 4ක් තෝරා ගනී. බෝනස් අංකය ඉතිරි පන්දු 71න් තෝරා ගනී. ඉංග්‍රීසි අක්ෂර 26ක් සහිත පන්දු සහිත යන්ත්‍රයකින් එක් ඉංග්‍රීසි අක්ෂරයක් තෝරා ගැනේ.

#### තෑගි ව්‍යුහය

| සංකලනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම තනි අංකයක් | රු.20.00 |
| ඉංග්‍රීසි අක්ෂරය | රු.20.00 |
| ඕනෑම අංක 2 | රු.100.00 |
| ඕනෑම අංක 3 | රු.1,000.00 |
| ඕනෑම අංක 4 | රු.1,000,000.00 |
| ඕනෑම තනි අංකයක් + ඉංග්‍රීසි අක්ෂරය | රු.40.00 |
| ඕනෑම අංක 2 + ඉංග්‍රීසි අක්ෂරය | රු.1,000.00 |
| ඕනෑම අංක 3 + ඉංග්‍රීසි අක්ෂරය | රු.10,000.00 |
| ඕනෑම අංක 4 + ඉංග්‍රීසි අක්ෂරය | රු.30,000,000.00 |
| ඕනෑම අංකයක් + බෝනස් අංකය | රු.100.00 |
| ඕනෑම අංක 2 + බෝනස් අංකය | රු.500.00 |
| ඕනෑම අංක 3 + බෝනස් අංකය | රු.100,000.00 |

#### දිනුම් ඇදීමේ දිනය

දම් පැහැති ටිකට්පත් සෑම බදාදා දිනකම සහ කොළ පැහැති ටිකට්පත් සෑම සෙනසුරාදා දිනකම දිනුම් අදී.

#### විකාශන වේලාවන්

සෑම බදාදා සහ සෙනසුරාදා දිනකදීම රාත්‍රී 9.45ට චැනල් අයි නාලිකාව ඔස්සේ විකාශනය කෙරේ.

### 2. ජයෝදා

#### දිනුම් ඇදීමේ ක්‍රමවේදය

අංකනය කරන ලද පන්දු 68ක් අතුරින් පන්දු 4ක් එක් යන්ත්‍රයකින් තෝරා ගනී. ඉංග්‍රීසි අක්ෂර 26ක් සහිත පන්දු සහිත යන්ත්‍රයකින් එක් ඉංග්‍රීසි අක්ෂරයක් තෝරා ගැනේ.

#### ත්‍යාග ව්‍යුහය

| සංකලනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඉංග්‍රීසි අක්ෂරය | රු.20.00 |
| ඕනෑම තනි අංකයක් | රු.20.00 |
| ඕනෑම අංක 2 | රු.100.00 |
| ඕනෑම අංක 3 | රු.1,000.00 |
| ඕනෑම අංක 4 | රු.1,000,000.00 |
| ඕනෑම තනිඅංකයක් + ඉංග්‍රීසි අක්ෂරය | රු.40.00 |
| ඕනෑම අංක 2 + ඉංග්‍රීසි අක්ෂරය | රු.1,000.00 |
| ඕනෑම අංක 3 + ඉංග්‍රීසි අක්ෂරය | රු.50,000.00 |
| ඕනෑම අංක 4 + ඉංග්‍රීසි අක්ෂරය | රු.10,000,000.00 |

#### දිනුම් ඇදීමේ දිනය

කහ ටිකට් පත් සෑම සඳුදා දිනකමත් තැඹිලි පැහැති ටිකට්පත් සෑම බ්‍රහස්පතින්දාවකදීමත් දිනුම් අදී.

#### විකාශන වේලාවන්

සෑම සඳුදා සහ බ්‍රහස්පතින්දා දිනකදීම රාත්‍රී 9.30ට ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශනය කෙරේ.

සෑම අඟහරුවාදාවකම සහ සිකුරාදාවකම උදෑසන 8ට චැනල් අයි නාලිකාව ඔස්සේ විකාශය කෙරේ.

### 3. ගැලැක්සි ස්ටාර්

#### දිනුම් ඇදීමේ ක්‍රමවේදය

ජයග්‍රාහි අංක 4කි. අංකනය කළ පන්දු 60ක් අතුරින් එක් යන්ත්‍රයක් ආධාරයෙන් අංක 4ක් තෝරා ගනී.

තරු සලකුණ- අංකනය කළ පන්දු 12ක් අතුරින් එක් යන්ත්‍රයක් ආධාරයෙන් අංකයක් තෝරා ගනී.

#### තෑගි ව්‍යුහය

| සංකලනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම තනි අංකයක් | රු.20.00 |
| තරු සලකුණ | රු.20.00 |
| ඕනෑම තනි අංකයක් + තරු සලකුණ | රු.60.00 |
| ඕනෑම අංක 2 | රු.40.00 |
| ඕනෑම අංක 2 + තරු සලකුණ | රු.200.00 |
| ඕනෑම අංක 3 | රු.1,000.00 |
| ඕනෑම අංක 3 + තරු සලකුණ | රු.10,000.00 |
| ඕනෑම අංක 4 | රු.500,000.00 |
| ඕනෑම අංක 4 + තරු සලකුණ | රු.2,000,000.00 |

#### දිනුම් ඇදීමේ දිනය

ගැලැක්සි ස්ටාර් ලොතරැයිය සෑම ඉරිදා සහ බදාදා දිනයන්හි දිනුම් අදී.

#### විකාශන වේලාවන්

සෑම ඉරිදා සහ බදාදා දිනයන්හි රාත්‍රී 9.30ට ජාතික රූපවාහිනියේ සහ චැනල් අයි නාලිකාවේ විකාශය කෙරේ.

සෑම සඳුදා සහ බ්‍රහස්පතින්දා දිනකම උදෑසන 8ට චැනල් අයි නාලිකාව ඔස්සේ විකාශය කෙරේ.

## 4. නියත ජය

### දිනුම් ඇදීමේ ක්‍රමවේදය

ජයග්‍රාහි අංක 4කි. අංකනය කළ පන්දු 65ක් අතුරින් එක් යන්ත්‍රයක් ආධාරයෙන් අංක 4ක් තෝරා ගනී.

ඉංග්‍රීසි අක්ෂර 26ක් සහිත පන්දු සහිත යන්ත්‍රයකින් එක් ඉංග්‍රීසි අක්ෂරයක් තෝරා ගැනේ.

### තෑගි ව්‍යුහය

| සංකලනය | ත්‍යාගය (රු.) |
|---|---:|
| ඉංග්‍රීසි අක්ෂරය | රු.20.00 |
| ඕනෑම තනි අංකයක් | රු.20.00 |
| ඕනෑම අංක 2 | රු.60.00 |
| ඕනෑම අංක 3 | රු.1,000.00 |
| ඕනෑම අංක 4 | රු.1,000,000.00 |
| ඕනෑම තනි අංකයක් + ඉංග්‍රීසි අක්ෂරය | රු.40.00 |
| ඕනෑම අංක 2 + ඉංග්‍රීසි අක්ෂරය | රු.1,000.00 |
| ඕනෑම අංක 3 + ඉංග්‍රීසි අක්ෂරය | රු.50,000.00 |
| ඕනෑම අංක 4 + ඉංග්‍රීසි අක්ෂරය | රු.10,000,000.00 |

### දිනුම් ඇදීමේ දිනය

කහ ටිකට් පත් සෑම අඟහරුවාදා දිනකමත් නිල් පැහැති ටිකට්පත් සෑම සිකුරාදා දිනකදීත් දිනුම් අදී.

### විකාශන වේලාවන්

සෑම අඟහරුවාදාවක සහ සිකුරාදාවකම රාත්‍රී 9.45ට ජාතික රූපවාහිනියේ සහ සෑම බදාදාවකම සහ සෑම සෙනසුරාදාවකම උදේ 8.00ට චැනල් අයි නාලිකාව ඔස්සේ විකාශය කෙරේ.

## 5. ලග්න වාසනාව

### දිනුම් ඇදීමේ ක්‍රමවේද

පළමු අදියර - ජයග්‍රාහි අංක 4කි. අංකනය කළ පන්දු 61ක් අතුරින් එක් යන්ත්‍රයක් ආධාරයෙන් අංක 4ක් තෝරා ගනී.

දෙවැනි අදියර - ලග්න සංකේත 12 අතුරින් එකක් තෝරා ගනී.

### තෑගි ව්‍යුහය

| සංකලනය | ත්‍යාගය (රු.) |
|---|---:|
| ලග්න සංකේතය | රු.20.00 |
| ඕනෑම තනි අංකයක් | රු.20.00 |
| ඕනෑම අංක 2 | රු.40.00 |
| ඕනෑම අංක 3 | රු.1,000.00 |
| ඕනෑම අංක 4 | රු.500,000.00 |
| ඕනෑම තනි අංකයක් + ලග්න සංකේතය | රු.60.00 |
| ඕනෑම අංක 2 + ලග්න සංකේතය | රු.200.00 |
| ඕනෑම අංක 3 + ලග්න සංකේතය | රු.10,000.00 |
| ඕනෑම අංක 4 + ලග්න සංකේතය | රු.2,000,000.00 |

### දිනුම් ඇදීමේ දිනය

නිල් පැහැති ටිකට් පත් සෑම අඟහරුවාදා දිනකමත් රතු පැහැති ටිකට්පත් සෑම සිකුරාදා දිනකදීත් දම් පැහැති ටිකට්පත් සෑම ඉරිදා දිනකම දිනුම් අදී.

### විකාශන වේලාවන්

සෑම අඟහරුවාදාවක සහ ඉරිදා දිනකම රාත්‍රී 9.30ට ජාතික රූපවාහිනියේ සහ සෑම සිකුරාදාවකම රාත්‍රී 9.30ට චැනල් අයි නාලිකාව ඔස්සේ විකාශය කෙරේ.

## 6. සුපර් බෝල්

### දිනුම් ඇදීමේ ක්‍රමවේද

ජයග්‍රාහි අංක 4කි. අංකනය කළ පන්දු 73ක් අතුරින් එක් යන්ත්‍රයක් ආධාරයෙන් අංක 4ක් තෝරා ගනී.

ඉංග්‍රීසි අක්ෂර 26ක් සහිත පන්දු සහිත යන්ත්‍රයකින් එක් ඉංග්‍රීසි අක්ෂරයක් තෝරා ගැනේ.

### තෑගි ව්‍යුහය

| සංකලනය | ත්‍යාගය (රු.) |
|---|---:|
| ඉංග්‍රීසි අක්ෂරය | රු.20.00 |
| ඕනෑම තනි අංකයක් | රු.20.00 |
| ඕනෑම අංක 2 | රු.100.00 |
| ඕනෑම අංක 3 | රු.2,000.00 |
| ඕනෑම අංක 4 | රු.1,000,000.00 |
| ඕනෑම තනි අංකයක් + ඉංග්‍රීසි අක්ෂරය | රු.40.00 |
| ඕනෑම අංක 2 + ඉංග්‍රීසි අක්ෂරය | Rs.1,000.00 |
| ඕනෑම අංක 3 + ඉංග්‍රීසි අක්ෂරය | රු.20,000.00 |
| ඕනෑම අංක 4 + ඉංග්‍රීසි අක්ෂරය | රු.40,000,000.00 |

### දිනුම් ඇදීමේ දිනය

නිල් ටිකට් පත් සෑම සෙනසුරාදා දිනකමත් කොළ පැහැති ටිකට්පත් බ්‍රහස්පතින්දා දිනවලත් දම් පැහැති ටිකට් පත් සඳුදා දිනවලත් දිනුම් අදී.

### විකාශන වේලාවන්

සෑම සඳුදා, බ්‍රහස්පතින්දා සහ සෙනසුරාදාවකම රාත්‍රී 9.45ට ජාතික රූපවාහිනියේ විකාශනය කෙරේ.

# මෙහෙයුම් සමාලෝචනය ඉතිරිය

## 7. සංවර්ධන ලක්ෂපති

### දිනුම් ඇදීමේ ක්‍රමවේදය

ජයග්‍රාහි අංක 3කි. අංකනය කළ පන්දු 50ක් අතුරින් එක් යන්ත්‍රයක් ආධාරයෙන් අංක 3ක් තෝරා ගනී.

### ත්‍යාග ව්‍යුහය

| සංකලනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම තනි අංකය | රු.20.00 |
| ඕනෑම අංක 2 | රු.200.00 |
| ඕනෑම අංක 3 | රු.100,000.00 |

### දිනුම් ඇදීමේ දිනය

රතු පැහැති ටිකට් පත් සෑම සඳුදා දිනකම දිනුම් අදී.

### විකාශන වේලාවන්

සෑම සඳුදා දිනකම රාත්‍රී 9.45ට ජාතික රූපවාහිනියේ විකාශනය කෙරේ.

## 8. කෝටිපති ශනිදා

### දිනුම් ඇදීමේ ක්‍රමවේදය

පළමු අදියර - ජයග්‍රාහි අංක 4කි. අංකනය කළ පන්දු 80ක් අතුරින් එක් යන්ත්‍රයක් ආධාරයෙන් අංක 4ක් තෝරා ගනී.

දෙවැනි අදියර ඉංග්‍රීසි අක්ෂර 26 අතුරින් එකක් තෝරා ගනී.

### ත්‍යාග ව්‍යුහය

| සංකලනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම තනි අංකයක් | රු.20.00 |
| ඉංග්‍රීසි අක්ෂරය | රු.20.00 |
| ඕනෑම තනි අංකයක් + ඉංග්‍රීසි අක්ෂරය | රු.40.00 |
| ඕනෑම අංක 2 | රු.100.00 |
| ඕනෑම අංක 2 + ඉංග්‍රීසි අක්ෂරය | රු.1,000.00 |
| ඕනෑම අංක 3 | රු.2,000.00 |
| ඕනෑම අංක 3 + ඉංග්‍රීසි අක්ෂරය | රු.20,000.00 |
| ඕනෑම අංක 4 | රු.1,000,000.00 |
| ඕනෑම අංක 4 + ඉංග්‍රීසි අක්ෂරය | රු.75,000,000.00 |

### දිනුම් ඇදීමේ දිනය

දම් පැහැති ටිකට් පත් සෑම අඟහරුවාදා දිනකමත් තැඹිලි පැහැති ටිකට් පත් සෑම සිකුරාදා දිනකමත් කොළ පැහැති ටිකට්පත් සෑම ඉරිදා දිනකමත් දිනුම් අදී.

### විකාශන වේලාවන්

සෑම අඟහරුවාදා සහ සිකුරාදා සහ ඉරිදාවකම රාත්‍රී 10ට ජාතික රූපවාහිනියේ විකාශනය කෙරේ.

## 9. සංවර්ධන වාසනාව

### දිනුම් ඇදීමේ ක්‍රමවේදය

පළමු අදියර - ජයග්‍රාහි අංක 4කි. අංකනය කළ පන්දු 65ක් අතුරින් එක් යන්ත්‍රයක් ආධාරයෙන් අංක 4ක් තෝරා ගනී.

දෙවැනි අදියර - මාස 12 අතුරින් එකක් තෝරා ගනී.

තෙවැනි අදියර - අංක 6ක් අතුරින් එක් අංකයක් තෝරා ගනී.

### ත්‍යාග ව්‍යුහය

| සංකලනය | ත්‍යාගය (රු.) |
|---|---|
| අදාල මාසය | රු.20.00 |
| ඕනෑම තනි අංකයක් (සුපිරි අංකය හැර) | රු.20.00 |
| ඕනෑම තනි අංකයක් + වාසනාවන්ත මාසය | රු.40.00 |
| ඕනෑම අංක 2 | රු.100.00 |
| ඕනෑම අංක 2 + වාසනාවන්ත මාසය | රු.200.00 |
| ඕනෑම අංක 3 | රු.1,000.00 |
| ඕනෑම අංක 3 + වාසනාවන්ත මාසය | රු.5,000.00 |
| ඕනෑම අංක 4 | රු.500,000.00 |
| ඕනෑම අංක 4 + සුපිරි අංකය | රු.1,000,000.00 |
| ඕනෑම අංක 4 + වාසනාවන්ත මාසය | රු. 2,000,000.00 |
| ඕනෑම අංක 4 + සුපිරි අංකය + වාසනාවන්ත මාසය | රු.5,000,000.00 |

### දිනුම් ඇදීමේ දිනය

නිල් පැහැති ටිකට් පත් සෑම බ්‍රහස්පතින්දා දිනකමත් රෝස පැහැති ටිකට් පත් සෑම සෙනසුරාදා දිනකමත් දිනුම් අදී.

### විකාශන වේලාවන්

සෑම බ්‍රහස්පතින්දාවකම සහ සෙනසුරාදාවකම රාත්‍රී 10.00ට ජාතික රූපවාහිනියේ විකාශය කෙරේ.

සෑම සිකුරාදාවකම සහ ඉරිදාවකම උදේ 8.00ට චැනල් අයි නාලිකාවේ විකාශය කෙරේ.

# තිරසර වාර්තාව

# තිරසර වාර්තාව

## ප්‍රමුඛ වටිනාකම් සහ තිරසරබව

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වභාවයෙන්ම සාමාජ ආර්ථික වර්ධනය සඳහා සිය උපරිම දායකත්වය දක්වන අතර විශේෂයෙන්ම දුප්පත්කම තුරන් කිරීම සඳහාත් අධ්‍යාපන අවස්ථා සංවර්ධනය කිරීමට සිය දායකත්වය ලබා දෙයි. එමෙන්ම සියලු පාර්ශවකරුවන්ට ප්‍රතිලාභ සැලසෙන තිරසාර ව්‍යාපාරික ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා ක්‍රියාකාරී පියවර ගණනාවක් ක්‍රියාවේ යොදවා ඇත. අපගේ ව්‍යාපාරයෙහි ඵලදායීතාව විචක්ෂණශීලීව සලකා බැලීමටද අප විසින් කටයුතු කර ඇත. මෙම වගකීම අප විසින් දරා සිටින්නේ හුදෙක්ම වගකීමක් ඉටු කිරීම සඳහා පමණක් නොව අපගේ සේවකයින්, පාරිභෝගිකයින් ඇතුළු සියලු පාර්ශවකරුවන්ගේ සහ පොදුවේ රටේ ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීමේ උදාර අභිලාෂයද සිත්හි තබා ගෙනය. අපගේ තිරසාරබව පිළිබඳ න්‍යාය පත්‍රය සකස් වී තිබෙන්නනේ සේවක යහ පැවැත්ම , ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ ප්‍රජා සහභාගීත්වය යන කරුණුවලට අනුවය.

## මානව සම්පත් සංවර්ධනය

අපගේ සේවකයින් අප සතු වටිනාම වත්කම වන බැවින් ඔවුන්ගේ යහ පැවැත්ම මණ්ඩලයේ ව්‍යාපාරික ක්‍රමවේදයට, පාරිභෝගික සහභාගීත්වයට සහ අවසානයේදී ලාභදායීත්වයට සෘජුවම බලපායි. එබැවින් මෙම ක්ෂේත්‍රයන් හි දිගුකාලීන හෝ කෙටිකාලීන අරමුණු ජය ගනිමින් සේවකයින්ගේ ඉලක්ක වෙත ඔවුන් යොමුකරනු ලැබීය.

## සේවක සංවර්ධන අරමුණු

- වෘත්තීය අවස්ථා බිහිකිරීම සහ ප්‍රවර්ධනය කිරීම.
- වැඩබිම් සැලසුම් සහ හැකියා කළමනාකරණය වැඩසටහන් දිගටම පවත්වාගෙන යෑම, හැකියාවන්ගෙන් පිරිපුන් සේවකයින් බඳවා ගැනීම,නායකත්ව සංවර්ධනය සහ අඛණ්ඩ ඇගයුම් පැවැත්වීම.
- සේවකයින්ගේ ජීවිතයේ විශේෂ අවස්ථාවන් හි ඔවුන් සවිබල ගැන්වීම.
- අපගේ සේවකයින් නිතර දැනුමින් යවත්කාලීන කිරීම.
- වැඩ බිමේදී ස්ත්‍රී පුරුෂ දෙපිරිසටම සමානාත්මතාවයෙන් සැලකීම.

## සේවක සුභසාධනය

ආරම්භයේ සිට සේවකයින්ගේ වෛද්‍ය හා රෝහල් ගාස්තු දැරීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කටයුතු කර ඇත.

## පුහුණු සහ සංවර්ධන

සලකා බලන වර්ෂය තුළ අපගේ සේවකයින් සඳහා අඛණ්ඩව පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබීය. මණ්ඩලයේ ඉදිරි අභිවෘද්ධිය සඳහා මෙම පාඨමාලාවන්ගෙන් ලද දැනුම සහ කුසලතාව සේවකයින්ට මහත් පිටුබලයක් සලසන ලදි.

ජාතික සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීමට දායකත්වය දක්වන ආයතනයක් ලෙස සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්ත්‍රී පුරුෂ දෙපිරිසටම සමානාත්මතාවයෙන් සැලකීම සහ සම අවස්ථා ලබා දීම තුළින් වඩාත් තිරසාර අනාගතයක් ළඟා කර ගත හැකි බව මණ්ඩලය විශ්වාස කරයි. අපගේ බඳවා ගැනීමේ පටිපාටිය තුළත් උසස්වීම් පටිපාටිය තුළත් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවක් ඇති කිරීමට අපි නිරන්තරව අවධානය යොමු කරමු.

## දේශීය පුහුණු වැඩසටහන් 2016

| අංකය | දිනය | ආයතනයේ නම | පාඨමාලාව | සහභාගී වූ නිලධාරීන් | අංශය | පාඨමාලා කාලය |
|---|---|---|---|---|---|---|
| 1 | 2016.03.07 | ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනය | නව අධ්‍යයන විධි ක්‍රම | සාමාන්‍යාධිකාරී<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී<br>සහකාර සාමාන්‍යාධිකාරී | ජ්‍යෙෂ්ඨ කලමණා කාරීත්වය | දින 1 |
| 2 | 2016.04.04 | ප්‍රාග් ඉන්ස්ටිට්ව් ආයතනය | ගිණුම් සහ චෙක්පත | එස්.පී.එච්.පුෂ්පකුමාරි<br>කේ.එන්.ටී විජේසේකර<br>කේ.ජයසිංහආරච්චි | මූල්‍ය | දින 1 |
| 3 | 2016.06.09,10 | ඉදිකිරීම් ක්ෂේත්‍රය CIDA ආයතනය | මෙහෙයුම් සහ නඩත්තු සේවා | එස්.ජේ.ඩී. ගුණසේකර<br>ඩබ්.ජී.ඩී. රොද්‍රිගෝ | පරිපාලන | දින 2 |

| අංකය | දිනය | ආයතනයේ නම | පාඨමාලාව | සහභාගී වූ නිලධාරීන් | අංශය | පාඨමාලා කාලය |
|---|---|---|---|---|---|---|
| 4 | 2016.06.14,21,28 | කම්කරු අධ්‍යයන ආයතනය | ප්‍රසම්පාදන | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී<br>සහකාර සාමාන්‍යාධිකාරී | ජ්‍යෙෂ්ඨ කලමණා කාරීත්වය | දින 3 |
| 5 | 2016.06.29 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | නායකත්ව පුහුණුව | එම්.කේ. විමලරත්න<br>ඩබ්.ඒ. දිනූෂා ලක්මාලි<br>ඒ.පී.ජී. ලාසරස්<br>ඒම්.ඩබ්.කේ.එස්. පෙරේරා<br>ජගත් මුදන්නායක<br>ජනිත් දමින්ද<br>චාලට් දමයන්ති<br>ඩබ්.එම්. ප්‍රාර්ථනා<br>එම්.වී.ඒ. මදුශානි<br>අනුරාධා ගොඩගම්පොල<br>පී.ඒ. තිළිණි පියුමිකා<br>සේපාලිකා ප්‍රේමතිලක<br>බී. තුෂාරි පෙරේරා<br>හංසමාලි සපුතන්ත්‍රී<br>ශලනි ප්‍රබෝධිකා<br>තුෂානි නදීශා<br>ලසන්ති පෙරේරා<br>හිමන්ශා ගයාත්‍රි<br>කේ.එම්.එන්. එම්.කරුණානායක<br>කේ. ජයසිංහආරච්චි<br>පවිත්‍රා කොඩිකාර<br>හිමාලි විතානගේ<br>සී.කේ. දිසානායක<br>ප්‍රියංගි රාජපක්ෂ | | |

ශ්‍රී ලංකාවේ පුහුණු අවස්ථාවන්ට අමතරව අපගේ සේවකයින්ට විදෙස් රටවල පුහුණු අවස්ථා ලබා දීමට අපි කටයුතු කළෙමු.

## විදේශීය පුහුණු වැඩසටහන් 2016

| අංකය | දිනය | සහභාගී වූ රට | පාඨමාලාව | සහභාගී වූ නිලධාරීන් | අංශය | පාඨමාලා කාලය |
|---|---|---|---|---|---|---|
| 1 | 2016.02.26 - 03.05 | බුරාපා සරසවිය සින්සූක්ල තායිලන්තය | තොරතුරු තාක්ෂණික නව සංකල්ප සහභාගීත්වය | සහකාර සාමාන්‍යාධිකාරී කේ.එන් බුලත්සිංහ<br>සහකාර සාමාන්‍යාධිකාරී ජේ.ඒ.ටී.කේ. ජයසූරිය | ජ්‍යෙෂ්ඨ කළමණා කාර | දින 10 |
| 2 | 2016.05.02 - 09 | මැලේසියාව | ප්‍රතිපත්ති සැලසුම්, ක්‍රියාත්මක කිරීම් සහ ඇගයීම් | ජේ.එම්.සමන් ජයසිංහ<br>සහකාර සාමාන්‍යාධිකාරී නිෂාන් පෙරේරා | ජ්‍යෙෂ්ඨ කළමණා කාර | දින 08 |
| 3 | 2016.09.23 - 10.02 | මැලේසියාව | නවීකරණ වැඩසටහන | - ජේ.එම්.සමන් ජයසිංහ සාමාන්‍යාධිකාරී | ජ්‍යෙෂ්ඨ කළමණා කාර | දින 10 |
| 4 | 2016.10.20 - 10.30 | තායිලන්තය | පුහුණු වැඩසටහන | සහකාර සාමාන්‍යාධිකාරී චානක දොඩන්ගොඩගේ<br>සහකාර සාමාන්‍යාධිකාරී සුනිල් ජයරත්න | ජ්‍යෙෂ්ඨ කළමණා කාර | දින 10 |

# තිරසර වාර්තාව ඉතිරිය

## ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව

ජාතික සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීමට දායකත්වය දක්වන ආයතනයක් ලෙස සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්ත්‍රී පුරුෂ දෙපිරිසටම සමානාත්මතාවයෙන් සැලකීම සහ සම අවස්ථා ලබා දීම තුළින් වඩාත් තිරසාර අනාගතයක් ළඟා කර ගත හැකි බව මණ්ඩලය විශ්වාස කරයි. අපගේ බඳවා ගැනීමේ පටිපාටිය තුළත් උසස්වීම් පටිපාටිය තුළත් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවක් ඇති කිරීමට අපි නිරන්තරව අවධානය යොමු කරමු.




## වෛද්‍ය ආධාර

සලකා බලන කාලසීමාව තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් අලෙවි නියෝජිතයින් 82 වෛද්‍ය ආධාර ලබා දීමට මෙම වසර තුළ රුපියල් මිලියන 1.4ක් වැය කර ඇත.

## විශ්‍රාමික ප්‍රතිලාභ සැලසුම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සියලු සේවකයින් සේ.අ.අ. 10% ක දායකත්වයක් දක්වන අතර සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සෑම සේවකයකු සඳහාම 15% ක දායකත්වයක් සේ.අ.අ බැර කරයි. 3% ක් සේවා නියුක්තීන්ගේ භාර අරමුදලට බැර කරයි. 1983 පාරිතෝෂික පනතට අනුව සංවර්ධන ලොතරැයි මණ්ඩලය සේවකයින්ට පාරිතෝෂික ගෙවීම් කරනු ලබයි.

## ආයතනික සමාජ වගකීම්

අපගේ ප්‍රමුඛතම අරමුණුවන සාමාජ ආර්ථික ප්‍රගමනයට දායක වීම යන අභිප්‍රායට වටිනාකමක් එකතු කරමින් 2016 වසරේදී ඇතැම් සමාජ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහාත් මණ්ඩලයේ සහාය ලබා දෙන ලදි. මේ සඳහා හොඳම නිදසුන වන්නේ පුනරුත්ථාපනය වූ එල්.ටී.ටී.ඊ සාමාජිකයින්ට රැකියා අවස්ථා සැලසීමයි.

2016 වසර තුළ පුනරුත්ථාපනය වූ එල්.ටී.ටී.ඊ සාමාජිකයින්ට ලොතරැයි අලෙවි පිළිබඳව පුහුණුවක් ලබා දෙමින් ඔවුන් වෙත අලෙවි කුටි ලබා දීම සඳහා උතුරු පළාත සඳහා රුපියල් මිලියන 2ක ආයෝජනයක් මණ්ඩලය විසින් සිදු කරන ලදි. මෙම වැඩසටහන සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාවේ සහාය ලැබුණු අතර මෙහිදී පුනරුත්ථාපනය වූ එල්.ටී.ටී.ඊ සාමාජිකයින් 20 දෙනෙකුට නව රැකියා අවස්ථා හිමි විය.

ශ්‍රී ලාංකිකයින් වෙත උසස් ජීවන මට්ටමක් ලබා දීම සඳහා වූ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ තිරසර කැපවීම යටතේ වඩාත් ආකර්ෂණීය තෑගි සහ ප්‍රතිලාභ ජයග්‍රාහකයින්ට ලබා දීමට මණ්ඩලය කටයුතු කර ඇත. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආයතනික සමාජ වගකීම් ව්‍යාපාර, පාරිභෝගිකයින් සහ ජයග්‍රාහකයින් මෙන්ම ප්‍රජාව මූලික කර ගෙන ක්‍රියාත්මක වෙයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය තම ක්‍රියාකාරකම් හේතුවෙන් පරිසරයට සිදුවන බලපෑම සලකා බලන අතර පාරිසරික සහ බලශක්ති භාවිතය තිරසාර ලෙස සිදු කිරීමටද පියවර ගෙන ඇත.

## කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සේවක තොරතුරු පත්‍රය

අමාත්‍යාංශය : මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

ආයතනය : සංවර්ධන ලොතරැයි මණ්ඩලය

ලිපිනය : 356, ආචාර්ය කොල්වින් ආර්.ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 2.

### 2016 දෙසැම්බර් 31වන දිනට සේවක තොරතුරු

| තනතුර | විශේෂීකරණය | වැටුප් තලය | අනුමත සේවක පිරිස | | කොන්ත්‍රාත්තු | දැනට සිටින | | දෙවැනි පෙළ |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ස්ථිර | අනියම් | | ස්ථිර | අනියම් | |
| සභාපති | | | 1 | | | 1 | | |
| උප සභාපති | | | 1 | | | 1 | | |
| සාමාන්‍යාධිකාරී | | HM 2 - 1 | 1 | | | | | 1 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | | HM 1 - 1 | 2 | | | 2 | | |
| සහකාර සාමාන්‍යාධිකාරී | කලමණාකරුවන් | MM 1 - 1 | 9 | | | 7 | | |
| අභ්‍යන්තර විගණන | | MM 1 - 1 | 1 | | | 1 | | |
| පරිපාලන නිලධාරීන් | පරිපාලකයන් | JM 1 - 1 | 1 | | | 1 | | |
| ප්‍රවාහන නිලධාරීන් | | JM 1 - 1 | 1 | | | | | |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | | JM 1 - 1 | 1 | | | 1 | | |
| අලෙවි නිලධාරී | | JM 1 - 1 | 6 | | | 6 | | |
| මූල්‍ය නිලධාරී | | JM 1 - 1 | 4 | | | 4 | | |
| පද්ධති විශ්ලේෂණ නිලධාරී | | JM 1 - 1 | 1 | | | 1 | | |
| ප්‍රසම්පාදන නිලධාරී | | JM 1 - 1 | 1 | | | 1 | | |
| මානව සම්පත් නිලධාරී | | JM 1 - 1 | 1 | | | 1 | | |
| අලෙවි ප්‍රවර්ධන නිලධාරි | | MA - 3 | 25 | | | 12 | 2 | |
| මහජන සම්බන්ධතා නිලධාරීන් | | MA - 3 | 1 | | | | 1 | |
| තොරතුරු තාක්ෂණ සහායකයින් | | MA -3 | 2 | | | 1 | | |
| මූල්‍ය සහායකයින් | | MA 2 - 2 | 2 | | | | | |
| ප්‍රධාන කළමනාකරණ සහායක | | MA 1 - 2 | 1 | | | 1 | | |
| පුද්ගල සහකාර | | MA-1-2 | 1 | | | | 1 | |
| කළමනාකාර සහායක | | MA 1 - 2 | 94 | | | 85 | 19 | |
| කළමනාකාර සහායක | දෙමළ | MA 1 - 2 | 2 | | | 3 | | |
| අලෙවි සම්බන්ධීකාරක | | MA 1 -1 | 16 | | | | 14 | |
| රියදුරන් | | PL - 3 | 34 | | | 32 | 4 | 1 |
| කාර්යාල කම්කරුවන් | | PL - 1 | 41 | | | 47 | 14 | |
| විදුලි කාර්මික | | PL - 1 | 1 | | | | | |
| ආරක්ෂක සහායක නිලධාරීන් | | PL - 1 | 3 | | | 16 | | |
| නීති නිලධාරීන් | | | | | | | 1 | |
| ප්‍රවාහන සහායකයින් | | | | | | | 1 | |
| උපදේශකයින් | | | | | | | 3 | |
| එකතුව | | | 254 | 0 | 0 | 224 | 60 | 2 |

| වයස් කාණ්ඩය | සේවකයින් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | පිරිමි | කාන්තාවන් | එකතුව |
| < 25 | 17 | 10 | 27 |
| 25 - 35 | 70 | 33 | 103 |
| 36 - 45 | 60 | 30 | 90 |
| 46 - 55 | 45 | 14 | 59 |
| > 55 | 5 | 2 | 7 |
| | 194 | 88 | 286 |

# ආයතනික යහපාලනය

ආයතනික යහපාලනය මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ දිගුකාලීන ඉලක්ක සහ උපාය මාර්ගයන් ක්‍රියාවට නංවන අතර තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය මාර්ගෝපදේශය සපයයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආයතනික යහපාලන ක්‍රමවේදය මගින් අධිකාරීත්වය සහ වගවීම විවිධ තලයන් හිදී සිදුවන ආකාරය පැහැදිලි කරයි. විශේෂයෙන් ආණ්ඩුව, අධ්‍යක්ෂ මණ්ඩලය සහ විධායක කළමනාකාරීත්වය ආදී ස්ථරයන්හිදී ක්‍රියාත්මක වන ආකාරය පෙන්වයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදෙන ආයතනයට අදාළ ආයතනික ප්‍රතිපත්ති මගින් ප්‍රධාන විධායක නිලධාරීවරයාට සහ ජ්‍යෙෂ්ඨ විධායකයන්ට අවශ්‍ය උපායමාර්ගික මගපෙන්වීම සිදු කරන අතර ආයතනයේ ව්‍යාපාරික මෙහෙයුම්වල අඛණ්ඩ පැවැත්ම සඳහා එය උපකාරී වේ.

ආයතනික කාර්යභාරය සහ වගකීම් අන්තර්ගත වන ආයතනික යහපාලන ප්‍රතිපත්ති සහ රෙගුලාසි පහත දැක්වෙයි.

- ආයතනික යහපාලන ක්‍රමවේදය
- අධ්‍යක්ෂ මණ්ඩලය / විධායක කළමනාකාරීත්ව සබඳතා
- ප්‍රධාන විධායක නිලධාරී වගකීම්
- ආයතනික උපායමාර්ග සැලසුම්
- ආයතනික කාර්යසාධන කළමනාකරණය
- අභ්‍යන්තර විගණන
- අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ප්‍රධාන විධායක නිලධාරී වියදම්
- අවදානම් කළමනාකරණය
- ආයතනික සමාජ වගකීම්
- ව්‍යාපාර සැලසුම් සහ අයවැය අනුමැතිය

## අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධානියා වන්නේ, සභාපතිවරයා හෝ සභාපතිවරියයි. එම තනතුරට පත් වන ඔහු හෝ ඇය විසින් ආයතනයේ පාලන වගකීම දරන අතර ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා බවටද පත්වෙයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කළමනාකරණ සහ මෙහෙයුම්වලට අදාළ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙන අතර එම කටයුතු අධීක්ෂණය කිරීමටද බලය ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සභාපතිවරයා / වරිය සමග තවත් අධ්‍යක්ෂ 4දෙනෙකු පත්වනු ලබයි.

- ජනාධිපති අරමුදල නියෝජනය කිරීම.
- මහපොළ උසස් අධ්‍යාපන අරමුදල නියෝජනය කිරීම.
- අමාත්‍යවරයා විසින් පත්කරන අධ්‍යක්ෂ මණ්ඩල නියෝජිතයින් දෙදෙනා අතුරින් සභාපතිවරයා තෝරා ගනී.

## සභාපතිවරයා / වරිය ගේ වගකීම්

- අයතනික යහපාලනය පවතින බවට සභාපතිවරයා හෝ සභාපතිවරිය සහතික විය යුතුය.
- අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡාවලදී මුලසුන හෙබවීම, එම සාකච්ඡා යථා පරිදි පවත්වාගෙන යෑම.
- සියලු අධ්‍යක්ෂවරුන්ට සමානාත්මතාවයෙන් සැලකීම සහ ඔවුන්ගේ සහාය දක්ෂතා අනුව උපරිම අන්දමින් ලබා ගැනීම සඳහා කටයුතු කිරීම.
- සභාපතිවරයා ප්‍රධාන විධායක නිලධාරීවරයා නොවන අවස්ථාවක සුපරීක්ෂණය හැර මෙහෙයුම් කටයුතු සඳහා සම්බන්ධ වීමෙන් වැළකී සිටිය යුතුයි.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ තීන්දු තිරණ ක්‍රියාත්මක වන බවට සහතික කළ යුතුයි.
- නිසි පරිදි වගකීම් බෙදී ඇත්දැයි බැලීම සහ අනෙකුත් ආයතනයන් සමග සුහදශීලීව කටයුතු කිරීම.

## අධ්‍යක්ෂ මණ්ඩල භූමිකාව

අධ්‍යක්ෂ මණ්ඩල භූමිකාව වන්නේ කාර්යක්ෂම කළමනාකාරීත්වයක් සමග ආණ්ඩුවේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමයි. සම්පත් ආරක්ෂා කර ගැනීම, නිසි ගිණුම්කරණ පිළිවෙතක් පවත්වාගෙන යෑම, ලබා දෙන වාර්තාවන් වැරදි වලින් තොර නිවැරදි වාර්තා විය යුතු බවත් සියලු සංස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සිදුවන බවටත් වගබලා ගත යුතුව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් කරුණු සහතික කළ යුතුය.

- උපායමාර්ගික ඉලක්ක නිසි පරිදි ක්‍රියාවේ යෙදවිය යුතු වීම.
- උපාය මාර්ගයන් ජය ගැනීම සඳහා නායකත්වය දීම.

- ප්‍රධාන විධායක නිළධාරීවරයා සහ කලමනාකාරීත්වය සතුව අවශ්‍ය කුසලතා සහ දැනුම තිබිය යුතුය.
- අභ්‍යන්තර පාලනය සඳහා ඵලදායී ක්‍රමවේදයන් භාවිතා කරමින් අවදානම් කළමනාකාරීත්වය නිතර යාවත්කාලීන කළ යුතුය.

කළමනාකරණ ක්‍රමවේදයන් ඵලදායීලෙස ක්‍රියාවේ යොදවා තිබේදැයි සුපරීක්ෂණය.

- කොටස්හිමියන් වෙත මූල්‍ය තත්වයන් සහ අනාවරණයන් අඛණ්ඩව ප්‍රමාණවත් අයුරින් වාර්තා කළ යුතු වීම.
- සම්පත් සහ වත්කම් වගකීමෙන් යුතුව භාවිතා කිරීම.
- අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් විගණන මණ්ඩලයක් සහ අනෙකුත් කමිටු අවශ්‍යතාව පරිදි නොපමාව ඇති කළ යුතු අතර ආචාරධර්ම සහ ආයතනික යහපාලනය උපාය මාර්ග ආයතනය තුළට හඳුන්වා දිය යුතුය.
- මාර්ගෝපදේශයන්, සහ චක්‍රලේඛන ඇතුළුව අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සියලු ක්‍රියාකාරකම් සඳහා ඔවුන් වගකීමෙන් බැඳී සිටී.
- ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ කාර්යසාධනය වසරට වරක් වත් ඇගයීමට ලක් විය යුතුය.

## අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම්

අයවැය සහ අදාළ ප්‍රමිතීන් පවත්වාගෙන යෑමේ අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් තුළ ආයතනයේ මෙහෙයුම් සහ ප්‍රතිඵල ඉතා සමීපව සහ අඛණ්ඩව ඇගයීමට ලක් කළ යුතුය. සම්මත න්‍යාය පත්‍රයකට අනුව රැස්වීම් පැවැත්විය යුතු අතර අනෙකුත් අවධානයට ලක් විය යුතු කරුණුද අවශ්‍යතාව පරිදි අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අවධානයට ඉදිරිපත් කළ හැක. සාමාන්‍යයෙන් මාසයකට වරක් අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම පැවැත්වෙන අතර අවශ්‍ය අවස්ථා වලදි විශේෂ රැස්වීම් ගත හැක. 2016 දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් පවත්වා ඇති අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව 8ක් වන අතර ඒ සඳහා සහභාගීත්වය පහත දැක්වේ.

| අධ්‍යක්‍ෂවරයාගේ නම | තනතුර | සභාවාර ගණන | පැමිණීම | නොපැමිණීම් |
|---|---|---|---|---|
| රොමේෂ් ජයවර්ධන | සභාපති / ප්‍ර.වි.නි | 12 | 12 | 00 |
| ආර්. අයි. විමලසේන මිය | නි.සභාපති | 12 | 12 | 00 |
| ආචාර්ය වික්‍රම වීරසූරිය | ත්‍යානාධිපති උපදේශක මහපොළ භාරකාර මණ්ඩලයේ බාරකරු | 12 | 12 | 00 |
| එම්. එස්. ඩී. රණසිරි | අධ්‍යක්‍ෂ ජෙනරාල් භාණ්ඩාගාර මෙහෙයුම් මුදල් අමාත්‍යංශය | 12 | 06 | 06 |
| ඩී. එන්. නානායක්කාර | අතිරේක ලේකම් ජනාධිපති ලේකම් කාර්යාලය | 12 | 12 | 00 |

## සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කමිටු

1. කළමනාකරණ කමිටුව
2. විගණන කළමනාකරණ කමිටුව
3. ටෙන්ඩර් කමිටුව
4. සේවක සුභසාධන කමිටුව
5. දන්වීම් කමිටුව
6. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සංස්කෘතික හා කලා කමිටුව

## ප්‍රසම්පාදන නිලධාරි

ප්‍රසම්පාදන නිලධාරී ලෙස මූල්‍ය අංශයේ ප්‍රධානියා කටයුතු කරන අතර සියලු ප්‍රසම්පාදනයන් නියාමන සහ සංස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූල වන බවට තහවුරු කළ යුතු අතර පාලන මණ්ඩලයේ රෙගුලාසිවලටද අනුකූල විය යුතු බවට සහතික විය යුතුය.

කළමනාකාරීත්ව දෛනික මෙහෙයුම් නිසි ලෙස පවත්වාගෙන යෑම සඳහා සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සුපරීක්ෂණයෙන් යුතුව ඉහළ කළමනාකාරීත්වය හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් සිදු කළ යුතුය. අයවැයට අනුව නිසි කාලරාමුවක් තුළ අවදානම් සහ අවස්ථා හඳුනාගනිමින් නිසි ඉලක්කය වෙත ආයතනය රැගෙන යා යුතුය.

# අවදානම් කළමණාකරන වාර්තාව

සංවර්ධන ලොතරැයි මණ්ඩල ව්‍යාපාරික ක්‍රමවේදය තුළ ඵලදායි අවදානම් කළමනාකරණය මූලික සාධකයක් ලෙස සඳහන් කළ හැක. සංවර්ධන ලොතරැයි මණ්ඩල කළමනාකරණ ක්‍රමවේදය තුළ වඩාත් වගකීම් සහගත ලෙස අවදානම් හඳුනා ගැනීමටත් එය පාලනය කිරීමටත් අවශ්‍ය නැඹුරු වීම සිදුකරනු ලබයි. අපගේ මූලික අවධානය ශක්තිමත් අවදානම් කළමනාකරණ සංස්කෘතියක් ඇති කර එය තුළින් අවදානම් පිළිබඳව දැනුවත් කිරීම්, හැසිරීම් සහ බලපෑම් ආශ්‍රිතව ඇති විය හැකි අවදානම් පදනම් වූ තීරණ ගැනීම් සඳහා සහාය වීමයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ දීර්ඝ කාලීන තිරසර භාවයක් සඳහා අපගේ අවදානම් උපායමාර්ගයන් තවදුරටත් වර්ධනය කිරීමට අප කටයුතු කර ඇත.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අවදානම් කළමනාකරණ උපායමාර්ගය ප්‍රතිපෝෂණ ක්‍රමවේදයක් මත ක්‍රියාත්මක වන අතර එය පාර්ශවකරුවන්ටත්, කළමනාකාරීත්වයට හා අධ්‍යක්‍ෂ මණ්ඩලයට අදාළව ක්‍රියාත්මක වේ. මෙම ක්‍රමවේදය කේන්ද්‍රීය ස්වරූපයකට ගොඩනැංව ඇති අතර ව්‍යාපාරය පිළිබඳව, මෙහෙයුම් කටයුතු පිළිබඳව හා සමාගමේ සේවා පිළිබඳව අවශ්‍ය තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා දෙයි.

මෙමගින් අඛණ්ඩ නැඹුරුවකින් යුතුව උපායමාර්ගික ,ව්‍යාපාරික සැලසුම්වලදී මෙන්ම කළමනාකරණ සහ ව්‍යාපාරික ඇතිවිය හැකි ව්‍යාපාරික අවදානම් පිළිබඳව අවධානය යොමු කරන අතර

- ව්‍යාපාරික ක්‍රියාකාරීත්වයන් සහ විවිධ ඒකකයන් පුරා පැතිර ඇති අවදානම් තත්වයන් පිළිබඳව පොදු අවබෝධයක් ලබා දීම.
- ප්‍රමුඛත්වයන් නිර්ණය කිරීම සහ තීරණ ගැනීමට අදාළව අවදානම් විභවයන් පිළිබඳව ඇගයීමේදී අවශ්‍ය කළමනාකරණ සහාය ලබාදීම.
- අවදානම් කළමනාකරණය කිරිමේ අවශ්‍යතාව පිළිබඳව සේවකයින් දැනුවත් කිරීම.

## අවදානම් කළමනාකරණය භාවිතා කරමින් ආයතනික අවදානම කළමනාකිරීම

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජාත්‍යන්තරව පිළිගත් ආයතනික අවදානම් කළමනාකරණ ප්‍රමිතීන් භාවිතා කරයි. අවදානම් හඳුනාගැනීම සඳහා සැලසුම් අදියරේදී , නායකත්ව සහ ආයතනික ක්‍රියාකාරීත්වය තුළ ජාත්‍යන්තර අවදානම් කළමනාකරණ ප්‍රමිතීන්ට අදාළ නිර්ණායක භාවිතා කරයි. මෙම ක්‍රියාවලිය තුළ අවදානම් ආශ්‍රිත හදිසි, මූල්‍ය, උපායමාර්ගික, මෙහෙයුම්, සහ අනෙකුත් අවදානම් පිළිබඳව සලකා බැලේ. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අවදානම් කළමනාකරණ වැඩරාමුව තුළින් සේවකයින්ද ඇතුළත්ව සියලු පාර්ශවකරුවන්ගේ, ප්‍රතිලාභීන්ගේ සහ පාරිභෝගිකයින්ගේ ලැදියාවන් ආරක්ෂා කිරීමට කටයුතු කරමින් දිගුකාලීන තිරසාර වර්ධනයක් අත්කර ගැනීම කටයුතු කරයි. මෙම අරමුණු ජය ගැනීම සඳහා පහත සඳහන් නිර්ණායකයන් භාවිතා කරයි.

නියාමන මාර්ගෝපදේශයන් සහ ශක්තිමත් ආයතනික යහපාලන සංස්කෘතියක් වෙත අනුගත වීම.

- අවදානම් විභවයන් පිළිබඳව කල්වේලා ඇතිව හඳුනා ගැනීම සහ නිසි උද්යෝගයකින් මෙම අවදානම් වාර්තාගත කරණයට භාජනය කිරීම.
- විස්තීර්ණ, පැහැදිලි සහ ව්‍යුහාත්මක යාන්ත්‍රනයක් තුළින් තොරතුරු මත පදනම් වෙමින් ආයතනයේ සියලු තත්වයන්හි තීරණ ගැනීම් වලදී භාවිතයට ගැනීම.
- අවදානම් කළමනාකරණ ක්‍රමවේදය නම්‍ය සහ සියලු සාධකයන් සලකා බලන එක් එක් ගැටලුවට අනන්‍ය විසඳුම් ලබා දීමට දායක වීම සහ සංස්කෘතික සහ මානව වෙනස්කම් වලදී ඇති විය හැකි පුද්ගල අවදානම පිළිබඳව සලකා බැලීම.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සුවිශේෂී අවදානම් කිහිපයක් අනාවරණය කරයි.

## තෑගි මුදල් ගෙවීමේ අවදානම

තෑගි මුදල් ගෙවීම සහ ලොතරැයි ආදායම අතර පවත්වාගෙන යා යුතු ප්‍රශස්ත අනුපාතය ඒ අයුරින් පවත්වාගෙන යායුතුවේ. යම් හෙයකින් ත්‍යාග මුදල් වශයෙන් පිටතට ඇදෙන මුදල් ප්‍රමාණය සහ ලොතරැයි ආදායම අතර අසමතුලිතතාවක් පවතී නම් එය මුදල් ප්‍රවාහයට බලපාන බැවින් එය සමතුලිතව පවත්වාගෙන යෑම වැදගත් වේ. ඉහත අවදානම කළමනාකරනය කිරීම සඳහා ලොතරැයි මුද්‍රණ කරුවන්ගෙන් රක්ෂණ ආවරණයක් ලබා ගෙන ඇත.

### ආර්ථික අවදානම

සමාජ ආර්ථික දේශපාලන සාධක මත රටේ මහජනතාවගේ ලොතරැයි පත් මිලදී ගැනීමේ රටාව සහ හුරුව

### මූල්‍ය අවදානම

අවදානමට අදාළ අකාර්යක්ෂම මුදල් ප්‍රවාහ කළමනාකරණය හා මූල්‍ය තොරතුරු මගින් සමාගමේ ලාභදායීත්වයට හා කාර්යක්ෂමතාවයට යම් බලපෑමක් ඇති විය හැක. සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් භාවිතා කරන සාම්ප්‍රදායික මූල්‍ය අවදානම් කළමනාකරණ පිළිවෙත් මගින් ප්‍රමාණවත් රක්ෂණ ආවරණයක් සහ සම්බන්ධීකරණ පිරිවැය පාලන උපාය මාර්ග තුළින් හඳුනා ගැනීම.

### ද්‍රවශීල අවදානම

මුල සිටම විශාල දිනුම් ත්‍යාග මුදලක් ලබා දීමට වීම තුළ ද්‍රවශීල අවදානම් ඇති වීමේ හැකියාවක් පවතී. මෙම අවදානම පාලනය කිරීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය ඉහළ ද්‍රවශීලතාවක් පවත්වාගෙන යෑමට කටයුතු කරයි.

### මෙහෙයුම් අවදානම

මනුෂ්‍ය වරදකින් හෝ, පද්ධති අක්‍රිය වීමක් හරහා හෝ, අපරාද ක්‍රියාවක් තුළින් සිදුවිය හැකි අලාභ මෙහිදී සලකා බැලේ. මෙබඳු තත්වයකින් පාරිභෝගික විශ්වාසය සහ සමාගම පිළිබඳව ඇති ප්‍රතිරූපය බිඳ වැටී යා හැක. සංවර්ධන ලොතරැයි මණ්ඩලය අඛණ්ඩව අභ්‍යන්තර නියාමනයන් ශක්තිමත් කරන අතර මෙහෙයුම් අවදානම් අවම කර ගැනීමට කටයුතු කරයි. මීට අමතරව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කළමනාකාරීත්ව කාලානුරූපි අවදානම් ඇගයීමක් සියලු ව්‍යාපාරික ඒකකයන් හි පැවැත්වීමට මණ්ඩලය කටයුතු කරන අතර ව්‍යාපාරික ක්‍රමවේදයන් සහ මහා පරිමාණයේ ඒකකයන්ට පැවතිය හැකි මෙහෙයුම් අවදානම පිළිබඳ මෙහිදී සලකා බැලේ.

### කීර්තිනාමය පිළිබඳ අවදානම

දෘෂ්‍ය මාධ්‍ය සහ මහජන කැමැත්ත මත සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ඇති රඳා පැවැත්ම මත සැලකිය යුතු කීර්තිනාම හානියක් සිදු විය හැක. මෙම තත්ත්වය මග හැරීම සඳහා මහජනතාවට දනෙන අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් මගින් පාරිභෝගික උනන්දුව පවත්වාගෙන යෑමටත් විනිවිද බව පවත්වාගෙන යෑමටත් කටයුතු කරයි.

### නෛතික අවදානම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයට එරෙහිව පවතින නීතිමය කටයුතු සාර්ථකව සිදුකර ගැනීමට නොහැකිව නෛතික වන්දි හෝ අලාභ ගෙවීමට සිදු වීම. මෙම තත්වය මගහරවා ගැනීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් පිළිගැනීමක් සහිත නීති වෘත්තිකයින් ගේ සහාය ලබා ගැනීමට කටයුතු කර ඇත.

### තොරතුරු තාක්ෂණික අවදානම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මෙහෙයුම් ක්‍රියාවලියේදී නිවැරදි තොරතුරු නිසි අවස්ථාවේදී ලබා ගැනීම අතිශය වැදගත් වේ. එබැවින් ආයතනයේ තොරතුරු තාක්ෂණ පද්ධතිය යාවත්කාලීන කිරීමට ක්‍රියාකාරී සැලසුමක් සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ක්‍රියාත්මක කර ඇත.

# විගණන සහ කළමනාකරන කමිටු වාර්තාව

2016 දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වන අපගේ වාර්තාව මෙලෙස ඉදිරිපත් කරන්නෙමු.

## විගණන කමිටුවේ සංයුතිය

පහත සඳහන් විධායක නොවන අධ්‍යක්‍ෂවරුන් දෙදෙනා සමග විගණන කමිටුව පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 1. | එම්.එස්.ඩී. රණසිරි මහතා | විගණන සහ කළමනාකරණ කමිටුවේ සභාපති |
| 2. | ඩී.එන්. නානායක්කාර මහතා | විගණන සහ කළමනාකරණ කමිටුවේ සමාජික |

විගණන සහ කළමනාකරණ කමිටුවේ රැස්වීම සඳහා සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අලෙවි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මූල්‍ය, අභ්‍යන්තර විගණන, පරිපාලන නිලධාරී සහ අනෙකුත් නිලධාරීන් අවශ්‍යතාව මත මේ සඳහා සහභාගී වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධ්‍යක්‍ෂ මෙය නිරීක්ෂණය කිරීමට සහභාගී වේ.

## විගණන සහ කළමනාකරණ කමිටුවේ කාර්යභාරය

සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිය පාර්ශවකරුවන්ගේ ලැදියාවන් සහ මණ්ඩලයේ වත්කම් ආරක්ෂාකිරීම සඳහා විශිෂ්ට අභ්‍යන්තර නියාමනයක් පවත්වාගෙන යෑම අත්‍යාවශ්‍යවේ. මේ සඳහා මුදල් අමාත්‍යාංශය සහ අදාළ අංශයන් විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයන් අනුගමනය කිරීමටද කමිටුව බැඳී සිටී. 2016 දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා කමිටුවේ මූලික වගකීම් ආරක්ෂා කරමින් කමිටුව විසින් දියත් කළ ක්‍රියාමාර්ග යන්හි සාරාංශයක් පහත දැක්වේ.

1. වාර්ෂික වාර්තාවේ ඒකාග්‍රතාව සහ අනුමැතියන් නිරීක්ෂණය කළ අතර සුවිශේෂී මූල්‍ය වාර්තාකරණ තීන්දු වාර්තාව නිකුත් කිරීමට පෙර සලකා බලන ලදි. මෙහිදී ගිණුම් ප්‍රතිපත්ති කරුණු සහ භාවිතයන්, විනිශ්චයකට එළැඹිය හැකි අවස්ථාවන් සහ අනුමැතියන් සහ නීතිමය නියාමන අවශ්‍යතා සලකා බැලින. විගණන කමිටුව මෙම කරුණු පිළිබඳව විගණකාධිපති වරයාගේ නියෝජිතවරයා සමග සාකච්ඡා කිරීම මූල්‍ය ප්‍රකාශයේ සාමාලෝචන කොටස ආශ්‍රිතව සිදු විය.
2. අභ්‍යන්තර විගණන නිලධාරියා විසින් කලින් කලට එවනු ලබන විගණන වාර්තා අනුමත කරන ලද වාර්ෂික විගණන සැලසුම සමග ඉදිරිපත් කර ඇත. අභ්‍යන්තර විගණක නිලධාරියා විසින් ආයතනික ක්‍රමවේද සහ කාර්ය පටිපාටිය අතර වෙනස විශේෂයෙන් මතු කර ඇති අතර දැනට පවතින ක්‍රමවේදය හා කාර්යපටිපාටියේ වෙනස අවම කිරීම සඳහා කළමනාකාරීත්වයේ සහ විගණන අංශයේ සහාය ඇතිව සිදුකළ යුතු වෙනස්කම් ඇති කිරීමට පියවර ගෙන ඇත. අභ්‍යන්තර විගණන අංශය විසින් එදිනෙදා කටයුතු විගණනය කර ලබා ගන්නා තොරතුරුවල සාරාංශය සාධනය කර විගණන කමිටුව වෙත වාර්තාවක් ඉදිරිපත් කරයි. කළමනාකරන මණ්ඩලයේ අදහස් දැක්වීම් ද මීට අන්තර්ගත වන අතර පුනරුක්තිය වැළැක්වීම පිණිස විගණන විමසුම් සහ ගත යුතු ක්‍රියාමාර්ග ඉදිරිපත් කරයි.
3. රජයේ විගණන සහ අභ්‍යන්තර විගණනයන්ගේ සහාය ඇතිව කමිටුව විසින් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ ධනාත්මක විභවයන් සහ මෙහෙයුම් සහ මූල්‍ය පාලන ක්‍රියාපටිපාටි, වියදම් සීමා, ආදායම් ක්‍රමවේද, ප්‍රාග්ධන වියදම්, පිටසන් කිරීමේ අධිකාරීත්වයන්, තොරතුරු තාක්ෂණ යෙදවුම් පාලනය සහ සංවර්ධන කටයුතු, ආයතනික ව්‍යුහය, ප්‍රතිපත්ති, වගකීම් බෙදා හැරීම් සහ කළමනාකරණ ක්‍රමවේද නිරීක්ෂණයට නතු විය. මණ්ඩලයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ද්‍රවශීල තත්ත්වයන් නිරන්තරයෙන් වර්ෂය පුරාම පිරික්සීමට ලක් විය. මෙහි යම් වෙනස්කමක් සිදු වී ඇත්නම් එම වෙනස හඳුනා ගනිමින් ඒ සඳහා සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කර ඇත. පාර්ලිමේන්තුවේ පොදු මුදල් කාරක සභාව විසින් අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත ලබා දෙන මාර්ගොපදේශයන් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර ඇත.

## විගණන කමිටුව විසින් පවත්වා ඇති රැස්වීම් වාර ගණන

2016 වසරේ සලකා බලන කාලය තුළ විගණන කමිටුව විසින් රැස්වීම් වාර 6ක් පවත්වා ඇත. ඊට සහභාගී වූවන් පහත දැක්වේ.

| අධ්‍යක්‍ෂවරයාගේ නම | සහභාගීත්වය | නොපැමිණීම |
|---|---|---|
| එම්.එස්.ඩී. රණසිරි මහතා | 06/06 | නැත |
| ඩී.එන්. නානායක්කාර මහතා | 06/06 | නැත |



**එම්.එස්.ඩී රණසිරි මහතා**
විගණන සහ කළමනාකරණ කමිටුවේ සභාපති

# මූල්‍ය තොරතුරු

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | පීයූආර්/එෆ්/ඩීඑල්බී/ 1/16/එෆ්එස්1 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2018 පෙබරවාරි 21 දින |

සභාපති

සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පිටපත - ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla. Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | පියුආර්/එෆ්/ඩීඑල්බී/ 1/16/එෆ්එස්1 | ඔබේ අංකය / உமது இல. / Your No. | |
| දිනය / திகதி / Date | 2018 පෙබරවාරි 21 දින | | |

සභාපති

සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 14(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2017 ඔක්තෝබර් 27 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla. Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

3

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඉකුත් වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව තිබූ ගිණුම්කරණ විෂයන් 10 කට අදාළව එකතුව රු. 25,342,964 ක අඩුපාඩු සහ සමාලෝචිත වර්ෂය සඳහා විගණනය විසින් පෙන්වාදෙන අඩුපාඩු නිවැරදි කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2017 ඔක්තෝබර් 04 දින ඉදිරිපත් කර තිබුණි.

#### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.ගි.ප්‍ර)

---

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07

---

(i) සමාලෝචිත වර්ෂයේදී විකුණන ලද ස්ථාවර වත්කම්වල පිරිවැය වූ රු. 22,973,877 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස වාර්තා කර තිබුණි. එසේම එම වත්කම් වලට අදාළ එකතුව රු. 22,973,877 ක් වූ සමුච්චිත ක්ෂය වෙන්කිරීම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදලින් සංචලනය නොවූ විෂයයක් ලෙස ලාභයට ගලපා තිබුණි. එහෙත් එමගින් ශුද්ධ මුදල් ප්‍රවාහයට බලපෑමක් ඇති වී නොතිබුණද මුදල් ප්‍රවාහ

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

4

ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල හා ආයෝජන ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය විකෘති වී ඇති බවක් නිරීක්ෂණය විය.

(ii) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 05 අනුව, වර්ෂය තුළ පොලී ලැබීම් රු.81,544,767 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පොලී ලැබීම් ලෙස රු.80,395,703 ක් දක්වා තිබූ අතර රු. 1,149,064 ක කාර්ය මණ්ඩල ණය පොලී ලැබීම් මුදල් ගලා ඒමක් ලෙස ගලපා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08

-----------------------------------

(i) ඉකුත් වර්ෂවලට අදාළ හිඟ බදු බැදියාව ලෙස රු.1,557,163.004 ක මුදලක් 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ හිමිකම යටතේ දැක්වීම හේතුවෙන්, මණ්ඩලයේ මුළු හිමිකම රු.519,726,031 ක සෘණ අගයක් බවට පත්වී තිබුණි.

තවද 2016 වර්ෂයේදී නිරවුල් කරන ලද රු.300,434,121 ක හිඟ බදු මුදල නැවත හිමිකමට ගැලපීම හේතුවෙන් හිමිකම යටතේ දක්වා තිබුණු රු.1,557,163,004 ක බදු බැදියාව රු.1,256,728,883 ක සෘණ ශේෂයක් බවට පත්වී තිබුණි. මෙම ගිණුම් තැබීමේ ක්‍රියාවලිය හේතුවෙන් මණ්ඩලයේ මුළු හිමිකම තවදුරටත් රු.499,526,897 ක සෘණ අගයක් වී තිබුණි. එහෙත් ප්‍රමිතයේ 42 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 117 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ප්‍රමාණවත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතු වුවත් මණ්ඩලය විසින් පහත සඳහන් විෂයයන්ට අදාළ ප්‍රතිපත්තීන් අනාවරණය කර නොතිබුණි.

- බදුකරණය
- මූල්‍ය උපකරණ
- ගෙවිය යුතු ත්‍යාග
- විත්‍රාගාරය, ජංගම දුරකථන, ත්‍රීරෝද රථ ක්ෂය කිරීමේ අනුපාත

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

5

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10**

-------------------------------

ප්‍රමිතයේ 17 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව, ආයතනය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන දිනය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත් මණ්ඩලය විසින් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

-----------------------------------

(i) ප්‍රමිතයේ 34 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව, ඒ ඒ වත්කම් පන්තීන්, සෑම වසර තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම ගිණුම් තුළ අනාවරණය කළ යුතු වුවද මණ්ඩලය සතු ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර ආදී වත්කම් 2012 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ii) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.115,033,174 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණ ද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) ප්‍රමිතයේ 37 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව, එක සමාන ස්වරූපයේ වත්කම් එක කාණ්ඩයක් යටතේ ගොනු කළ යුතු වුවත් මණ්ඩලය විසින් එසේ සිදුකර නොතිබුණි. පෙර වර්ෂවලදී ද පැවති මෙම තත්ත්වය සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කර නොතිබුණි.

(ඉ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19**

---------------------------------

ප්‍රමිතයේ 63 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව, සේවක පාරිතෝෂික සඳහා වූ වගකීම හා වත්කම් වෙන වෙනම හඳුනාගෙන ඒවා එකිනෙකට හිලව් කිරීමෙන් ඇතිවන වර්තමාන ශුද්ධ පාරිතෝෂික අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්විය යුතු විය. එහෙත් මණ්ඩලය විසින් පාරිතෝෂික වත්කම් හා ඊට අදාළ වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙන වෙනම දක්වා තිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

6

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේ සිට 2014 දක්වා වූ වර්ෂවලට අදාළ හිඟ ආදායම් බදු රු.221,541,899 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ බදු වියදම ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.917,136,129 ක මුදලින් රු.447,406,433 ක් ඉකුත් වර්ෂවලට අදාළ හිඟ බදු බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2015 වර්ෂයට අදාළ බදු තක්සේරුව රු.302,866,101 ක් වුවද ගිණුම්වල ඒ සඳහා ප්‍රතිපාදනය කර තිබුණේ රු.56,356,927 ක් පමණි. ඒ අනුව 2015 වර්ෂයේ ඌන බදු ප්‍රතිපාදනය රු.246,509,174 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී ගිණුම්වලට ගෙන තිබුණේ රු.166,863,795 ක් පමණි. ඒ හේතුවෙන් 2015 වර්ෂයට අදාළව තවදුරටත් රු.79,645,379 ක ඌන බදු වෙන්කිරීමක් පැවති බව නිරීක්ෂණය විය.

(ඈ) 2016 වර්ෂයේ ස්ථාවර තැන්පතු පොළී ආදායම ලෙස රු.60,516,783 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද නිවැරදි ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.61,002,877 ක් වූයෙන් වර්ෂයේ ලාභය රු.486,094 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2016 දෙසැම්බර් 31 වන විට මණ්ඩලය වෙත මුදලින් ලැබී නොතිබුණු ටිකට්පත් විකුණුම් වටිනාකම වූ රු.148,994,637 ක් මුදල් පොතේ ලැබීම් ලෙස සටහන් කිරීම නිසා, එම වටිනාකමින් බැංකු ගිණුම් ශේෂය වැඩිපුර දක්වා තිබුණි. මෙය බැංකු සැසඳුම් ප්‍රකාශනයේ උපලබ්ධි නොවූ මුදල් ලෙස දක්වා තිබුණි.

(ඊ) ගොඩනැගිල්ලක් වැඩි දියුණු කිරීම සඳහා දරන ලද රු.2,057,930 ක ප්‍රාග්ධන වියදමක් ගොඩනැගිලි නඩත්තු වියදම් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ලාභය හා ජංගම නොවන වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) ගොඩනැගිලි හා කාර්යාල උපකරණවලට අදාළ එකතුව රු.76,065 ක ක්ෂය වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

7

**2.2.4 අසම්භාව්‍ය වගකීම්**

2001 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ බදු බැරකම් නිරවුල් නොකිරීම නිසා ගෙවීමට යෝජිතව තිබුණු රු.1,289,590,835 ක දණ්ඩන මුදල පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.12,540,705 ක් වූ වත්කම් ගිණුම් ශේෂ 04 ක්ද එකතුව රු.229,173,159 ක වගකීම් ශේෂයක්ද හා එකතුව රු.40,122,457 ක් වූ වියදම් ශේෂ 03 ක් ද ලෙස මුළු එකතුව රු.281,836,321 ක් සම්බන්ධයෙන් අදාළ තහවුරු කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය. විස්තර පහත දැක්වේ.

| | විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොකළ විගණන සාක්ෂි |
|---|---|---|---|
| (i) | අලෙවි කුටි වියදම් | 10,861,523 | මණ්ඩලය ආරම්භ කල දින සිට මේ දක්වා ලබාදී ඇති අලෙවිකුටි හා ඒවා ස්ථානගතකර ඇති ලිපිනයන්ද ඇතුළු විස්තරාත්මක තොරතුරු.<br><br>අලෙවි කුටි භාරගැනීමේ කුවිතාන්සි (GRN) හා අලෙවිකුටි නිකුත් කිරීමේ නිවේදන. (GIN)<br><br>2016 වර්ෂයේ ඉදිකළ අලෙවිකුටි සඳහා වූ මූලික සැලසුම්, අධීක්ෂණ සැලැස්ම, අධීක්ෂණ වාර්තාව. |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

8

| | | | |
|---|---|---|---|
| (ii) | CCTV කැමරා පද්ධතිය සවිකිරීමේ වියදම | 4,758,308 | ගිවිසුම්, ප්‍රසම්පාදන ලිපි ගොනුව. |
| (iii) | අලෙවි ප්‍රවර්ධන අයිතම | 29,260,934 | ඇස්තමේන්තු<br>ගබඩා අධියාචනා පත්‍ර<br>බෙදාහරින ලද පාර්ශවයන් පිළිබඳ විස්තර සහ භාණ්ඩ භාරගත් බවට සනාථ කරන ලිපි. |
| (iv) | කොන්ත්‍රාත් හා ඉදිකිරීම් වියදම් | 4,090,925 | කොන්ත්‍රාත් ගෙවීම් ලේඛනය, ඉදිකිරීම නිමකර විධිමත් පරිදි වත්කම මණ්ඩලයට භාරදුන් බවට හා මණ්ඩලය භාරගත් බවට සාක්ෂි. |
| (v) | තිස්සමහාරාම ඉඩම | 492,392 | බදු ගිවිසුම්, හිමිකම් ඔප්පුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත් ඉඩමේ අයිතිය පිළිබඳ තහවුරු ලේඛනය. |
| (vi) | පිළිගැනීමේ කවුන්ටරය ඉදිකිරීමේ වියදම | 3,199,080 | ඉංජිනේරු උපදේශක ආයතනය විසින් ඉදිරිපත්කළ අතිරේක වැඩ ඇස්තමේන්තුව, වැඩ අවසන් කිරීමේ සහතිකය සහ වැඩ නිමකර භාරගත් බවට සාක්ෂි. |
| (vii) | වෙළෙඳ ණයහිමියෝ | 229,173,159 | ශේෂ සනාථ කිරීමේ ලිපි.<br>ණයහිමිඋප ලෙජර්/ ණයහිමි පාලන ගිණුම්.<br>කාල විශ්ලේෂණ. |
| | | --------------- | |
| | | **281,836,321** | |
| | | ======= | |

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ අධ්‍යක්ෂක මණ්ඩල තීරණ විගණනය සඳහා ලබාදෙන ලෙස 2016 ඔක්තෝබර් 20 දිනැති ලිපිය මගින් සභාපතිවරයාගෙන් ඉල්ලා සිටියද 2017 ජූලි වන විටත් එම ලේඛන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එසේම අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා විගණනය වෙත ඉල්ලීමට හේතුව රජයේ විගණකගෙන් විමසිය යුතු බව අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු විසින් ප්‍රශ්න කර ඇති බව සභාපතිවරයා විසින් 2016 නොවැම්බර් 29

දිනැති විසි/5/III අංක දරන ලිපියෙන් විගණනයට වාර්තා කර තිබුණි. මෙසේ පිළිතුරු ලබාදීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාව මගින් රාජ්‍ය මූල්‍ය පාලනය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට ඇති බලය මෙන්ම 154 ව්‍යවස්ථාව මගින් විගණකාධිපති වරයාට ලැබී ඇති බලය අභියෝගයට ලක් කිරීමක් බව නිරීක්ෂණය කෙරේ.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.10,535,573 ක වෙළඳ ණයගැතියන් සඳහා රු. 7,496,220 ක මුදලක් අඩමාණ ණය ලෙස ප්‍රතිපාදනය කර තිබුණද ඉන් වර්ෂ 23 ක් පැරණි ණය ශේෂයක් වූ රු. 2,520,000 ක් නැවත මණ්ඩලය වෙත ලැබීමට යෝජිතව තිබුණි. නඩු තීන්දුවකින් නියම වී තිබූ මෙම වටිනාකම අයකර ගැනීමට කටයුතු කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන තුළ තවදුරටත් අඩමාණ ණය ලෙස වෙන්කිරීම් සිදුකර තිබුණි.

(ආ) වෙළඳ, වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යංශයෙන් ලැබිය යුතු ලෙස දක්වා තිබූ රු. 5,700,000 ක කුලී අත්තිකාරම් 2003 වර්ෂයේ සිට ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතියද මණ්ඩලය විසින් කුලී පදනම මත ගොඩනැගිල්ලක් පරිහරණය කරන බව නිරීක්ෂණය නොවීය. ඒ අනුව, එම මුදල අයකර ගැනීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමාණවත් පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයේදී උපදේශක සමාගමක් වෙත උපදේශක ගාස්තු ලෙස රු. 3,626,727 ක් ද, 2014 වර්ෂයේදී පටිගත කරන ලද දුරකථන (IVR) පද්ධතියක් සකස් කිරීම වෙනුවෙන් රු. 237,000 ක් ද වශයෙන් ගෙවන ලද එකතුව රු. 3,863,727 ක් වූ අත්තිකාරම් වලට අදාළ කාර්යයන් මේ දක්වා නිමකර නොතිබුණු අතර අදාළ මුදල් නැවත අය කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයක් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වටිනාකම රු.2,547,138 ක් වූ දේපළ පිරියත හා උපකරණ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් තොරව අපහරණය කර තිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

10

(ආ) 2008 වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.1,464,000 ක් වටිනා වායු සමීකරණ යන්ත්‍ර 10 ක් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශයකින් තොරව රු.20,000 ක මුදලකට අපහරණය කර තිබුණි.

**2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| **(අ)** 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත | |
| (i) 18 (3) වගන්තිය | ත්‍යාග සංචිත ගිණුමේ ඉතිරි වන මුදල් ශේෂයන් ඉදිරියේදී පවත්වන ලොතරැයි දිනුම්වාරවල ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා යොදාගත යුතු වුවද, එම විධිවිධානයට පටහැනිව රු. 580,305,484 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජන කර තිබුණි. එම ආයෝජිත මුදලින් රු.302,054,379 ක් නැවත ලබාගෙන 2001 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.216,230,041 ක් වූ හිඟ බදු ගෙවීම් සඳහාද රු.76,000,000 ක් වූ සමාලෝචිත වර්ෂයේ බදු මුදල් ගෙවීම සඳහාද උපයෝගී කරගෙන තිබුණි. ඉතිරි මුදල වූ රු.9,824,338 ක් ල කා බැංකුවේ ගිණුම් අංක 0002695681 හි රඳවාගෙන තිබුණි. |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

11

(ii) 17 (5) ඡේදය

- මාස 06 ක කාලසීමාව ඉක්මවා තිබූ ඉදිරිපත් නොවූ ත්‍යාග විකුණා ලැබෙන මුදල් විධිවිධාන ප්‍රකාරව ජනාධිපති අරමුදලට බැර කළ යුතු වුවද, ඊට පටහැනිව වටිනාකම රු. 863,010 ක් වූ ත්‍යාග මණ්ඩලයේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.
- වර්ෂ ගණනාවක සිට හිමිකම් නොපෑ ත්‍යාග 634 ක් මණ්ඩලයේ ගබඩාව තුළ නිශ්ක්‍රීයව පැවතුණි. ඉන් ත්‍යාග 14 ක වටිනාකම විගණනය වෙත ඉදිරිපත් නොවූ අතර ඉතිරි ත්‍යාග 620 කට අදාළව ජනාධිපති අරමුදලට අහිමිවී ඇතැයි තක්සේරු කළ හැකි මුදල රු.3,512,157 ක් විය.

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

--------------------------------

මුදල් රෙගුලාසි 394(අ) සහ 396

- වටිනාකම රු.11,110 ක් වූ අවලංගු කළ චෙක්පත් 3 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඇ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

--------------------------------

(i) 2.9.2 මාර්ගෝපදේශය

ආකෘතියේ ලේඛන පරීක්ෂා කිරීමකින් තොරව ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගැයීම් කමිටු වලට සහභාගී වන නිලධාරීන්ට රු.397,500 ක මුදලක් ගෙවා තිබුණි.

(ii) 2.14.1 මාර්ගෝපදේශය

වටිනාකම රු. මිලියන 5 දක්වා භාණ්ඩ මිලදී ගැනීමේදී මුද්‍රා තැබූ මිල ගණන් 03 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවිය යුතු වුවත්, ආයතන 02 කින් පමණක් මිල ගණන් කැඳවා රු.599,995 ක් වටිනා I Phone 05 ක් මිලදීගෙන තිබුණි. එසේම රු. මිලියන 10 දක්වා වූ මිලදී ගැනීම්

12

AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

සම්බන්ධයෙන් අවම වශයෙන් මිල ගණන් 5 ක් කැඳවිය යුතු වුවත් රු.6,680,000 ක් වටිනා මුද්‍රිත කුඩ 20,000 ක් මිලදී ගැනීමේදී මිල ගණන් දෙකක් පමණක් කැඳවා තිබුණු අතර ඒවායේද අත්සන් සහ නිල මුද්‍රාවන් තබා නොතිබුණි.

| | | |
|---|---|---|
| (iii) | 3.4 මාර්ගෝපදේශය | වෙළඳපොල මිල සැඳැහුම් ක්‍රමය (Shopping) මගින් භාණ්ඩ හා සේවා මිලදී ගත හැකි උපරිම සීමාව රු. 500,000 ක් වුවද එම සීමාව ඉක්මවා අලෙවි කුටි 30 ක් මිලදී ගැනීම සඳහා රු. 1,350,000 ක් ගෙවා තිබුණි. |
| (iv) | 5.3.10 මාර්ගෝපදේශය | වටිනාකම රු. 4,090,925 ක් වූ භාණ්ඩ මිලදී ගැනීමේදී නියමිත ලංසු වල ංගු කාලය ඉක්මවා දින 27 ක් ලබාදී තිබූ අතර රු. 5,623,655 ක් වටිනා මිලදී ගැනීමකදී නියමිත ලංසු වලංගු කාලය ඉක්මවා දින 43 ක කාලයක් ලබාදී තිබුණි. |
| (v) | 8.13.4 මාර්ගෝපදේශය | කෙරීගෙන යනු ලබන කොන්ත්‍රාත්තුවකට අදාළව සියයට 10 ඉක්ම වූ විචලනයන් සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් ඔහු විසින් පත්කල තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහාය ලබාගෙන අනුමැතිය ලබාදිය යුතු වුවත්, ඊට පටහැනිව අලෙවි අංශයේ අභ්‍යන්තර ඉදිකිරීම් කටයුතු සඳහා මුල් කොන්ත්‍රාත් මුදලෙන් සියයට 15.75 ක ඉක්මවීම් සඳහා සභාපති විසින් අනුමැතිය ලබාදී තිබුණි. |
| (vi) | 5.3.11 මාර්ගෝපදේශය | 2016 වර්ෂය තුළදී සිදුකරන ලද රු. 9,291,645 ක් වූ කොන්ත්‍රාත් 7 ක් සඳහා මිල ගණන් සමග ලංසු සුරක්ෂණයක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (vii) | 5.4.8 මාර්ගෝපදේශය | ඉදිකිරීම් කොන්ත්‍රාත් 07 ක් වෙනුවෙන් නියමිත පරිදි පිළිගත හැකි ආයතනවලින් කාර්ය සාධන සුරක්ෂණයන් ලබාගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (viii) | 5.4.12 මාර්ගෝපදේශය | වැට් බදු ආවරණය කිරීම සඳහා මුදල් ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 වන දින හෝ එදිනට පෙර එකී ගෙවීම් පිළිබඳ විස්තර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු වුවද ඉදිකිරීම් කොන්ත්‍රාත් 07 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ix)˙ | 8.9.1 මාර්ගෝපදේශය | වටිනාකම රු.250,000 ඉක්ම වූ වැඩ සඳහා වූ කොන්ත්‍රාත් හා වටිනාකම රු.500,000 ඉක්මවන භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත් සඳහා විධිමත් ගිවිසුමක් ලියා අත්සන් කලයුතු වුවත්, ඇස්තමේන්තුගත වටිනාකම රු.5,623,655 ක් වූ ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමක් හා කොන්ත්‍රාත් 07 ක් සම්බන්ධයෙන් නියමිත පරිදි ගිවිසුම්වලට එළඹ නොතිබුණි. |

**(ඇ)** රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

-----------------------------

| | | |
|---|---|---|
| (i) | 2011 පෙබරවාරි 11 දිනැති අංක PED/57 දරන චක්‍රලේඛය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය වෙනුවෙන් රු.500,000 ක පරිත්‍යාග ලබාදී තිබුණි. |
| (ii) | 2015 මැයි 25 දිනැති අංක PED/1/2015 දරන චක්‍රලේඛයේ 2 වගන්තිය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සුදුසුකම් ලබා නොතිබුණු MM 1 – 1 වැටුප් කාණ්ඩයට අයත් නිලධාරීන් 8 දෙනෙකුට නිල වාහන වෙන්කර තිබුණු අතර එම වාහන සඳහා ඉන්ධන වෙනුවෙන් රු.1,119,105 ක් සහ රියදුරු වැටුප් හා අතිකාල දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුළ රු.7,288,698 ක් වැයකර තිබුණි. |

(ඉ) 2016 මාර්තු 17 දිනැති අංක 01/2016 දරන ජාතික අයවැය චක්‍රලේඛය, 2015 ජනවාරි 31 දිනැති අංක 28 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2015 නොවැම්බර් 12 දිනැති අංක PED/LO/DLB/Gen/2015 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය.

විධිවිධාන ප්‍රකාරව මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහනයක් ලබා ගැනීම වෙනුවට අනුමත මාසික කුලිය රු.198,000 ක් බැගින් වන පරිදි මණ්ඩලය විසින් ජීප් රථයක් ලබාගෙන තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් මාසයේ සිට සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් දක්වා නියමිත සීමාව ඉක්මවා බදුකුලී ලෙස රු. 790,000 ක් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,783,386,637 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,727,063,739 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.56,322,898 ක හෙවත් සියයට 3.3 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ජයග්‍රාහකයින් විසින් ලබා නොගන්නා ලද ත්‍යාග ආපසු පවරා ගැනීමෙන් මණ්ඩලයට තිබූ ආදායම් රු.28,266,240 ක වැඩිවීම මෙම වර්ධනය සඳහා මූලිකව බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2012 වර්ෂයේ රු. 1,937,967,198 ක අතිරික්තයක් ඇති වී තිබූ අතර 2013 වර්ෂය අවසානයට එහි සුළු වශයෙන් වර්ධනයක් පෙන්නුම් කර තිබුණද 2014 සහ 2015 වර්ෂවලදී පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 3.3 ක වර්ධනයක් අත්කරගෙන තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සහ රජයට ගෙවූ බදු නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.2,645,519,929 ක් වූ මණ්ඩලයේ දායකත්වය 2014 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි. එහෙත් 2015 වර්ෂයේදී එය රු.3,247,754,540 ක් දක්වා පිරිහී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී රු.3,797,831,858 ක් දක්වා නැවතත් වර්ධනය වී තිබුණි. බදු පසු ශුද්ධ ලාභය තුළ 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සියයට 9.3 සිට සියයට 16 ක් දක්වා වූ පරාසයක වූ දිනුම් හිමියන් වෙත ලබාදිය යුතු ත්‍යාග ආපසු පවරා ගැනීම් අඩු වූයෙන් සාමාජීය වගකීම ඉටු කිරීම යම්තාක් දුරට සීමා වී ඇති බවක් නිරීක්ෂණය විය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

15

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම්, ලාභදායීත්වය හා ද්‍රවශීලතාවය දැක්වෙන අනුපාත පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| | 2016 | 2015 |
|---|---|---|
| **මෙහෙයුම්** | සියයට | සියයට |
| විකුණුම් මිලට විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 24 | 23 |
| විකුණුම් මිලට විකුණුම් පිරිවැය | 58 | 57 |
| **ලාභදායීත්ව අනුපාත** | | |
| දළ ලාභ අනුපාතය | 42 | 43 |
| ශුද්ධ ලාභ අනුපාතය | 12 | 14.5 |
| ශුද්ධ ලාභයෙන් ත්‍යාග පවරා තිබීමේ අනුපාතය | 16 | 15 |
| ශුද්ධ ලාභයට ආදායම් බදු අනුපාතය | 51 | 38 |
| **ද්‍රවශීලතා අනුපාත** | | |
| ජංගම අනුපාතය | 1:2 | 1:2 |
| ක්ෂණික අනුපාතය | 1:2 | 1:2 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ විකුණුම් හා බෙදාහැරීමේ වියදම්, විකුණුම්වලින් පිළිවෙලින් සියයට 23 හා සියයට 24 ක් ලෙස ඉහළ අගයක් ගෙන තිබුණි. තවද, ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ අයවැය ගත විකුණුම් හා බෙදාහැරීමේ වියදම්වලට වඩා තථ්‍ය වියදමේ වැඩිවීමක් නිරීක්ෂණය වූ අතර තථ්‍ය විකුණුම් හා බෙදාහැරීමේ වියදම මුළු මෙහෙයුම් වියදම්වල ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින් සියයට 89 ක් හා සියයට 90 ක් විය. මෙසේ අධික පිරිවැයක් දැරීම මණ්ඩලය ලබන ශුද්ධ ලාභයට සෘජුව බලපාන අතර එය ජනාධිපති අරමුදලට සිදු කරන දායකත්වයටද අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය.

(ආ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී උපයා ඇති ශුද්ධ ලාභයෙන් සියයට 16 ක්ම පාරිභෝගික ජනතාවට ලබා දිය යුතු ත්‍යාග ආපසු පවරා ගැනීම්වලින් නියෝජනය වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයන්ට අදාළව ගෙවිය යුතු ආදායම් බදු නිවැරදිව නොගෙවීම නිසා හිඟ බදු බැඳියාවක් ඇති වී තිබූ අතර එම හිඟ බදු මුදල් නිරවුල් කිරීමට සිදුවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී ආදායම් බදු ගෙවීම් ශුද්ධ ලාභයේ ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 38 ක් හා සියයට 52 ක් ලෙස ඉහළ අගයක් ගෙන තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ නව ලොතරැයි පත් 03 ක් වෙළඳපොළට හඳුන්වා දීම නිසා ලොතරැයි අලෙවි ආදායම රු. 2,885,215,637 කින් එනම් සියයට 24 කින් වැඩිවී තිබුණු අතර විකුණුම් පිරිවැය රු. 1,099,366,403 කින් එනම් සියයට 21 කින් වැඩිවී තිබීම, දළ ලාභ අනුපාතය ඒකාකාරීව පැවතීම කෙරෙහි බලපා තිබුණි.

(ඉ) පසුගිය වසර හා සමාලෝචිත වසරේදී ජංගම හා ක්ෂණික අනුපාත 1:2 ක් ලෙස සමාන අගයක් ගෙන තිබූ අතර මණ්ඩලයේ ජංගම වත්කම් ඉක්මවා ජංගම වගකීම් පවතින බව නිරීක්ෂණය වූයෙන් සමාලෝචිත වර්ෂයේදී ද කාරක ප්‍රාග්ධන කළමනාකරණය කෙරෙහි මණ්ඩලයේ අවධානය යොමු වී ඇති බවක් නිරීක්ෂණය නොවීය.

කෙසේ වුවද, විගණනයේදී අනාවරණය වූ පරිදි ජංගම වත්කම් තුළ ඇතුළත් රු.158,037,384 ක ශේෂයක් සත්‍ය වශයෙන් ජංගම වත්කම් ලෙස සැලකිය නොහැකි වත්කම් වූයෙන් එම වටිනාකම ගැලපීමෙන් පසුව සත්‍ය ජංගම අනුපාතය 1:2.3 ක් විය යුතු බව නිරීක්ෂණය විය.

### 3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

මණ්ඩලයේ සේවකයෙකු විසින් නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා නඩුවක්ද, බාහිර ආයතනයක් විසින් මුදල් ගෙවීම පැහැර හැරීම නිසා රු. 8,095,000 ක වන්දි ඉල්ලා නඩුවක්ද වශයෙන් මණ්ඩලයට එරෙහිව අධිකරණවල නඩු 02 ක් ගොනුකර තිබුණි. මෙම නඩු පිළිබඳ අදාළ තොරතුරු මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල අසම්භාව්‍ය වගකීම් ලෙස හෙළිදරව් කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11 වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ අරමුණු පහත පරිදි වේ.

- ❖ ජනාධිපති අරමුදලට මුදල් උත්පාදනය කිරීමේ කාර්යය සඳහා ලොතරැයි පැවැත්වීම හෝ ඒ සඳහා කටයුතු කිරීම.

- ❖ එසේ ලැබෙන අරමුදල් ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කිරීම.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් මෙහෙයවා ඇති ලොතරැයි 10 සඳහා දිනුම්වාර 851 ක් පවත්වා තිබුණු අතර, ලොතරැයිපත් අලෙවිය තුළින් රැස්කර ඇති ආදායම රු.14,759,875,240 ක් විය. එසේම වර්ෂය තුළ රැස්කළ ආදායමෙන් රු.7,755,659,066 ක මුදලක් ත්‍යාග ලෙස වෙන්කර තිබුණු අතර ජනාධිපති අරමුදල සඳහා ප්‍රේෂණය කර තිබුණු මුදල රු.1,783,386,637 ක් විය.

(ii) ඉහත සඳහන් ආදායම රැස්කිරීම සඳහා මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.12,475,080,593 ක පිරිවැයක් දරා තිබුණු අතර එම පිරිවැයෙන් සියයට 3.08 ක් ලෙස රු.384,232,565 ක් ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් දරා තිබුණි.

(iii) මණ්ඩලය විසින් ලොතරැයිපත් විකිණීමෙන් ලැබෙන ආදායමෙන් සියයට 50 ක් ත්‍යාග මුදල් සඳහා වෙන්කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ත්‍යාගලාභීන් 166,388,074 ක් වෙත රු.6,726,171,273 ක් ත්‍යාග ලෙස බෙදාහැර තිබුණු අතර එය ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සියයට 19 ක වර්ධනයක් විය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළදී රු.283,820,540 ක් වටිනා ත්‍යාග මුදල් අදාළ ජයග්‍රාහකයින් අතර බෙදාහැරීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) මණ්ඩලයේ ලොතරැයි පත් අලෙවිය සඳහා දරන ලද ප්‍රචාරණ පිරිවැයට සාපේක්ෂව අත්පත් කරගෙන ඇති විකුණුම් ආදායමේ කාර්යසාධනය පහත පරිදි වේ.

| ලොතරැයියේ නම | විකුණුම් ආදායම | | | | ප්‍රචාරණ පිරිවැය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2016 | 2015 | විචලනය | ප්‍රතිශතය | 2016 | 2015 | විචලනය | ප්‍රතිශතය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | (සියයට) | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | (සියයට) |
| ශනිදා වාසනාව | 2,486 | 2,541 | (55) | (2.2) | 34 | 27 | 7 | 26.2 |
| සංවර්ධන / ලග්න වාසනාව | 2,899 | 2,939 | (40) | (1.3) | 41 | 30 | 11 | 36.2 |
| ජයෝදා | 1,425 | 1,424 | 1 | 0.08 | 36 | 24 | 11 | 46.5 |
| ජනජය / ගැලැක්සි ස්ටාර් | 1,137 | 1,099 | 38 | 3.4 | 28 | 28 | 0.4 | 1.5 |
| නියත ජය | 1,241 | 1,176 | 64 | 5.5 | 49 | 26 | 23 | 86.9 |
| සුපර් බෝල් | 2,744 | 2,524 | 220 | 8.7 | 32 | 30 | 2 | 5.7 |
| සංවර්ධන ලක්ෂපති | 1,000 | - | - | - | 50 | - | - | - |
| කෝටිපති ශනිදා | 1,572 | - | - | - | 57 | - | - | - |
| සංවර්ධන වාසනාව | 48 | - | - | - | 14 | - | - | - |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ශනිදා වාසනාව හා සංවර්ධන ලග්න වාසනාව ලොතරැයිවල ප්‍රචාරණ පිරිවැය පිළිවෙලින් සියයට 26 කින් හා සියයට 36 කින් ඉහළ ගියද විකුණුම් ආදායම් පිළිවෙලින් සියයට 2.2 කින් හා 1.3 කින් පහත වැටී තිබුණි.

(ii) ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී ජයෝදා ලොතරැයියේ ප්‍රචාරණ පිරිවැය සියයට 47 කින් වැඩි වී තිබුණද විකුණුම් ආදායම වැඩිවී තිබුණේ සියයට 0.08 ක් ලෙස ඉතා අඩු ප්‍රතිශතයකිනි. එහෙත් විකුණුම් ආදායම සියයට 3.4 කින් වැඩිවී තිබුණු

ගැලැක්සි ස්ටාර් ලොතරැයියේ ප්‍රචාරණ පිරිවැය වැඩිවී තිබුණේ සියයට 1.5 කින් පමණි. ඒ අනුව මණ්ඩලය විසින් ඉහළ ප්‍රචාරණ පිරිවැයක් දරනු ලබන ඇතැම් ලොතරැයිවල ප්‍රචාරණ පිරිවැයේ ඵලදායීතාවය ඉතා පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(iii) සංවර්ධන වාසනා ලොතරැයිය සඳහා විකුණුම් ආදායමෙන් සියයට 29 ක අසාමාන්‍ය ප්‍රචාරණ වියදමක් දරා තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් ලොතරැයිපත් මුද්‍රණය කිරීම සඳහා දරන ලද පිරිවැයෙන් ළඟාකරගත් කාර්ය සාධනය, නොවිකිණී ඉතිරිවූ ලොතරැයිපත් හේතුවෙන් අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී පිරිවැය රු.444,990,802 ක් වූ ලොතරැයිපත් 807,949,550 ක් මණ්ඩලය විසින් මුද්‍රණය කර තිබුණු අතර ඉන් පිරිවැය රු.40,991,700 ක් වූ ලොතරැයිපත් 53,781,800 ක් බෙදාහරින්නන් විසින් ආපසු එවා තිබුණි. පිරිවැය රු.18,830,000 ක් වූ ලොතරැයිපත් 26,525,400 ක් බෙදාහරින්නන්ට නිකුත් නොකර ගබඩාව තුළ රඳවාගෙන තිබුණු අතර එම ලොතරැයිපත්වල මුද්‍රණ පිරිවැය රු.59,821,700 ක් විය.මෙසේ ඉතිරිවන ලොතරැයිපත් ප්‍රමාණය අවම කර ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීමට ප්‍රමාණවත් වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවීමට කළමනාකාරිත්වය අපොහොසත්වී තිබූ අතර එය මණ්ඩලයේ කාර්ය සාධනයට සෘජුව බලපා තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් වාර්ෂිකව උපයනු ලබන ශුද්ධ ලාභය විධිවිධාන ප්‍රකාරව ජනාධිපති අරමුදලට බැර කරනු ලබන අතර සමාලෝචිත වර්ෂයේදී එසේ බැර කළ මුදල රු. මිලියන 1,783 ක් වූ අතර එය විකුණුම් ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 12 ක් විය. එසේම, 2014 වර්ෂයේදී ජනාධිපති අරමුදලට බැර කල ශුද්ධ ලාභය රු. මිලියන 2353 ක් වූ අතර එය විකුණුම් ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 19.17 ක්ද 2015 වර්ෂයේදී සියයට 14.54 ක අගයක්ද ගෙන තිබුණි. ඒ අනුව, මණ්ඩලය විසින් ජනාධිපති අරමුදලට සිදු කරන ලද දායකත්වය විකුණුම් ආදායමේ ප්‍රතිශතයක් ලෙස ගත්කළ අඛණ්ඩ අඩුවීමක් නිරීක්ෂණය විය.

(ඉ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ ඉටුකරගත් අරමුණු හා ඉලක්ක ඇතුළත් කාර්යසාධන වාර්තාවක් 2017 ජුනි වන විටත් පිළියෙල කර නොතිබුණු අතර නියැදි පරීක්ෂාවන්ට අනුව ඉලක්ක කරා ළඟාවීමේ ප්‍රගතිය පිළිබඳ සිදුකළ නිරීක්ෂණයන් කිහිපයක් පහත දැක්වේ.

(i) 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.3,375,000 ක් වැයකර ඉදිකිරීමට සැලසුම් කල අලෙවි කුටි 100 ක් සමාලෝචිත වර්ෂය තුළදී නිමකිරීමට අපොහොසත් වී තිබුණි.

(ii) වටිනාකම රු.15,000 ක උපරිම මුදලක් අලෙවි නියෝජිතයින්ට ගෙවීමේ පදනම මත සාදා නිම කිරීමට සැලසුම් කල අලෙවි කුටි 510 කින් සමාලෝචිත වර්ෂයේ නිමකර තිබුණේ අලෙවි කුටි 122 ක් එනම්, සියයට 23 ක් පමණි.

(iii) කිලිනොච්චිය හා වව්නියාව දිස්ත්‍රික්කවලට 2016 වර්ෂයේදී ලබා දීමට සැලසුම් කර තිබූ අලෙවි කුටි 30 ක ප්‍රමාණය 2017 මාර්තු 31 දින වන විටද ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(iv) 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබූ අලෙවිකුටි 20 ක් ඉදිකිරීම වෙනුවෙන් මණ්ඩලය රු. 800,000 ක මුදලක් වැයකර තිබුණි.

(v) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ අලෙවි කුටි ඉදිකිරීම සඳහා අවශ්‍ය මුදල රු. මිලියන 03 ක් ලෙස දක්වා තිබුණද වාර්ෂික අයවැය මගින් රු. මිලියන 10 ක් සඳහා අනුමැතිය ලබාගෙන තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නියමිත පරිදි බදු මුදල් අදාළ වර්ෂවලදී නිරවුල් කිරීමට කළමනාකරණය අපොහොසත් වීම හේතුවෙන් ඉකුත් වර්ෂවලට අදාල හිඟ බදු මුදල් සහ සමාලෝචිත වර්ෂයට අදාළ බදු මුදල් ගෙවීම සඳහා මණ්ඩලය සතුව පැවති රු.302,054,379 ක ස්ථාවර තැන්පතු 4 ක් නියමිත කාලයට පෙර ආපසු ලබාගෙන තිබුණි. මණ්ඩලයට ඒ අනුව ස්ථාවර තැන්පතුවලින් ලැබිය යුතු වූ රු. 33,255,379 ක පොලී ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දින වන විට මෙසේ හිඟ බදු බැදියාව රු. 1,306,945,943 ක් තිබියදී මණ්ඩලය විසින් රු. 13,475,000 ක මුදලක් පරිත්‍යාග ලෙස විවිධ ආයතන වලට ලබාදී තිබුණි. මෙසේ අතිවිශාල හිඟ බදු බැදියාව පිළිබඳව කළමනාකරණ විසින් රේඛීය අමාත්‍යංශය (මුදල් අමාත්‍යංශය) දැනුවත් කල බවක් නිරීක්ෂණය නොවූ අතර ඵලදායී නොවන වැය පිළිබඳව පාලනයක්ද නිරීක්ෂණය නොවීය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

21

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලොතරැයිපත් 09 කට අදාළව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයට අනුව දිනුම් ඇදීමේ වාර 21 කදී ලොතරැයිපතක සම්මත විශාලත්වයෙන් ලොතරැයිපත් මුද්‍රණය කර නොමැති බව නිරීක්ෂණය වූයෙන් ව්‍යාජ ලොතරැයිපත් මුද්‍රණය වීමට ඉඩකඩ පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) ව්‍යාජ ලොතරැයිපත් වෙළඳපොළට ඉදිරිපත්වීමේ අවදානම අවම කර ගැනීම සඳහා මණ්ඩලය විසින් විධිමත් වැඩ පිළිවෙලක් හඳුන්වා දී ඇති බවක් නිරීක්ෂණය නොවීය. දැනට ක්‍රියාත්මක වන ආරක්ෂණ ක්‍රමවේදය වනුයේ වර්ණිත ඉරි රටාවක් ලොතරැයි පතේ මුහුණත යෙදීම වුවත් එය ලොතරැයි පත්වල ආරක්ෂාවට ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

(ඇ) මණ්ඩලය විසින් 2008 වර්ෂයේදී රු.8,095,000 කට සැපයුම්කාර ආයතනයකින් ලබාගෙන තිබුණු කැබ් රථය එදින සිටම අස්ථානගත වී තිබුණද එම කැබ් රථය මණ්ඩලය වෙත නැවත ලබා ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. මෙම වාහනය මණ්ඩලයේ වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර තිබුණු අතර 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එම වාහනය වෙනුවෙන් සලසා ඇති ක්ෂය ප්‍රතිපාදනය රු.6,476,000 ක් විය. මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවලට භාවිතා නොකරන වාහනයක් වෙනුවෙන් වාර්ෂිකව රු.1,619,000 බැගින් ක්ෂය වෙන්කර මෙහෙයුම් වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම විගණනයේදී ප්‍රශ්නගත විය.

(ඈ) එක් එක් ලොතරැයි සඳහා ලබාදිය යුතු ත්‍යාග පිළිබඳව නිශ්චිත නිගමනයන්ට එළඹ අවශ්‍ය සැලසුම් සකස් නොකිරීම හේතුවෙන් ඇතැම් ලොතරැයිවලට අදාළව ත්‍යාග සංචිත ගිණුමේ ශේෂය සෘණ අගයක් වී තිබුණි. මණ්ඩලය විසින් මෙහෙයවන ලොතරැයි 6 ක ත්‍යාග සංචිත ගිණුමේ ශේෂය මේ ආකාරයෙන් සෘණ අගයක් වී තිබුණු අතර, එම අගයන්ගේ එකතුව රු.75,877,900 ක් විය. ඇතැම් ලොතරැයි සඳහා වරින් වර විශේෂ ත්‍යාග ප්‍රදානය කිරීමට තීරණය කිරීම මේ සඳහා මූලික වශයෙන් හේතුවී තිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

22

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පිළිගැනීමේ කවුන්ටරය ඉදිකිරීම සඳහා ඉදිරිපත් කරන ලද ඉංජිනේරු ඇස්තමේන්තුව රු.3,450,900 ක් වුවද තථ්‍ය වියදම රු.2,258,251 ක් වූයෙන් සියයට 53 ක විචලනයක් නිරීක්ෂණය විය. ඒ අනුව ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් වටිනාකම් මතභේදයට තුඩුදෙන ඒවා විය.

(ආ) නීත්‍යානුකූලව ලියාපදිංචි නොවූ වෙබ් අඩවියක් සඳහා එහි හිමිකරුවන්ට ලොතරැයි සන්නාම නාම ප්‍රචාරණය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,200,000 ක මුදලක් ගෙවා තිබුණි. තවද වෙබ් අඩවියක් තුළින් ලොතරැයි සන්නාම ප්‍රචාරණය කිරීමෙන් මණ්ඩලය අපේක්ෂා කළ අරමුණු ඉටුවී ඇත්ද යන්න මතභේදයට තුඩුදෙන කරුණක් විය.

**4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණු රු. 4,758,308 ක් වටිනා CCTV කැමරා පද්ධතිය, 2010 වර්ෂයේ සිට අක්‍රීයව පැවතුණද එය අපහරණය කිරීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් යොදා නොතිබුණි.

(ආ) ලොතරැයි ජයග්‍රාහකයන්ට ත්‍යාග ලබාදීම වෙනුවෙන් මිලදී ගෙන තිබුණු රු.3,400,167 ක භාණ්ඩ තොගයක් වර්ෂ ගණනාවක සිට ගබඩාවල රඳවාගෙන තිබූ අතර මෙම භාණ්ඩ අලෙවිකර අදාළ මුදල ජනාධිපති අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ධාවන තත්ත්වයේ පැවති රු.1,353,872 ක් වටිනා මෝටර් සයිකල් 8 ක් පරිහරණයකින් තොරව මණ්ඩලය සතු මෝටර් රථ අංගනය තුළ තිබියදී සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී රු.3,159,099 ක් වැයකර මෝටර් සයිකල් 13 ක් මිලදී ගෙන තිබුණි.

(ඈ) අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.4,216,325 ක් වැය කර මිලදී ගෙන තිබුණු කුඩ 12,275 ක් ගිණුම් වර්ෂය අවසානය දක්වාත් නියමිත පරිදි බෙදාහැරීමකින් තොරව ගබඩාවේ රඳවාගෙන තිබුණි. එසේම රාජ්‍ය ආයතන සඳහා බෙදාහැරීමට මිලදී ගෙන තිබුණු රු.68,250 ක් වටිනා කුඩ 130 ක්ද ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ඉ) මණ්ඩලය විසින් 2012 වර්ෂයේදී රු.42,720,098 ක් වැයකර ඉදිකර තිබුණු විත්‍රාගාරය පරිහරණයකින් තොරව එදින සිට නිෂ්ක්‍රියව පැවති අතර එදිනට, මෙම විත්‍රාගාරයේ තක්සේරු කළ වටිනාකම රු.38,752,448 ක් බව ලිපි ලේඛන අනුව නිරීක්ෂණය විය.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

-----------------------

අලෙවි ප්‍රවර්ධන ලෙජරය තුළ ඇතුළත්ව තිබුණු රු. 227,514 ක් වටිනා අලෙවි ප්‍රවර්ධන අයිතම් 4 ක් විගණනය විසින් සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී අදාළ අංශය තුළ භෞතිකව නොපැවතුණි.

## 4.7 අත්හැර දැමූ ව්‍යාපෘති

-----------------------

භෝජනාගාරයක් හා ගබඩාවක් ඉදිකිරීම වෙනුවෙන් 2014 වර්ෂය තුළදී රු. 1,583,594 ක මූලික වියදමක් දරා තිබුණද මේ වන විට කිසිදු ඉදිකිරීමක් සිදු නොකර අදාළ ඉදිකිරීම අත්හැර දමා තිබූ අතර එම වියදම ජංගම නොවන වත්කම් යටතේ නොනිමි වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි.

## 4.8 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලය තුළ ඉදිකර තිබුණු රු.42,720,098 ක් වටිනා විත්‍රාගාරය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ශක්‍යතා අධ්‍යයනයකින් තොරව සැලසුම් කිරීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ප්‍රකාරව කටයුතු නොකිරීම සහ වායු සමීකරණ පද්ධතිය හා ශබ්ද පරිපාලන පද්ධතිය සකස් නොකිරීම නිසා විත්‍රාගාරය පාවිච්චි කළ නොහැකි මට්ටමක පැවතුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

24

(ii) ඉදිකිරීමේ කටයුත්ත පිළිබඳව තීරණ ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හැකිවන ආකාරයෙන් කොන්ත්‍රාත් පිරිවැය ඛණ්ඩනය කර ඒ ඒ කොටස සඳහා වෙන වෙනම මිල ගණන් කැඳවා සැපයුම්කරුවන් තෝරාගැනීම හේතුවෙන් ගොඩනැගිල්ලේ ඇති අඩුපාඩු පිළිබඳව වගකීම නිශ්චිත පාර්ශ්වයකට පැවරිය නොහැකිව තිබුණි.

(iii) ක්‍රියාකාරී සැලැස්ම තුළ වූ ඉලක්ක අනුව, චිත්‍රාගාරයේ අඩුපාඩු සකස් කිරීමට 2016 වර්ෂයේදී මිල ගණන් කැඳවා 2017 පළමු කාර්තුවේදී කොන්ත්‍රාත්තුව පිරිනැමීමට සැලසුම් කර තිබුණද, 2017 ජුනි 30 විගණිත දින වන විටත් ඒ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(iv) ඉහත සඳහන් පරිදි වූ දුර්වලතා හේතුවෙන් චිත්‍රාගාරයේ අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබූ අතර එම කාර්යයන් ඉටුකරවා ගැනීම සඳහා 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ජාතික රූපවාහිනී සංස්ථාව සඳහා රු.115,200,000 ක් ගෙවා තිබුණි. තවද දැනට ලොතරැයි අලෙවියේ යෙදී සිටින ජාතික ලොතරැයි මණ්ඩලයටද චිත්‍රාගාරයේ සේවාව සපයා විශාල ආදායමක් උපයා ගැනීමට මණ්ඩලයට තිබූ අවස්ථාවද අහිමිවී තිබුණි.

**4.9 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම**

---

මණ්ඩලයට නීත්‍යානුකූල හිමිකමක් නොමැති තිස්සමහාරාමයේ පිහිටි ඉඩමක සංචාරක නිවාසයක් ඉදිකිරීම වෙනුවෙන් මූලික වියදම් ලෙස රු. 492,392 ක් මණ්ඩලය විසින් දරා තිබුණි.

**4.10 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර සතු භෞතික හා මානව සම්පත් රේඛීය අමාත්‍යාංශය හෝ වෙනත් රාජ්‍ය ආයතන වෙත නිදහස් කල නොහැකි වුවද, එකී විධිවිධානවලට පටහැනිව 2016 පෙබරවාරි 16 දින රු. 338,385 ක් වටිනා යතුරුපැදි 02 ක් මුදල් අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 10 දෙනෙකු මුදල් අමාත්‍යාංශයේ සේවය සඳහා නිදහස් කර පාරිශ්‍රමික ලෙස රු. 3,376,415 ක් මණ්ඩලය විසින් දරා තිබුණි.

## 4.11 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 298 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 287 ක් වශයෙන් තනතුරු 23 ක පුරප්පාඩු පැවති අතර අතිරික්තව පැවති සේවක සංඛ්‍යාව 11 ක් විය. කෙසේ වුවද, 2017 පෙබරවාරි 28 දින වනවිට මෙම අතිරික්ත සේවක සංඛ්‍යාව 15 දක්වා වර්ධනය වී තිබුණි.

(ආ) මණ්ඩලය විසින් යාවත්කාලීන කරන ලද මානව සම්පත් සැලැස්මකට අනුව කටයුතු කර නොතිබුණි. ඒ අනුව නිශ්චිත රාජකාරි බෙදීම්, යාවත්කාලීන කාර්ය මණ්ඩල විස්තර, කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨතාවය හා සුදුසුකම් ඇතුළත් තොරතුරු හා තනතුරු දරන්නාට පමණක් පුද්ගලික වනසේ ලබාදී ඇති තනතුරු සංඛ්‍යාව යාවත්කාලීන වන ආකාරය ආදී ඇතුළත් තොරතුරු පද්ධතියක් මණ්ඩලය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඇ) සාමාන්‍යාධිකාරී තනතුර සඳහා ද්විතියික පදනම මත නිලධාරියකු පත්කර තිබූ අතර වසර ගණනක් තිස්සේ ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත්), සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) යන තනතුරු සඳහාද මෙතෙක් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) පුරප්පාඩු වී පැවති මණ්ඩලයේ විදුලි කාර්මික තනතුරට, ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, වර්ෂ 10 කට ආසන්න කාලයක් තිස්සේ අදාළ තනතුරේ රාජකාරි ආවරණය කරමින් සිටින තැනැත්තාගේ පත්වීම ස්ථිර කිරීම සඳහාද විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව උපදේශක තනතුරු 04 ක්, නීති නිලධාරී තනතුරක්, කළමනාකරණ සහකාර තනතුරු 06 ක් හා කාර්යාල කාර්ය සහායක තනතුරු 09 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවාගෙන තිබුණි. උපදේශක තනතුරු සඳහා බඳවාගෙන සිටි නිලධාරීන්

03 දෙනෙකු මුදල් අමාත්‍යාංශයේ රාජකාරී සඳහා යොදවා තිබුණු අතර, අදාළ නිලධාරීන්ගේ දීමනා ලෙස එක් අයෙකුට මාසයකට රු.100.000. ක් බැගින් මණ්ඩලය විසින් ගෙවමින් පැවතුණි.

තවද අලෙවි නිලධාරී තනතුරු 03 ක් හා ගිණුම් නිලධාරී තනතුරක් සඳහා පුරප්පාඩු වෙනුවෙන් අභ්‍යන්තර උසස්වීම් මගින් බඳවා ගැනීමට 2016 ජූනි 13 දින අයදුම්පත් කැඳවා තිබුණි. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වූ 2016 ජූනි 13 දිනට පසු තවත් අලෙවි නිලධාරී හා ගිණුම් නිලධාරී තනතුරු 03 බැගින් 06 දෙනෙකු බඳවා ගැනීමට 2016 ජූනි 30 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන තිබුණි. එම තනතුරු සඳහා නැවත අයදුම්පත් කැඳවීමකින් තොරව 2016 ජූනි 13 දින ලද අයදුම්පත් මගින්ම ඉහත තනතුරු 10 ම බඳවා ගැනීම නිසා සුදුසුකම් සපුරා තිබූ අනෙකුත් නිලධාරීන්ට එම උසස්වීම් සඳහා ඉල්ලුම් කිරීමට තිබූ අවස්ථා අහිමි වී ගොස් ඇති බව නිරීක්ෂණය විය.

(ඊ) සේවා මුර පොරොත්තු ලේඛනයක් මගින් මණ්ඩලයේ සියළුම රියදුරන්ට සාධාරණ වැඩ බෙදීමේ ක්‍රියාවලියක් අනුගමනය කර ඇති බවක් නිරීක්ෂණය නොවීය. මණ්ඩලය විසින් රියදුරන් 35 දෙනෙකු සේවයේ යොදවා සිටි අතර ප්‍රවාහන අංශය විසින් විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව ඉන් 20 දෙනෙකුම සේවා මුර පොරොත්තු ලේඛනය සැකසීමේදී අදාළ කරගෙන නොතිබුණි.

(උ) අලෙවි ප්‍රවර්ධන සහකාර හා අලෙවි සම්බන්ධීකාරක යන තනතුරු 2 සඳහාම එකම ස්වරූපයේ රාජකාරී පැවරී තිබුණු අතර එම තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් හා වැටුප් තල වෙන වෙනම තීරණය කර තිබුණද අලෙවි සම්බන්ධීකාරක තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත කරවාගෙන නොතිබුණි. ඒ අනුව බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර ගැනීමෙන් තොරව බඳවාගෙන තිබූ අලෙවි සම්බන්ධීකාරක තනතුරු සංඛ්‍යාව 14 ක් විය.

**4.12** වාහන උපයෝජනය

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේදී මිලදී ගෙන තිබූ පිරිවැය රු. 10,098,026 ක් වූ මෝටර් රථය මිලදී ගත් කාලයේ සිටම මණ්ඩලයේ සභාපතිවරුන් විසින් භාවිතා කර තිබුණි. මෙම වාහනය 2015 නොවැම්බර් සිට සභාපතිවරයාගේ භාවිතයට නුසුදුසු බව දක්වා තිබූ අතර 2015

නොවැම්බර් 15 දින අපහරණය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන තිබුණි. මෙම අනුමැතිය ලැබීමෙන් පසුවද මෙම වාහනය ධාවනයේ යොදවා තිබූ අතර එහිදී නිසි සැලකිල්ලකින් තොරව ධාවනය කිරීම හේතුවෙන් දළ වශයෙන් රු. 1,167,437 ක පමණ අළුත්වැඩියා කටයුත්තක් පැන නැගී ඇති බව වාර්තා වී තිබුණි. මේ නිසා අපහරණය කිරීමෙන් ලබාගත හැකිව තිබුණු නිසි වටිනාකමද ලබා ගැනීමට මණ්ඩලයට තිබූ අවස්ථාවද තවදුරටත් අහිමිවී තිබුණි.

(ආ) වෙන්කල වාහන භාවිතා කරන නිලධාරීන් 5 දෙනෙකු වෙන්කළ වාහනවලට අතිරේකව සංචිත වාහනද භාවිතා කර ඇති අවස්ථා නිරීක්ෂණය වූ අතර එසේ ධාවනය කර ඇති දුර ප්‍රමාණය දළ වශයෙන් කිලෝමීටර් 3731 ක් පමණ වූයෙන් ඒ සඳහා රු. 74,796 ක ඉන්ධන පරිභෝජනය කර තිබුණි. එසේ සංචිත වාහන යොදා ගැනීමේ අවශ්‍යතාවය තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

### 4.13 වෙළඳපොළ කොටස

රජය වෙනුවෙන් ලොතරැයි පැවැත්වීම සඳහා පිහිටුවා තිබූ ජාතික ලොතරැයි මණ්ඩලය හා සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 තුළ ලොතරැයි අලෙවිය සඳහා සිදුකර ඇති දායකත්වය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ලොතරැයි විකුණුම් ආදායම | | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වෙළඳපොළ කොටස (සියයට) |
|---|---|---|---|
| | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | ජාතික ලොතරැයි මණ්ඩලය | |
| | රු. මිලියන | රු. මිලියන | |
| 2016 | 15,314 | 20,170 | 43 |
| 2015 | 12,280 | 17,394 | 41 |
| 2014 | 12,232 | 15,153 | 45 |
| 2013 | 10,611 | 14,537 | 42 |
| 2012 | 10,668 | 12,024 | 47 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වෙළඳපොළ කොටස ජාතික ලොතරැයි මණ්ඩලයේ වෙළඳපොළ කොටස සමග සැසඳීමේදී සියයට 50 කට අඩු අගයක් අත්කර ගෙන තිබුණි.

(ආ) 2012 වර්ෂයේදී සියයට 47 ක් වූ මණ්ඩලයේ වෙළඳපොළ කොටස 2016 වර්ෂයේදී සියයට 43 ක් දක්වා පහත වැටී තිබුණු අතර 2012 වර්ෂය සිට 2016 වර්ෂය දක්වා වූ සමස්ත කාල පරිච්ඡේදය තුළදී සියයට 47 සිට සියයට 41 ක් දක්වා පරාසයක් තුළ උච්චාවචනය වී තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය අනුව, සංයුක්ත සැලැස්මේ සැලසුම්ගත කාලපරිච්ඡේදය තුළ ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු හා ඉලක්ක, ඒ සඳහා වගකිවයුතු කළමනාකාරීත්වය යනාදිය පැහැදිලිව හඳුනාගත හැකි ලෙස ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු බව දක්වා තිබුණි. එහෙත් මණ්ඩලයේ 2016 සිට 2020 දක්වා වූ වර්ෂ සඳහා පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්මේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ වර්ෂයන් වලදී මණ්ඩලය විසින් ළඟාකර ගැනීමට අපේක්ෂා කරන ලද ඉලක්කයන්හි ඇස්තමේන්තුගත ප්‍රමාණයන්, පිරිවැයන් හා කාලවකවානු යනාදිය ඇතුළත් කර නොතිබුණි.

(ආ) ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු හා ඉලක්ක සම්බන්ධව වගකිව යුතු කළමනාකාරීත්වය පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

(ඇ) ඉහත චක්‍රලේඛයේ 9.2 ඡේදය පරිදි සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේදී ආයතනයේ අවශ්‍යතාවය මත මානව සම්පත් සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් මණ්ඩලය විසින් එය පිළියෙල කර නොතිබුණි.

(ඇ) උක්ත චක්‍රලේඛයේ 5.1.2 ඡේදයේ සඳහන් පරිදි සංයුක්ත සැලැස්මේ ඇතුළත් විය යුතු මණ්ඩලය සතු සම්පත් පිළිබඳව හා කාර්ය සාධන දර්ශකයන් පිළිබඳ තොරතුරු ඇතුළත් වී නොතිබුණි.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ඉලක්ක, ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග, ඇස්තමේන්තුගත ප්‍රමාණය හා පිරිවැයන් හා අදාළ කාලවකවානු ඇතුළත් වන පරිදි 2016 වර්ෂය සඳහා මණ්ඩලය විසින් ක්‍රියාකාරී සැලැස්ම විස්තරාත්මකව පිළියෙල කර නොතිබුණි. තවද, මණ්ඩලයේ සංයුක්ත සැලැස්මට හා වාර්ෂික අයවැයට සමගාමීව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර ඇති බව නිරීක්ෂණය නොවූ අතර ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය කාලානුරූපීව පරීක්ෂා කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක්ද හඳුන්වාදී නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ අලෙවි කුටි ඉදිකිරීම, බෙදාහැරීම, වටිනාකම් හා ප්‍රමාණයන් සහිතව නිශ්චිත ඉලක්කයක් දක්වා නොතිබුණි.

## 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වන පරිච්ඡේදයේ 4.2.1 ඡේදය අනුව, ප්‍රසම්පාදන අත්පොතේ සපයා ඇති ආකෘතිය අනුව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතු වුවත්, මණ්ඩලය විසින් එසේ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් (Detail Procument Plan) පිළියෙල කර නොතිබුණි.

(ආ) ඉහත (අ) ඡේදයේ දැක්වෙන පරිදි ප්‍රසම්පාදන සැලැස්මේ පහත කරුණු ඇතුළත් වී නොතිබුණි.

(i) ප්‍රසම්පාදන වර්ගය (Procument Category)

(ii) ප්‍රසම්පාදන ක්‍රමය (Procument Method)

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

30

(iii) ප්‍රසම්පාදන කටයුත්ත ආරම්භ කිරීමට හා අවසන් කිරීමට උප ලේඛනගත කරන නිශ්චිත දිනයන්.

**5.4 අභ්‍යන්තර විගණනය**

-----------------------

මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණන ඒකකයන් ස්ථාපිත කර 05 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබුණද ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොසිටීම හේතුවෙන් මූල්‍ය, අලෙවි හා පරිපාලන යනාදී ක්ෂේත්‍රයන්හි ඵලදායී අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට නොහැකි වී තිබුණි.

**5.5 අයවැය ලේඛනමය පාලනය**

--------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 ඡේදයේ සඳහන් පරිදි වාර්ෂික අයවැය ලේඛනය සමග තිබිය යුතු අයවැය ගත ශේෂ පත්‍රය පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**5.6 පරිගණක ගත පද්ධතීන් ස්ථාපිත කිරීම.**

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් ලොතරැයි දිනුම් ඇදීම සඳහා දැනට භාවිතා කරන පරිගණක මෘදුකාංග සේවය පෞද්ගලික සමාගමකින් ලබාගෙන තිබූ අතර ඒ සඳහා විධිමත් ගිවිසුමක් නොවීය. ඒ අනුව, ලොතරැයි දිනුම් ඇදීම සඳහා වූ දත්ත ප්‍රවේශය මුළුමනින්ම අදාළ සමාගම වෙත පැවරී තිබීම හේතුවෙන් ඇතිවන අවදානම් තත්ත්වය මණ්ඩලය විසින් සැලකිල්ලට ගෙන ඇති බව සහ මෙම මෘදුකාංගයේ කටයුතු සඳහා මණ්ඩලයේ අධීක්ෂණයක් සිදුවී ඇති බවක් ද නිරීක්ෂණය නොවීය. මෙම පරිගණක මෘදුකාංගය නඩත්තු කිරීම හා ඒ හා සම්බන්ධ කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 9,345,000 ක් වැය කර තිබුණු අතර 2016 දෙසැම්බර් 31 දින තෙක් දරා ඇති මුළු වියදම රු. 92,988,744 ක් විය.

(ආ) ලොතරැයි දිනුම් ඇදීම, ගිණුම්කරණය හා අලෙවිකරණය යනාදියට අදාළ පරිගණක පද්ධතීන් ඇතුළුව ඒකාබද්ධ පරිගණකගත තොරතුරු පද්ධතියක් මණ්ඩලය තුළ නොතිබීම හේතුවෙන් මූල්‍ය හා අලෙවි අංශ අතර තොරතුරුවල සම්බන්ධීකරණයක්

සිදුවී නොතිබුණි. තවද සහකාර සාමාන්‍යාධිකාරිවරයකු සමග නිලධාරීන් 3 දෙනෙකු අනුයුක්ත කර සමාලෝචිත වර්ෂයේදී ස්ථාපිත කර තිබුණු තොරතුරු තාක්ෂණ අංශය වෙනුවෙන් රු.3,337,382 ක් වැයකර තිබුණද ඒ මගින් ප්‍රමාණවත් ප්‍රතිලාභයක් මණ්ඩලයට ලැබී නොතිබුණි.

**5.7 පාරිසරික, ආර්ථික හා සමාජීය වගකීම් ඉටු කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජය වෙනුවෙන් ලොතරැයි පැවැත්වීම හා ජයග්‍රාහයින්ට ත්‍යාග පිරිනැමීම මණ්ඩලයේ වගකීමක් වුවද, විවිධ හේතු නිසා හිමිකම් නොපෑ ත්‍යාග මුදල්වලට අදාළ ත්‍යාග ලාභීන් පිළිබඳ කිසිදු පසු විපරම් කටයුත්තක් මණ්ඩලය විසින් සිදුකර නොතිබුණි. ඒ හේතුවෙන් මාස 06 ඉකුත් වූ හිමිකම් නොපෑ සම්පූර්ණ ත්‍යාග මුදලම මණ්ඩලයේ ආදායමට ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී එසේ ආදායමට ගෙන තිබූ රු. මිලියන 284 ක් ඇතුළුව 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එසේ ආදායමට ගෙන ඇති මුදල රු. මිලියන 1214 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් ලොතරැයි දිනුම්වාර 851 ක් පවත්වා තිබුණු අතර ඉන් දිනුම්වාර 793 ක්ම සඳහා විගණකයකුගේ අධීක්ෂණයක් ලබාගෙන නොතිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් පවත්වනු ලබන ලොතරැයි දිනුම් ඇදීම් විධිමත්ව හා විනිවිදභාවයකින් යුතුව සාමාජීය වගකීම් ඉටුවන ආකාරයට සිදුවීද යන්න විගණනයේදී ප්‍රශ්න ගත කරුණක් විය.

(ඇ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළ ත්‍යාග බෙදාහැර තිබුණ ලොතරැයිපත් සංඛ්‍යාව 184,040,754 ක් වූ අතර ඉන් සියයට 99.69 ක් හෙවත් ලොතරැයි පත් 183,482,914 ක් සඳහාම වෙන්කර තිබුණේ රු. 20 සිට රු. 200 දක්වා වූ පරාසයක් තුළ ත්‍යාගයන්ය. එම පරාසයෙන්ද සියයට 89 ක්ම රු. 20 බැගින් වූ ත්‍යාගයන් විය. රු. 20 බැගින් වූ ත්‍යාග සඳහා නැවත ටිකට්පතක් මිලදී ගැනීමට පෙළඹීම හෝ අදාළ ත්‍යාගය ජයග්‍රාහකයින් විසින් නොසලකා හැරීම මණ්ඩලය පැත්තෙන් ගත් කළ එහි ලාභදායීත්වය ඉහළ නංවා ගැනීමට ප්‍රබල සාධකයක් විය හැකි බව නිරීක්ෂණය විය. එහෙත් මහජනයා පැත්තෙන් ගත්කළ එම තීරණයන් තුළින් ආර්ථික හා සමාජීය වගකීම ප්‍රශස්ත ලෙස ඉටුවී ඇති බවක් නිරීක්ෂණය නොවිය.

(ඇ) ලොතරැයි 04 ක් සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවට අනුව දිනුම් ඇදීමේ යන්ත්‍රයට යොදනු ලැබූ අංක, අක්ෂර හෝ ලග්න යනාදී වූ පන්දු වලට අදාළව මුද්‍රණය කළ යුතු ටිකට්පත් ප්‍රමාණය සහ දිනුම් වාරයකට අදාළව මුද්‍රණය කළ ටිකට්පත් ප්‍රමාණය අතර විශාල විචලනයන් පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව දිනුම් වාරයකට අදාළ මුද්‍රිත ටිකට්පතක්වත් නොවීමේ සම්භාවිතා ප්‍රතිශතය සියයට 72 සිට සියයට 98 දක්වා වූ පරාසයක් තුල පැවතුනි. පන්දු ප්‍රමාණයට අනුව මුද්‍රණය කළ යුතු ටිකට්පත් ප්‍රමාණය ත්‍යාග හිමි ටිකට්පත් ප්‍රමාණය සමඟ සැසඳීමේදී ත්‍යාගයක් හිමි ටිකට්පතක් නොවීමේ සම්භාවිතාවය සියයට 91.77 සිට සියයට 99.60 දක්වා වූ පරාසයක් තුල වීම හේතුවෙන් මණ්ඩලයේ සමාජීය වගකීම ප්‍රමාණවත් ලෙස ඉටුවී ඇතිද යන්න ප්‍රශ්නගත කරුණක් විය.

**5.8 ජනාධිපති අරමුදලට මණ්ඩලයේ දායකත්වය**

2017 පෙබරවාරි 28 දින විගණනය වෙත ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව පහත විස්තර දැක්වෙන පරිදි සත්‍ය වශයෙන් මණ්ඩලය වෙත සපයා නොගත් අලෙවි කුටි වියදමක් විස්තරාත්මකව උප ලේඛනයක් මඟින් උපචිත වියදමක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව ජනාධිපති අරමුදලට මණ්ඩලයේ දායකත්වය රු. 7,606,870 කින් අඩුවී ඇති බව විගණනය විසින් පෙන්වාදී තිබීම නිසා නිවැරදි කළ මූල්‍ය ප්‍රකාශන 2017 ඔක්තෝබර් 04 දින නැවත විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. එහිදී ඉහත වටිනාකම සටහන් කිරීමේ දෝෂයක් ලෙස ජර්නල් සටහනක් මඟින් ගිණුම් වලින් ඉවත් කර තිබීම නිසා ජනාධිපති අරමුදලේ දායකත්වය එම වටිනාකමින් වැඩිවී තිබුණි.

| | රු. |
|---|---|
| අලෙවි කුටි 408 ක සෘජු ද්‍රව්‍ය පිරිවැය | 6,120,000 |
| අලෙවි කුටි ස්ටිකර් කිරීමේ වියදම | 90,000 |
| ඩිජිටල් මුද්‍රණ හා පරිගණක ගත කිරීම | 3120 |
| ප්‍රචාරණ හා මුද්‍රණ වියදම | 16,750 |
| අලෙවි කුටි 30 ක් සඳහා ගෙවීමට නියමිත මුදල | 1,350,000 |
| | 7,579,870 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 27000 |
| | **7,606,870** |

33

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

මෙම තත්ත්වය ගනුදෙනුවලින් උද්ගතවන ප්‍රතිඵලය අභිබවා, ජනාධිපති අරමුදලට වන දායකත්වය අඩු වැඩි කිරීමට ව්‍යාජ සටහන් තැබීමක් හා සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 18 (2) වගන්තියටද පටහැනිව කටයුතු කිරීමක් බැව් විගණනයේදී බැහැර කළ නොහැක.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) අලෙවි ප්‍රවර්ධන අයිතම් වෙනුවෙන් පවත්වා තිබූ ලෙජර තුළ නියෝජිතයන්ට ලබාදෙන ත්‍යාග, ජයග්‍රාහකයන්ට ලබාදෙන ත්‍යාග හා ආයතනයේ නිලධාරීන්ට ලබාදෙන භාණ්ඩ යනාදී සියලුම නිකුත් කිරීම් ඇතුළත් කිරීම නිසා එම ලෙජරය අක්‍රමවත්ව පවත්වා ගැනීම. |
| | (ii) ගිණුම් අංශයේ පවතින අලෙවි ප්‍රවර්ධන අයිතම උප ලෙජරයේ දැක්වෙන ශේෂයන් ප්‍රධාන ලෙජරයට පිටපත් කළද ඒවා පහසුවෙන් හඳුනාගැනීමට හැකි ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හා එම උප ලෙජරයේ, ඒකක වටිනාකම්ද ඇතුළත් නොකිරීම. |
| | (iii) නොලැබුණු මුදල් ලැබුණාසේ සලකා මුදල් පොතේ සටහන් තැබීම හා ලැබුණු මුදල්. මුදල් පොතට ගැනීමේ කටයුතු මන්දගාමී වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මානව සම්පත් කළමනාකරණය | (i) | බඳවා ගැනීමේ පටිපාටිය විධිමත් පරිදි අනුමත කර ගැනීමෙන් තොරව බඳවා ගැනීම් සිදුකිරීම. |
| | | (ii) | ප්‍රසම්පාදන කටයුතු, ගොඩනැගිලි නඩත්තු කටයුතු, කුලී පදනම මත වාහන ලබා ගැනීම, වාහන අපහරණය යනාදී සියලුම කාර්යයන් පරිපාලන නිලධාරී විසින් සිදුකර තිබුණු අතර ඒ සඳහා සුදුසු පරිදි වැඩ බෙදීමක් නොතිබීම. |
| (ඇ) | මෙහෙයුම් පාලනය (ටිකට් මුද්‍රණය පාලනය) | (i) | මුද්‍රිත ටිකට්පත් බහලුම් මණ්ඩලයේ ගබඩාව වෙත අංක අනුපිළිවෙලට ලබා නොගැනීම හා මුද්‍රණයේදී දෝෂ පවතින ලොතරැයි පත් විනාශ කිරීමේදී විධිමත් අධීක්ෂණයක් නොවීම හේතුවෙන් එහි අවදානමක් නිරීක්ෂණය වීම. |
| | | (ii) | බෙදාහරින්නන් විසින් ඇණවුම් කළ ප්‍රමාණයන් නොසලකා විශාල වශයෙන් ටිකට්පත් මුද්‍රණය කිරීම හා දිනුම් අදිනු ලබන දිනයේදීම මුද්‍රිත ටිකට්පත් මණ්ඩලයට ලැබීම් යනාදී කරුණු හේතුවෙන් ගබඩාවල විශාල වශයෙන් නොවිකුණු ටිකට්පත් එකතුවීම. |
| (ඇ) | ගබඩා පාලනය | (i) | ගබඩා භාණ්ඩ සම්බන්ධව තොග පාලන මට්ටම් පවත්වා නොගැනීම හා බින් කාඩ් පත්‍ර පවත්වා නොගැනීම. |
| | | (ii) | ගබඩා පරිපාලනය සඳහා නිශ්චිත තනතුරක් නොවීම. |
| | | (iii) | ගබඩා පරිපාලනය හා වැඩ බෙදීම සම්බන්ධ අභ්‍යන්තර පාලනය දුර්වල මට්ටමක පැවතීම. |

AGDSL | විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department



| | | |
|---|---|---|
| (ඉ) | ලිපි ලේඛන පාලනය | අලෙවි ප්‍රවර්ධන අයිතම (කුඩ) නිකුත් කිරීමේදී අදාළ වාර්තා නිසි පරිදි නඩත්තු කර නොතිබීම. |
| (ඊ) | ණයට විකුණුම් පාලනය | ඇපකරයක් රහිතව ටිකට්පත් ණයට අලෙවි කිරීම හා නියමිත දිනට මුදල් අයකර ගැනීමේ ක්‍රමවේදයේ අඩුපාඩු පැවතීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති

# ආදායම පිළිබඳ විස්තීර්ණ ප්‍රකාශය

| දෙසැම්බර් 31 වනදායින් අවසන් වන වර්ෂය සඳහා | සටහන් | 2016 රු. | 2015 රු. |
|---|---|---|---|
| ආදායම | 01 | **14,759,875,240** | **11,874,659,603** |
| ටිකට්පත් පිරිවැය | 02 | 444,990,802 | 325,360,130 |
| ගෙවන ලද තෑගි මුදල් | 03 | 7,755,659,066 | 6,150,951,795 |
| දිනුම් ඇදීමේ පිරිවැය | 04 | 322,644,520 | 261,133,229 |
| දළ ලාභය | | **6,236,580,852** | **5,137,214,449** |
| වෙනත් ආදායම් | 05 | 119,504,280 | 58,146,101 |
| බෙදාහැරීමේ පිරිවැය | 06 | 3,561,410,194 | 2,728,440,701 |
| පරිපාලන වියදම් | 07 | 377,629,544 | 332,597,185 |
| මෙහෙයුම් වියදම් වලට පසු අතිරික්තය | | **2,417,045,394** | **2,134,322,664** |
| මූල්‍ය පිරිවැය | 08 | 343,166 | 260,350 |
| ත්‍යාග නැවත ගැනීම් | | 283,820,540 | 255,554,300 |
| බදුපෙර ලාභය | | **2,700,522,768** | **2,389,616,614** |
| ආදායම් බදු | 09 | 917,136,130 | 662,552,875 |
| ආදායම් බදු වලට පසු ලාභය | 10 | **1,783,386,637** | **1,727,063,739** |

ගිණුම්කරන ප්‍රමිති සහ සටහන් මගින් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි වැදගත් කොටසක් නිර්මාණය වේ. මෙම මූල්‍ය ප්‍රකාශයන් සැකසීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ. මෙම මූල්‍ය ප්‍රකාශයන් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කොට අත්සන් තබන ලදී.

**ඩබ්ලිව්. ඒ. වී. සී. සෝමරත්න**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය

**ජේ. එම්. සමන් ජයසිංහ**
සාමාන්‍යාධිකාරී

**එස්. ඒ. පී. සූරියප්පෙරුම**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී

